ජෛව රසායන, අණුක ජෛව වේද හා ජෛවතාක්ෂණ ආයතනය

කොළඹ විශ්වවිද්‍යාලය

වාර්ෂික වාර්තාව - 2011

<u>පටුන</u>

	පිටුව
ක්ෂණික යොමුව	3
අධ්‍යක්ෂවරයාගේ සමාලෝචනය	4
පාලක මණ්ඩලය	6
දැක්ම හා මෙහෙවර	7-8
2011 කාර්ය සාධනය ඇස් බැල්මෙන්	9
අන්තර්ජාතික පිළිගැනීම	10
මානව සම්පත් සංවර්ධනය	10
ජාතික/ජාත්‍යන්තර නියෝජිත ආයතන මගින් ජාතික සංවර්ධනය	16
පර්යේෂණ ක්‍රියාකාරකම්	17
IBMBB ආයතනයට පැමිණි අමුත්තන්	32
මානව සම්පත්	34
ආයතනික සමාජ වගකීම	34
බාධක	34
කාර්ය මණ්ඩලය	36
වර්තමාන පර්යේෂකයන්/පර්යේෂක සහායකයින් සහ පර්යේෂක සිසුන්	37
පර්යේෂණ ප්‍රකාශන	41
දර්ශනපති (MPhil)/දර්ශනසූරි (PhD) ව්‍යාපෘති ලැයිස්තුව	48
පර්යේෂණ සඳහා මූල්‍ය සම්පාදනය	53
විද්‍යාපති (MSc) නිබන්ධන ලැයිස්තුව	54
සිදුවීම් කැමරා ඇසින්	57
වාර්ෂික මූල්‍ය වාර්තාව	59
2011 විගණන කමිටු වාර්ෂික වාර්තාව	67
විගණකාධිපති වාර්තාව	69
අසාර්ථකත්වයන් හා සාධාරණීකරණයන්	79
2012 වැඩ සැලැස්ම	80
වාර්ෂික වාර්තාවේ සහ 2011 ගිණුම් වල සාරාංශය	82

<u>ක්ෂණික යොමුව</u>

ලියාපදිංචි කාර්යාලය :

අංක 90, කුමාරතුංග මුනිදාස මාවත, කොළඹ 3. ශ්‍රී ලංකාව

www.ibmbb.lk

<u>දුරකථන අංක</u>

පොදු	: +94-11-2552528
අධ්‍යක්ෂ	: +94-11-2552534
ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී	: +94-11-2553672
ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී	: +94-11-2553683

<u>ෆැක්ස් අංක :</u>

අධ්‍යක්ෂ : +94+11+2552529

පොදු : +94-11-2553683

ඊ මේල් : director@ibmbb.cmb.ac.lk

අධ්‍යක්ෂගේ සමාලෝචනය

ස්විඩන ජාත්‍යන්තර සංවර්ධන නියෝජිතායතනය (SIDA) විසින් ශ්‍රී ලංකා රජයට සපයන ලද ස්විඩන ක්රෝනර් (SEK) මිලියන 15 ක සහන ණයක් මගින් අරමුදල් සම්පාදනය කරන ලදුව ජෛව රසායන විද්‍යා, අණුක ජෛව වේද හා ජෛව තාක්ෂණ ආයතනයේ (IBMBB) සිවිල් ඉදි කිරීම් හා උපකරණ සම්පාදනය සිදු කරන ලදී. IBMBB හි මූලික සැලැස්මට අරමුදල් සම්පාදනය කරන ලද්දේ ආසියානු සංවර්ධන බැංකුවේ විද්‍යා හා තාක්ෂණ සේවක පිරිස් සංවර්ධන ව්‍යාපෘතිය විසිනි.

කොළඹ, ස්විඩන තානාපති කාර්යාලයේ දූත මණ්ඩල ප්‍රධානි අතිගරු ඈන් මේරි ෆැලනියස් මහත්මිය සහ ස්වීඩනයේ උප්සලා විශ්වවිද්‍යාලයේ උප ප්‍රධානී, මහාචාර්ය උල්ෆ් පැටර්සන් මහතා විසින් 2004 අප්‍රේල් 28 වැනි දින ජෛව රසායන විද්‍යා, අණුක ජෛවවේද හා ජෛව තාක්ෂණ ආයතනය (IBMBB) උත්සවාකාරයෙන් විවෘත කරන ලදී. ආයතනයේ ආඥා පනත 2004 අප්‍රේල් 3 වැනි දින අංක 1282/25 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලදී. ගොඩනැගිල්ල කොළඹ විශ්වවිද්‍යාලයේ ප්‍රධාන භූමියේ පිහිටා තිබේ. පූර්ණ ස්වයංක්‍රීය ඩී. එන්. ඒ. අනුක්‍රමයන්, මයික්‍රෝ ඇරේ ස්කැනර්, FPLC, HPLC, ප්‍රතිදීප්ත සහ කලා අසමතා අන්වීක්ෂ (Fluorescence and Phase Contrast microscopes), laminar floor hoods, සත්ත්ව හා ශාක පටක විද්‍යාගාරය තුළ වර්ධනය කිරීමේ පහසුකම්, පර්යේෂණ සත්වාගාර, ශීතාගාර, ස්ථානීය ජාලකරණය (LAN), විශේෂ ප්‍රකාශ තන්තු කේබල් මගින් අන්තර්ජාල ප්‍රවේශය වැනි අණුක ජෛව විද්‍යාවන්හි භාවිත වන සියලු ම නවීන උපකරණවලින් සමන්විත IBMBB ආයතනය පූර්ණ ලෙස වායුසමීකරණය කරන ලද්දකි.

IBMBB ආයතනය උපාධි අපේක්ෂක සිසුන් බඳවා නොගන්නා නමුදු විශ්වවිද්‍යාලයේ උපාධි අපේක්ෂක ඉගැන්වීම් වැඩසටහන්වලට සහයෝගය ලබා දේ. මූලික ක්‍රියාකාරී ක්ෂේත්‍රයන් වන්නේ විද්‍යාපති (MSc), දර්ශනපති (MPhil) සහ ආචාර්ය උපාධි (PhD) වැඩසටහන්ය. අණුක ජීවන විද්‍යාවන් පිළිබඳ විද්‍යාපති උපාධිය සහ සෛල සහ අණුක ප්‍රතිශක්ති වේදය පිළිබඳ විද්‍යාපති උපාධිය (MSc) වශයෙන් විද්‍යාපති උපාධි පාඨමාලා දෙකක් IBMBB විසින් පවත්වනු ලැබේ. මේ පාඨමාලාවල මූලික අරමුණ වන්නේ ශ්‍රී

ලංකාවේ සංවර්ධනයට අදාළ වර්තමාන ජෛව විද්‍යා ක්ෂේත්‍රයන්හි නාභිගත පුහුණුව ලබාදීමත්, ආචාර්ය උපාධිය ඉලක්ක කරගත් වැඩිදුර උසස් අධ්‍යයන කටයුතු සඳහා තරුණ උපාධි අපේක්ෂකයින් දිරිගැන්වීමත් ය. එසේ ම, පැවරුම්, වැඩමුළු, සම්මන්ත්‍රණ, පර්යේෂණ යෝජනා සකස් කිරීම වැනි ඉගැන්වීමේ නව ක්‍රම ද භාවිත කරනු ලැබේ.

අන්තර්ජාතික සංචාරක සම්මාන දෙකක් පර්යේෂණ සිසුන් විසින් දිනා ගන්නා ලදී. සිසුහු එකොළොස් දෙනෙක් IBMBB හිදී ද, අට දෙනෙක් අනෙකුත් උසස් අධ්‍යාපන ආයතනවල ද ලියාපදිංචි වී දර්ශනපති / ආචාර්ය (MPhil/PhD) උපාධි ලබාගැනීම සඳහා IBMBB හිදී පර්යේෂණ කටයුතුවල යෙදුණහ. ආචාර්ය උපාධි 02 ක් සාර්ථකව අවසන් කරන ලදී.

2009 වසරේ විද්‍යාපති (MSc) සිසුන් නව දෙනෙකු සිය දෙවන වසරේ අධ්‍යයන කටයුතු කරගෙන ගිය අතර ඔවුන්ගෙන් 6 දෙනෙක් නියමිත පරිදි පාඨමාලාව සාර්ථකව නිම කළහ. 2011 පෙබරවාරි මාසයේදී MSc සිසුන් දහනව දෙනෙක් ඇතුළත් කරගන්නා ලදහ. ජෛව තොරතුරු තාක්ෂණය පිළිබඳ වැඩමුළුවක් අගෝස්තු මාසයේදී පවත්වන ලදී. 2011 දී මුල් පර්යේෂණ පත්‍රිකා හතරක් අන්තර්ජාතික සඟරාවල පළ කරන ලද අතර මුල් පර්යේෂණ පත්‍රිකා දෙකක් මුද්‍රණයේ පැවතුණි. තවත් පත්‍රිකා තුනක් අන්තර්ජාතික සඟරාවල විමසුමට ලක් කරන ලදී. අන්තර්ජාතික සම්මන්ත්‍රණවලදී ඉදිරිපත් කරන ලද පර්යේෂණ ඉදිරිපත් කිරීම් හයක් ද ඇතුළුව පර්යේෂණ ඉදිරිපත් කිරීම් 32 ක් IBMBB කාර්ය මණ්ඩලය සහ සිසුන් විසින් සිදු කරන ලදී.

අධ්‍යක්ෂ : මහාචාර්ය කමනී එච්. තෙන්නකෝන්

<u>පාලක මණ්ඩලය</u>

අධ්‍යක්ෂ (සභාපති)
ලේකම් /උසස් අධ්‍යාපන අමාත්‍යාංශය, නිල බලයෙන් හෝ ඔහුගේ/ඇයගේ නම් කරන ලද අය

මහාචාර්ය ඊ. ආර්. ජැන්ස්, වි.වි.ප්‍ර.කො. විසින් නම් කරන ලද

මහාචාර්ය එරික් එච්. කරුණානායක, වි.වි.ප්‍ර.කො. විසින් නම් කරන ලද

මහාචාර්ය රොහාන් රාජපක්ෂ, වි. වි. ප්‍ර. කො. විසින් නම් කරන ලද (2011 ජූලි දක්වා)

මහාචාර්ය එස්. මෝහන්දාස්, වි. වි. ප්‍ර. කො. විසින් නම් කරන ලද (2011 ජූලි සිට)

මහාචාර්ය අයිරා තාබෲ, වි.වි.ප්‍ර.කො. විසින් නම් කරන ලද

මහින්ද රාජපක්ෂ මහතා, සභාව විසින් නම් කරන ලද (2011 ජූනි දක්වා)

එච්.එම්.එන්. වරකාඋල මහතා වි. වි. ප්‍ර. කො. විසින් නම් කරන ලද (2011 ජූලි සිට)

සී. මාලියද්ද මහතා, සභාව විසින් නම් කරන ලද

මහාචාර්ය එම්. එච්. ආර්. ෂෙරීෆ්, සනාතන සභාව විසින් නම් කරන ලද

ඩබ්ලිව්. අයි. නානායක්කාර මිය, සනාතන සභාව විසින් නම් කරන ලද

පීඨාධිපති / වෛද්‍ය, කොළඹ විශ්වවිද්‍යාලය, නිල බලයෙන්

පීඨාධිපති / විද්‍යා, කොළඹ විශ්වවිද්‍යාලය, නිල බලයෙන්

අංශ ප්‍රධානී, ජෛව රසායන විද්‍යා සහ අණුක ජෛව විද්‍යා, වෛද්‍ය පීඨය, නිල බලයෙන්

අධ්‍යක්ෂ, කොළඹ විශ්වවිද්‍යාලයේ පරිගණක පාසල, නිලබලයෙන්.

දැක්ම

අණුක ජෛව විද්‍යාවන්හි
අන්තර්ජාතික
විශිෂ්ට කේන්ද්‍රස්ථානයක්
බවට පත් වීම.

මෙහෙවර



ආරම්භ කිරීම
ප්‍රවර්ධනය කිරීම
ජාතික සහ අන්තර්ජාතික සංවර්ධනය ළඟා කර ගැනීම උදෙසා අණුක ජෛව විද්‍යාවන්හි උසස් පර්යේෂණ සහ මානව සම්පත් සංවර්ධනය
පහසුකම් සැලසීම

2011 කාර්ය සාධනය ඇස් බැල්මෙන්



අන්තර්ජාතික පිළිගැනීම

උප්සලා විශ්ව විද්‍යාලයේ රසායන විද්‍යා පිළිබඳ අන්තර්ජාතික වැඩසටහන (IPICS) සඳහා වන ආසියාවේ අණුක ජීවන විද්‍යා පිළිබඳ පර්යේෂණ මධ්‍යස්ථානයක් වශයෙන් සහ යුරෝපීය අණුක ජෛව විද්‍යා ජාලයේ (EMB net) ජාතික ජාල සංරචකය (node) වශයෙන් ද IBMBB දිගට ම කටයුතු කළේය.

අන්තර්ජාතික ජර්නලයන්හි සිය පර්යේෂණ සොයාගැනීම ප්‍රකාශයට පත් කිරීමටත්, අන්තර්ජාතික සම්මන්ත්‍රණ කිහිපයකදී ම සිය නිගමන ඉදිරිපත් කිරීමටත් IBMBB කාර්ය මණ්ඩලය සහ සිසුහු සමත් වූහ. විස්තර අන්තැනක සඳහන් කරනු ලැබේ. සෙනොබයොටික්ස් අධ්‍යයනය පිළිබඳ අන්තර්ජාතික සංගමයේ උතුරු ඇමෙරිකානු රැස්වීමේදී සිය පර්යේෂණ ප්‍රතිඵල ඉදිරිපත් කිරීම සඳහා සෙනොබයොටික්ස් අධ්‍යයනය පිළිබඳ අන්තර්ජාතික සංගමයෙන් එක් PhD ශිෂ්‍යයෙකුට සංචාරක ප්‍රදානයක් දිනා ගත් අතර 2012 මාර්තු මාසයේදී ඉතාලියේ ෆ්ලෝරන්ස්හිදී පැවැත්වෙන නාරිවේද නිර්නාල ග්‍රන්ථි අධ්‍යයනය පිළිබඳ 15 වැනි ලෝක සමුළුවේදී සිය පර්යේණ ප්‍රතිඵල ඉදිරිපත් කිරීමේ අවස්ථාව, නාරිවේද නිර්නාල ග්‍රන්ථි විද්‍යාව පිළිබඳ අන්තර්ජාතික සංගමය විසින් පවත්වන ලද 34 න් පහළ තරගයේදී තවත් ශිෂ්‍යයෙකු විසින් ලබා ගන්නා ලදී. (වයස අවුරුදු 34 ට අඩු පර්යේෂකයන් විසින් ඉදිරිපත් කරන ලද උද්ධෘත පදනම් කරගෙන).

මානව සම්පත් සංවර්ධනය

පශ්චාත් උපාධි වැඩසටහන්

දර්ශනපති / ආචාර්ය උපාධි (MPhil/PhD) වැඩසටහන්

IBMBB හි කලින් ලියාපදිංචි වූ සිසුන් එකොළොස් දෙනෙකු සිය අධ්‍යයන කාර්යයන් අඛණ්ඩව කරගෙන ගිය අතර, එක් නව ලියාපදිංචි කිරීමක් සිදු කරන ලදී. (1 වන වගුව). ඔවුන්ගේ කටයුතු පදනම් වී ඇති පර්යේෂණ වැඩසටහන්, පර්යේෂණ ක්‍රියාකාරකම් යටතේ විස්තර වේ.

දර්ශනපති /ආචාර්ය උපාධි සඳහා වෙනත් උසස් අධ්‍යාපන ආයතනවල ලියාපදිංචි වූ සිසුහු හත් දෙනෙක් සිය අධ්‍යයන කටයුතු සියල්ල ම හෝ ඒවායින් කොටසක් IBMBB හිදී සිදු කළහ. කොළඹ විශ්වවිද්‍යාලයේ විද්‍යා පීඨයේ ලියාපදිංචි වූ සිසුහු දෙදෙනෙක් ද; කොළඹ විශ්වවිද්‍යාලයේ පරිගණක පාසලේ ලියාපදිංචි වූ එක් සිසුවෙක් ද; කැලණිය විශ්වවිද්‍යාලයේ ලියාපදිංචි වූ එක් සිසුවෙක් ද; මොරටුව විශ්වවිද්‍යාලයේ ලියාපදිංචි වූ එක් සිසුවෙක් ද, පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ලියාපදිංචි වූ එක් සිසුවෙක් ද ශ්‍රී

ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ලියාපදිංචි වූ සිසුහු දෙදෙනෙක් ද ඔවුන්ට ඇතුළත් වූහ. (1 වගුව)

ඉහත සඳහන් කරන ලද දර්ශනපති/ආචාර්ය උපාධි සිසුන් 18 දෙනාට අමතරව, (IBMBB හි ලියාපදිංචි වූ 11 දෙනා සහ වෙනත් උසස් අධ්‍යාපන ආයතනවල ලියාපදිංචි වූ 7 දෙනා) ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ උපාධිධාරී අධ්‍යයන පීඨයේ ලියාපදිංචි වූ එක් PhD සිසුවෙකු සහMPhil සිසුන් දෙදෙනකු IBMBB කාර්ය මණ්ඩලය විසින් සම අධීක්ෂණය කරනු ලැබිණ.

විද්‍යාපති (MSc) වැඩසටහන්

විද්‍යාපති වැඩසටහන් දෙක සඳහා හත්වැනි ශිෂ්‍ය කණ්ඩායම 2011 පෙබරවාරි මාසයේදී බඳවා ගනු ලැබූ අතර සිසුහු 06 දෙනෙක් අණුක ජීවන විද්‍යා විෂයයන් සඳහා ද, 4 දෙනෙක් සෛල හා අණුක ව්‍යාධිවේද විෂයයන් සඳහා ද ලියාපදිංචි වූහ. 2011 වසරේ ඇතුළත් වූවන්ට සිය පළමු හා දෙවැනි වාර දේශන, රසායනාගාර ප්‍රායෝගික අධ්‍යයන, සම්මන්ත්‍රණ, නිබන්ධන ආදිය සපයන ලදී. වාර මැද සහ පළමු වාරාවසාන පරීක්ෂණය ද වසර තුළදී පවත්වන ලදී. ඊට අමතරව, ලිඛිත හා වාචික ඉදිරිපත් කිරීම් ඇතුළත් පැවරුම් සිසුන්ට ලබාදෙන ලදී. 2010 බඳවාගත් සිසුන් සිය දෙවැනි අධ්‍යයන වාරයේ දේශන, ප්‍රායෝගික අභ්‍යාස, සම්මන්ත්‍රණ, නිබන්ධන ආදිය සහිතව සිහ අධ්‍යයන කටයුතු සිදු කළ අතර දෙවැනි වාරාවසාන පරීක්ෂණය ද පවත්වන ලදී. අණුක ජෛව විද්‍යා සිසුන් දෙදෙනකු හැර 2010 බඳවා ගනු ලැබූ සියලු ම ශිෂ්‍යයෝ තෙවැනි අධ්‍යයන වාරයට ඇතුළු වීමට සුදුසුකම් ලැබූහ.

MSc පර්යේෂණ ව්‍යාපෘති 22 ක් සිදු කරන ලදී. [පාඨමාලා පරීක්ෂණ නැවත කළ යුතුව තිබූ 2008 බඳවා ගත් සිසුන් දෙදෙනකු, 2009 බඳවාගත් සිසුන් දෙදෙනකු (වෛද්‍ය හේතු නිසා ව්‍යාපෘතිය ආරම්භ කිරීම ප්‍රමාද කළ එක් අයකු සහ පර්යේෂණ ව්‍යාපෘතිය සම්පූර්ණ කිරීම ප්‍රමාද කළ අයකු) සහ 2011 බඳවා ගත් සිසුන් 17 දෙනෙකු]. මේ 17 දෙනාගේ (අණුක ජීවන විද්‍යා 10 දෙනෙකු සහ සෛල සහ අණුක ව්‍යාධිවේද 7 දෙනෙකු) නිබන්ධන පරීක්ෂණ සම්පූර්ණ කරන ලදී. නැතහොත් 2011 වසරේ පරීක්ෂණය සඳහා ඉදිරිපත් කරන ලදී.

සුදුසු කිසිවකු නොසිටි නිසා (2009 බඳවා ගැනීමෙන්) අණුක ජීවන විද්‍යා විද්‍යාපති (MSc) හොඳ ම සිසුවා සඳහා වන මහාචාර්ය එරික් එච්. කරුණානායක

රන් පදක්කම සහ සෛල සහ අණුක ප්‍රතිශක්තිවේද විද්‍යාපති (MSc) හොඳම සිසුවා සඳහා වන ග්ලැක්සෝ ස්මිත්ක්ලයින් රන් පදක්කම මෙවර ප්‍රදානය නොකරන ලදී.

ආචාර්ය ඕ. වී. එස්. ඩී. ජේ. වීරසේන මහතා, අණුක ජෛව විද්‍යා විද්‍යාපති (MSc), සම්බන්ධීකාරක වශයෙන් තව දුරටත් කටයුතු කළ අතර, සෛල සහ අණුක ප්‍රතිශක්තිවේදය පිළිබඳ විද්‍යාපති (MSc) සම්බන්ධීකාරක වශයෙන් ආචාර්ය ශිරෝමා හඳුන්නෙත්ති මහත්මිය දිගට ම කටයුතු කළාය.

පහත දැක්වෙන විද්වත්හු පීඨයට පැමිණ අණුක ජීවන විද්‍යා පිළිබඳ විද්‍යාපති (MSc) පාඨමාලාව වෙනුවෙන් දේශන සහ/හෝ නිබන්ධන / ප්‍රායෝගික පන්ති පැවැත්වූහ; මහාචාර්ය එරික් එච්. කරුණානායක, මහාචාර්ය කමනී එච්. තෙන්නකෝන් (IBMBB), මහාචාර්ය අයිරා තාබෘ, මහාචාර්ය වසන්ති අර්සරත්නම්, (වෛද්‍ය පීඨය, යාපනය විශ්වවිද්‍යාලය), මහාචාර්ය රෝහිණී ප්‍රනාන්දුපුල්ලේ (වෛද්‍ය පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය), මහාචාර්ය රෝහිණී හේවාමාන්න (විද්‍යා පීඨය, කොළඹ විශ්ව විද්‍යාලය), ආචාර්ය ජගත් වීරසේන (IBMBB), ආචාර්ය නිලන්ති දසනායක (ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය), ආචාර්ය ටී. ඊස්වරමෝහන් (විද්‍යා පීඨය, යාපනය විශ්වවිද්‍යාලය), කාන්තා ලංකාතිලක මහත්මිය (වෛද්‍ය පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය), ආචාර්ය ශ්‍යාමලා තිරිමාන්න (විද්‍යාපීඨය, කොළඹ විශ්වවිද්‍යාලය), ආචාර්ය සුමිත්‍රා තිසේරා (පවුල් සංවිධාන සංගමය) සුමේධා විජේරත්න මහත්මිය (වෛද්‍ය පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය), සුදේශිනි හේවගේ මෙනවිය සහ සුමාධී ද සිල්වා මෙනෙවිය පාඨමාලා සම්බන්ධ ප්‍රායෝගික කටයුතුවලදී සහාය වූහ.

පහත දැක්වෙන විද්වත්හු පීඨයට පැමිණ, සෛල හා අණුක රෝග නිරෝධවේදය පිළිබඳ MSc පාඨමාලාව සඳහා දේශන පැවැත්වූහ :-- මහාචාර්ය එරික් එච්. කරුණානායක (IBMBB), මහාචාර්ය අනුර වීරසිංහ (වෛද්‍ය පීඨය, කැලණිය විශ්වවිද්‍යාලය), මහාචාර්ය එස්. කොටගම (විද්‍යා පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය), ආචාර්ය ශිරෝමා හඳුන්නෙත්ති (IBMBB), වෛද්‍ය සුරන්ජිත් සෙනෙවිත්න, (සායනක රෝග නිරෝධවේදී, ඉම්පීරියල් විද්‍යායතනය, ලන්ඩන්), වෛද්‍ය ඉනෝකා කොරයා (වෛද්‍ය පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය), වෛද්‍ය රජීව් ද සිල්වා, වෛද්‍ය සේපාලි ගුණවර්ධන, වෛද්‍ය ඔමාලා විමලරත්න, වෛද්‍ය නිශාලි ඒකනායක, වෛද්‍ය ජනක මුණසිංහ සහ වෛද්‍ය ප්‍රීති පෙරේරා (වෛද්‍ය පර්යේෂණ ආයතනය), ආචාර්ය දර්ශන් ද සිල්වා (Genetech), වෛද්‍ය එස්. ගිනිගේ (වසංගතවේද ඒකකය, සෞඛ්‍ය අමාත්‍යාංශය), වෛද්‍ය සරෝජා සිරිවර්ධන (ජාතික රෝහල, ශ්‍රී ලංකාව) සහ වෛද්‍ය බද්ධිකා ජයරත්න

සහ වෛද්‍යා දමයන්ති පීරිස් (පිළිකා රෝහල, මහරගම). එස්. ගුණතිලක මහත්මිය ප්‍රායෝගික පාඨමාලාවට සහාය වූවාය.

2012 බඳවා ගැනීම් සඳහා ඉල්ලුම්පත් කැඳවන ලද අතර තෝරා ගැනීමේ පරීක්ෂණය පවත්වන ලදී. 2012 ජනවාරි මුල් භාගයේදී සම්මුඛ පරීක්ෂණ පැවැත්වීමට නියමිතය.

කෙටි පාඨමාලා

අණුක ජෛව තාක්ෂණ විද්‍යා පිළිබඳ සහතික පත්‍ර පාමාලව

අණුක ජෛව විද්‍යාවට හා ප්‍රවේණි විද්‍යාවට ප්‍රවේශයක් ලබාදීම සඳහා අණුක ජෛව විද්‍යා තාක්ෂණයන් පිළිබඳ පස් දින සහතික පාඨමාලාවක් 2011 අගෝස්තු 08 සිට 2011 අගෝස්තු 12 දක්වා පවත්වන ලදී. මේ පාඨමාලාවට සහභාගි වූ මුළු සංඛ්‍යාව 10 ක් විය. (පිරිමි 04, ගැහැණු 06). සහභාගි වූවන් විසින් වැඩමුළුව බෙහෙවින් උසස් ලෙස අගය කිරීමට ලක් විය. වෙනත් විශ්වවිද්‍යාලවලින්, පර්යේෂණ ආයතනවලින් හා රජයේ දෙපාර්තමේන්තුවලින් පැමිණි කාර්ය මණ්ඩල සාමාජිකයන් 7 දෙනෙක් සහභාගි වූවන්ට ඇතුළත් වූහ. ඔවුන්ගෙන් සමහරෙකුට ඔවුන්ගේ අදාළ ආයතනවලින් උපකාර ලැබිණ.

සිව්වැනි වාර්ෂික විද්‍යාත්මක සැසිය

IBMBB හි සිව්වැනි වාර්ෂික විද්‍යාත්මක සැසිය 2011 මැයි 5 දින පැවැත්විණි. කොළඹ විශ්වවිද්‍යාලයේ උප කුලපති සහ අනෙකුත් සම්භාවනීය විද්‍යාර්ථීහු/විද්‍යාඥයෝ සහ අභාවප්‍රාප්ත මහාචාර්ය ස්ටැන්ලි විජේසුන්දර මහතාගේ පවුලේ සාමාජිකයෝ ආරම්භක සැසිවාරයට සහභාගි වූහ. මේ අවස්ථාවේ විශේෂ අංගය වූයේ කොළඹ විශ්වවිද්‍යාලයේ කාබනික රසායන විද්‍යා මහාචාර්ය ඊ. දිලිප් ද සිල්වා මහතා විසින් පවත්වන ලද මහාචාර්ය ස්ටැන්ලි විජේසුන්දර අනුස්මරණ දේශනයය. "ස්වභාව ධර්මයෙන් ඖෂධ : ජෛව විවිධත්වයෙන් රසායනික විවිධත්වය ලබා ගැනීම" යන්න දේශනයේ මාතෘකාව විය. උප්සලාහි කෘෂිකාර්මික විද්‍යා පිළිබඳ ස්වීඩන විශ්වවිද්‍යාලයේ සහකාර මහාචාර්ය, ආචාර්ය එරික් බොන්ග්කැම් රඩ්ලොප් මහතා විසින්, "ඊළඟ පරම්පරාවේ අනුක්‍රමණය" යන මැයෙන් පූර්ණ සාමාජික දේශනයක් පවත්වන ලදී. වාචික ඉදිරිපත් කිරීම් 10 ක්ද පෝස්ටර් ඉදිරිපත් කිරීම් 16 ක්ද, එහිදී

පවත්වන ලදී. ඒවා අතුරින් වාචික ඉදිරිපත් කිරීම් 7 ක් සහ පෝස්ටර් ඉදිරිපත් කිරීම් 15 ක් සිදු කරන ලද්දේ IBMBB පර්යේෂකයන් සහ පශ්චාත් උපාධි සිසුන් විසිනි.

සම්මන්ත්‍රණ

"බෝවෙන රෝග පිටු දැකීම, මතුවීම සහ නැවත මතුවීම - පර්යේෂණ අවශ්‍යතා" යන මැයෙන් වූ දේශනයක්, IBMBB විසින් සංවිධානය කරන ලද අතර ආචාර්ය ශිරෝමා හඳුන්නෙත්ති විසින් එය සම්බන්ධීකරණය කරන ලදී. ඕස්ට්‍රේලියාවේ ජේම්ස් කුක් විශ්වවිද්‍යාලයේ මහාචාර්ය නත්කුනම් කේතීසන්; සෞඛ්‍ය අමාත්‍යාංශයේ ව්‍යාධිවේද විශේෂඥ වෛද්‍ය සමිත ගිනිගේ, රුහුණු විශ්වවිද්‍යාලයේ පරපෝෂිතවේද මහාචාර්ය මිරානි වීරසූරිය; මැලේරියා මර්දන ව්‍යාපාරයේ වෛද්‍ය ගෞරි ගලප්පත්ති; කොළඹ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයේ අණුක ජෛවවේද මහාචාර්ය ජෙනිෆර් පෙරේරා; ජාන තාක්ෂණ පර්යේෂණ ආයතනයේ ආචාර්ය දර්ශන් ද සිල්වා සහ IBMBB හි ආචාර්ය ශිරෝමා හඳුන්නෙත්ති යන විද්වත්හු මේ එක් දින සම්මන්ත්‍රණයේ සම්පත් දායකයෝ වූහ. IBMBB සහ බාහිර ශිෂ්‍යයෝ මෙන්ම විද්‍යාඥයෝ, පර්යේෂකයෝ සහ සායනික ශිල්පීහු ද ඊට සහභාගි වූහ.

අනෙකුත් ආයතනවල සහ කොළඹ විශ්වවිද්‍යාලයේ පීඨවල ලියාපදිංචි වූ MSc සිසුන්ගේ සහ උපාධි අපේක්ෂක සිසුන්ගේ පර්යේෂණ ව්‍යාපෘති අධීක්ෂණය

MSc සිසුන් දෙදෙනකුගේ පර්යේෂණ ව්‍යාපෘති (විද්‍යාපීඨය, රසායන විද්‍යා දෙපාර්තමේන්තුව; පශ්චාත් වෛද්‍ය ආයතනය, අණුක වෛද්‍ය Msc) සහ උපාධි අපේක්ෂක සිසුන් තිදෙනකුගේ (විද්‍යාපීඨයේ ජෛව රසායන හා අණුක ජෛව විද්‍යා) පර්යේෂණ ව්‍යාපෘති IBMBB කාර්ය මණ්ඩලය විසින් අධීක්ෂණය කරන ලදී.

උපාධි අපේක්ෂක සිසුන්ට අණුක ජෛව විද්‍යාව පිළිබඳ අවබෝධයක් ලබා දීම

වයඹ විශ්වවිද්‍යාලයේ කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨයේ සිසුන් එකොළොස් දෙනෙකුට, ජෛව තාක්ෂණ යෙදවුම් පිළිබඳ හඳුන්වා දීමේ වැඩසටහනකට සහභාගි වීම සඳහා IBMBB ආයතනයේ එක් දින සංචාරයකට අවස්ථාව සලසන ලදී.

BMI ආයතනයේ ජෛව වෛද්‍ය විද්‍යා BSc (ගෞරව) සිසුන් සඳහා IBMBB කාර්ය මණ්ඩලය ප්‍රායෝගික නිදර්ශන සැසි පැවැත්විය.

කාර්ය මණ්ඩල සංවර්ධන සහ සුබසාධනය

2011 මැයි 26 සිට 27 දක්වා පෘතුගාලයේ Oeiras හිදී EMBnet හමුව සමඟ ඒකාබද්ධව පවත්වනු ලැබූ ඉදිරි පරම්පරාවේ අනුක්‍රමණ දත්ත කළමනාකරණය පිළිබඳ වැඩමුළුවකට සහකාර ජාල කළමනාකරු සහභාගි විය.

ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරු දෙදෙනෙක් 2011 ඔක්තෝබර් 4 දින පැවැති "පශ්චාත් උපාධි පර්යේෂණ වැඩසටහන් යෝජනා ලේඛකයින් සඳහා වන QIG පුහුණු වැඩමුළුවට" සහභාගි වූහ.

උසස් අධ්‍යාපන ආයතන සහ පර්යේෂණ ආයතන සඳහා කාර්ය මණ්ඩල සංවර්ධන වැඩසටහන්

නැගෙනහිර විශ්ව වද්‍යාලයේ පරිවාස කථිකාචාර්යවරයෙක් සහ යාපනය විශ්වවිද්‍යාලයේ පරිවාස කථිකාචාර්යවරයෙක් IBMBB හිදී සිය PhD අධ්‍යයන කටයුතු කරගෙන කියහ. ඒ පර්යේෂණ සඳහා IBMBB පර්යේෂණ අරමුදල්වල පූර්ණ සහයෝගය ලබා දෙන ලද අතර IBMBB කාර්ය මණ්ඩලය විසින් අධීක්ෂණය කරන ලදී. ශ්‍රී ජයවර්ධපුර විශ්වවිද්‍යාලයේ එක් පරිවාස කථිකාචාර්යවරයෙක් ද, දේශීය වෛද්‍ය ආයතනයේ තවත් කථිකාචාර්යවරයෙක් ද, සිය PhD අධ්‍යයන කටයුතුවල කොටසක් IBMBB හිදී සිදු කළහ. මේ සිසුන්ට IBMBB විසින් යම් ප්‍රමාණයක සහයෝගයක් ලබා දෙන ලද අතර IBMBB කාර්ය මණ්ඩලය විසින් ඔවුන් අධීක්ෂණය කරන ලදී.

තේ පර්යේෂණ ආයතනයේ එක් ශිෂ්‍යාවක් IBMBB හිදී සිය දර්ශනපති (MPhil) අධ්‍යයන කටයුතු සිදු කළ අතර IBMBB කාර්ය මණ්ඩලය විසින් පර්යේෂණ සම අධීක්ෂණය සිදු කරන ලදී.

2011 මාර්තු මාසයේදී ශ්‍රී ලංකා අසාත්මිකතා සහ ප්‍රතිශක්තිවේද සංගමය විසින් රසායනාගාර තාක්ෂණවේදීන් වෙනුවෙන් පවත්වන ලද ප්‍රතිශක්තිවේද සහතික පාඨමාලාවේ ඉගැන්වීමට ආචාර්ය ශිරෝමා හඳුන්නෙත්ති දායකත්වය ලබා දුන්නාය.

ජාතික/අන්තර්ජාතික නියෝජිත ආයතන මගින් ජාතික සංවර්ධනය

තේ පර්යේෂණ ආයතනය, ශාක ප්‍රවේණි සම්පත් මධ්‍යස්ථානය, මහරගම ජාතික පිළිකා රෝහල, කාසල් වීදියේ කාන්තා රෝහල, ශ්‍රී ලංකා ජාතික රෝහල, මහරගම මූලික රෝහල, වෛද්‍ය පර්යේෂණ ආයතනය, කොළඹ විශ්ව විද්‍යාලයේ සහ ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ වෛද්‍ය හා විද්‍යා පීඨ සමඟ කැලණිය විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨය, පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ කෘෂි ජෛව තාක්ෂණ මධ්‍යස්ථානය, විවෘත විශ්වවිද්‍යාලය, වයඹ විශ්වවිද්‍යාලය සහ කාර්මික තාක්ෂණ ආයතනය සමඟ සහයෝගිතා පර්යේෂණ වැඩසටහන් වසර තුළදී අඛණ්ඩව පවත්වාගෙන යන ලදී.

ප්‍රජනන සෞඛ්‍ය පර්යේෂණය පිළිබඳ ජාතික සම්බන්ධීකරණ කමිටුවේ සාමාජිකාවක වශයෙන් අධ්‍යක්ෂිකා, මහාචාර්ය කමනී තෙන්නකෝන් මිය කටයුතු කළාය. 2011 නොවැම්බර් මාසයේදී ජාතික විද්‍යා පදනම විසින් සංවිධානය කරන ලද ශ්‍රී ලංකාව සඳහා වන මානව ප්‍රවේණි ද්‍රව්‍ය හා දත්ත පිළිබඳ ජාතික ප්‍රතිපත්ති කෙටුම්පතක් පිළිබඳ සම්බන්ධිත පාර්ශවයන්හි රැස්වීමට ද, ඇය සහභාගි වූවාය. ලංකා වෛද්‍ය ජර්නලයේ සහ වෛද්‍ය පර්යේෂණ ලේඛනාගාරයේ අත්පිටපත් සමීක්ෂකයකු වශයෙන් ද, ජාතික විද්‍යා පදනමේ සහ ජාතික පර්යේෂණ සභාවේ පර්යේෂණ යෝජනා සහ ප්‍රගති වාර්තා සමාලෝචකයකු වශයෙන් ද ඇය කටයුතු කළාය.

ආචාර්ය ශිරෝමා හඳුන්නෙත්ති මිය, ජාතික විද්‍යා පදනමේ ජෛව තාක්ෂණ විද්‍යා කමිටුවේ සාමාජිකාවක වශයෙන් කටයුතු කළ අතර, ප්‍රගති වාර්තා, අවසන් වාර්තා සහ නව පර්යේෂණ ව්‍යාපෘති යෝජනා සමාලෝචකයකු ද වූවාය. එසේ ම, 2011 අප්‍රේල් මාසයේදී තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය විසින් සංවිධාන කරන ලද "ජෛව තාක්ෂණවේදය පිළිබඳ SAARC ක්‍රියාකාරී කණ්ඩායමේ හතර වැනි රැස්වීමට ද සහභාගි වූවාය. ශ්‍රී ලංකා අසාත්මිකතා සහ රෝග ව්‍යාධිවේද සංගමයේ (AISSL) සභා සාමාජිකාවක වශයෙන් ද ඇය කටයුතු කළ අතර සැප්තැම්බර් මාසයේදී, ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨය විසින් සංවිධාන කරන ලද AGRESS – 2011හි පර්යේෂණ ඉදිරිපත් කිරීම් ඇගැයීමේ විනිශ්චය මණ්ඩල සාමාජිකාවක වශයෙන් සහ කොළඹ විශ්වවිද්‍යාලයේ විද්‍යා පීඨයේ නිබන්ධන පරීක්ෂක වරියක වශයෙන් ද කටයුතු කළාය.

වයඹ විශ්වවිද්‍යාලයේ බාහිර කථිකාචාර්යවරයකු වශයෙන් ද කොළඹ විශ්වවිද්‍යාලයේ විද්‍යා පීඨයේ ප්‍රමාණකයකු සහ යාපනය විශ්වවිද්‍යාලයේ වවුනියා පීඨයේ තොරතුරුවේද

සහ පරිගණක ජෛව විද්‍යා පාඨමාලාවේ ජෛව තොරතුරුවේද හා පරිගණක ජෛව විද්‍යා මොඩියුලයේ දෙවැනි පරීක්ෂකයකු වශයෙන් ද ආචාර්ය ජගත් වීරසේන මහතා කටයුතු කළේය. ඔහු ජාතික විද්‍යා පදනමේ සහ ජාතික පර්යේෂණ සභාවේ පර්යේෂණ යෝජනා සමීක්ෂකයකු ද විය.

IBMBB හි EMBnet node ද භාරව කටයුතු කරන සහකාර ජාල කළමනාකරු කාංචන සේනානායක මහතා යුරෝපීය අණුක ජෛව විද්‍යා ජාලයේ (EMBnet) නව ව්‍යුහය සකස් කිරීමට සම්බන්ධ වී කටයුතු කළේය. ප්‍රචාරක සහ මහජන සම්බන්ධතා ව්‍යාපෘති කමිටුවේ සාමාජිකයකු වශයෙන් EMBnet වෙබ් අඩවිය සැලසුම් කිරීමේ හා අනුග්‍රාහකත්ව හා ප්‍රචාරක ප්‍රතිපත්ති සකස් කිරීමේ EMBnet ක්‍රියාකාරී රැස්වීමකට ද ඒ මහතා සහභාගි විය.

සම්මාන මහාචාර්ය එරික් කරුණානායක මහතා ජාතික පර්යේෂණ සභාවේ සභාපති වශයෙන් තවදුරටත් කටයුතු කළ අතර, ස්ටොක්හෝම්හි අන්තර්ජාතික විද්‍යා පදනමේ සහ තුන්වැනි ලෝකයේ විද්‍යා ඇකඩමියේ සමාලෝචකයකු වශයෙන් ද කටයුතු කළේය.

පර්යේෂණ කාර්යයන්

නිවර්තන කලාපීය රෝග, අණුක වෛද්‍ය විද්‍යාව (පිළිකා ප්‍රවේණි විද්‍යාව, ප්‍රජනන හා සංවර්ධන ජීව විද්‍යාව, මානව DNA විචල්‍යතා) සහ ශාක අණුක ජෛව විද්‍යාව යන ක්ෂේත්‍රයන්හි පර්යේෂණ වැඩසටහන් රාශියක් ම IBMBB හි ක්‍රියාත්මකව පවතී. ආයතනයේ අධ්‍යක්ෂ, සහායක විද්‍යාඥයින් සහ ආයතනයේ අධ්‍යයන කාර්ය මණ්ඩලයේ කිහිප දෙනෙකු යන අයගේ අධීක්ෂණය යටතේ දර්ශනපති (MPhil) / දර්ශන සූරී (PhD) සහ විද්‍යාපති (MSc) සිසුන්ට පර්යේෂණ පුහුණුව ලබා දෙන ව්‍යාපෘති කිහිපයක් එක් එක් පර්යේෂණ වැඩසටහනට ඇතුළත් වේ. සිසුන්, පර්යේෂණ ව්‍යාපෘති සහ අධීක්ෂකයින් 1 වැනි වගුවේ ලැයිස්තුගත කර ඇත. සමපදස්ථයින් විසින් සමාලෝචනය කරන ලද ජර්නලවල පළමු පූර්ණ වාර්තා මුළු සංඛ්‍යාව 6 ක් වූ අතර (ප්‍රකාශිත 4, මුද්‍රණයේ 2) පත්‍රිකා 3 ක් අන්තර්ජාතික ජර්නලවල සමාලෝචනයට ලක්වෙමින් තිබේ. විද්‍යාත්මක රැස්වීම්වලදී පර්යේෂණ සන්නිවේදනයන් 32 ක් ඉදිරිපත් කරන ලදී. සන්නිවේදන හා ප්‍රකාශන මේ වාර්තාව අවසානයේ දැක්වේ. PhD සිසුන් අරමුදල් ලබාගත් අධ්‍යයන 2 ක් හැරුණු විට (තේ පර්යේෂණායතනයෙන් එක් සිසුවකු සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසමෙන් සහ අනෙක් සිසුවා ප්‍රජනන සෞඛ්‍ය

පර්යේෂණ පිළිබඳ ජාතික සම්බන්ධීකරණ කමිටුවෙන්) පර්යේෂණ වැඩසටහන්වලට සහ MPhil/PhD අධ්‍යයනවලට අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් විසින් තරඟකාරි පර්යේෂණ ප්‍රදාන මගින් අරමුදල් සපයා ගන්නා ලදී. පසුව සඳහන් කරන ලද අධ්‍යයනයන් දෙකට IBMBB හි අර්ධ සහයෝගය ලැබිණ. අධ්‍යයන කාර්ය මණ්ඩලය / බාහිර මහාචාර්යවරුන් විසින් ලබා ගන්නා ලද අරමුදල් පිළිබඳ විස්තර 2 වැනි වගුවේ දැක්වේ.

(අ) පරපෝෂිත සහ ආසාදන රෝග පිළිබඳ පර්යේෂණ වැඩසටහන්

(i) බරවා රෝගය සම්බන්ධයෙන් අණුක ජෛව විද්‍යාත්මක ප්‍රවේශයන්

ශ්‍රී ලංකාවේ බරවා රෝගය ඇති කරනු ලබන්නේ බරවා රෝග කාරක වටපණු පරපෝෂිතයකු වන *Wuchereria brancrofti* විසිනි. රෝග කාරක මදුරුවා වන *Culex quinquefaciatus* විසින් රෝගය පතුරුවනු ලබයි. ලෝක සෞඛ්‍ය සංවිධානයේ දත්ත අනුව, ලෝකයේ සර්මකලාපීය රටවල මිලියන 125 කට වැඩි ජන සංඛ්‍යාවකට දැනට මේ රෝගය වැළඳී තිබේ. රෝග කාරක මදුරුවා අනාවරණය කර ගැනීම සඳහා කඩිනම් සහ බෙහෙවින් ම සංවේදී DNA පදනම් කරගත් රෝග විනිශ්චය ශිල්පීය ක්‍රම මෙන් ම ඒ හා සමාන DNA පදනම් කරගත් ක්‍රම වැඩි දියුණු කිරීමට පසු ගිය වසර කිහිපය තුළ අපට හැකි වී තිබේ.

රෝගයට ප්‍රතිකාර වශයෙන් දැනට ඇත්තේ කාර්බමැසයින් (carbamazine) සහ අයිවර්මෙක්ටින් (ivermectin) යන ඖෂධ වර්ග දෙක පමණි. ඒ නිසා, නව ඖෂධ සොයා ගැනීමේ සහ පරපෝෂිතයා තුළ තිබිය හැකි ඖෂධ ඉලක්ක හඳුනා ගැනීමේ විශාල අවශ්‍යතාවක් පවතී. පරපෝෂිතයා තුළ ඇති සයික්ලෝ ඔක්සිජිනේස් (cyclo-oxygenase) නම් එන්සයිමය, ඖෂධය වැඩි දියුණු කිරීමේ විභව්‍ය ඉලක්කයක් වශයෙන් උපකල්පනය කරනු ලැබ ඇත. මේ එන්සයිමය අර්ධ වශයෙන් පවිත්‍ර කිරීම සහ ලක්ෂණ විභාග කිරීම IBMBB හිදී මීට පෙර සිදු කරන ලදී.

වසාල බරවා රෝගය (lymphatic filariasis) ඇති කරන *W. bancrofti* බරවා පරපෝෂිතයා කෘත්‍රිමව බෝකළ නොහැකිය. පරපෝෂිත ද්‍රව්‍ය ලබා ගත හැකි එක ම මාර්ගය වන්නේ රෝගීන්ගෙන් රාත්‍රී කාලයේ එකතු කර ගනු ලබන රුධිර සාම්පල පමණි. අණුක අධ්‍යයනයන් කිරීම සඳහා මේ මූලය ප්‍රමාණවත් නොවේ. මෙයට

සම්බන්ධ ගව බරවා පරපෝෂිතයකු වන්නේ *Setaria digitata* ය. ගව ඝාතකාගාරවල මරනු ලබන ගවයින්ගේ යටිබඩේ කුහරයෙන් මේ පරපෝෂිතයාගේ වැඩුණු පණුවා විශාල ප්‍රමාණයන්ගෙන් ලබා ගත හැකිය. මේ පරපෝෂිතයා යොදා ගනිමින් cDNA ලේඛනාගාරයක් පිහිටුවන ලදී. පරපෝෂිත විශේෂ ජාන ලබා ගැනීම සඳහා මේ ලේඛනාගාරය පිරික්සීම දිගට ම සිදුවෙමින් පවතී. එහිදී මයෝසීන් සරල දාම ජාන සහ වෙනත් ජාන කිහිපයක් අනුක්‍රමණය කරනු ලැබ ඇත. බරවා රෝගය සම්බන්ධයෙන් නව ඖෂධ වැඩි දියුණුව සඳහා ප්‍රතිකාරක ඉලක්ක හෝ රෝග නිධාන පිරික්සුම් ක්‍රම සැපයීමට මේවා ඉවහල් වනු ඇත. එක් (MSc) ව්‍යාපෘතියක් මේ කාර්යය මත පදනම් විය.

PhD උපාධිය සඳහා විද්‍යා පීඨයේ ලියාපදිංචි වූ එක් ශිෂ්‍යයකු විසින් අදාළ අධ්‍යයන කටයුතු සිදු කැරෙමින් පවතින අතර ඒ පිළිබඳ පරීක්ෂණ IBMBB හිදී සිදු වෙමින් පවතී. ප්‍රෝටීන් අංකන cDNA ක්ලෝනය වැනි වර්ධක සාධකයක් *Setaria Digitata cDNA* ලේඛනාගාරයෙන් හඳුනා ගන්නා ලදී. අංකන කලාපය රෝග කාරක ප්‍රකාශනය තුළ ක්ලෝනකරණය කරන ලද අතර ප්‍රතිසම්බන්ධිත ප්‍රෝටීනය ප්‍රකාශ කරන ලදී. X කිරණ ස්ඵටිකකරණය (X-ray crystallography) සඳහා ප්‍රතිසම්බන්ධිත ප්‍රෝටීන් පවිත්‍රකරණය දැනට සිදුවෙමින් පවතී. ආචාර්ය ජගත් වීරසේන විසින් අධීක්ෂණය කරන ලදුව IBMBB හිදී පවත්වනු ලැබූ මේ අධ්‍යයනය විද්‍යා පීඨය හා ඒකාබද්ධ අධ්‍යයනයකි.

(ii) ශ්‍රී ලංකාවේ ලෙප්ටොස්පයිරොසිස් (මී උණ) රෝගයේ ප්‍රතිශක්ති රෝග විනිශ්චය සහ ප්‍රතිශක්ති ව්‍යාධිජනකතාව පිළිබඳ අධ්‍යයන

ලෙප්ටොස්පයිරෝසිස් හෙවත් මී උණ මරණීය රෝගයක් වන අතර රෝගය සනාථ කිරීම සඳහා යෝග්‍ය තාක්ෂණයන් නොමැතිකම නිසා කල්තබා රෝගය හඳුනා ගැනීමට බොහෝ විට අපහසු වේ. ලෙප්ටොස්පයිරෝසිස් රෝගයේ ප්‍රතිශක්ති ව්‍යාධිජනකතා යන්ත්‍රණයන් පිළිබඳ මූලික අධ්‍යයනයන් සිදු කරන ලද අතර ලෙප්ටොස්පයිරෝසිස් රෝගීන් තුළ ඉහළ මස්තු නයිට්‍රයිට් මට්ටම් ඒවායින් නිරීක්ෂණය කරනු ලැබ තිබේ. තවද, බරපතල ලෙස ලෙප්ටොස්පයිරෝසිස් වැළඳී ඇති රෝගීන් තුළ නයිට්‍රයිට් සහ ඔක්සිකාරක ආතති සලකුණුකරණයන් සැලකිය යුතු තරම් ඉහළ මට්ටම්වලින් තිබුණි. කඩිනම් ප්‍රතිශක්ති රෝග විනිශ්චය පරීක්ෂණ (rapid immuno assays) උදා : IgM පාදක ELISA සහ ලෙප්ටොචෙක් - WB) ඇතුළු රෝග විනිශ්චය ක්‍රම කිහිපයක් සසඳා බලන ලදී.

සායනික භාවිතය නිර්දේශ කිරීමට පෙර මේ මූලික ප්‍රතිඵල සනාථ කිරීම සඳහා යෝග්‍ය නියැදි විශාලත්වයක් සහිත වඩා විශාල පරිමාණයේ අධ්‍යයනයක අවශ්‍යතාව අවධාරණය කරන වැදගත් දත්ත පසුව කී අධ්‍යයනයෙන් හෙළි විය.

කොළඹ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයේ සායනික වෛද්‍ය අංශය , කැලණිය විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයේ වෛද්‍ය විද්‍යා අංශය සහ වෛද්‍ය පර්යේෂණ ආයතනයේ අණුක ජෛව විද්‍යා අංශය හා ඒකාබද්ධව IBMBB ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ආචාර්ය ශිරෝමා හඳුන්නෙත්ති විසින් මේ අධ්‍යයනය පවත්වන ලදී. 2011 වසර තුළ මේ කාර්යය කරගෙන යෑම සඳහා IBMBB හි සෛල සහ අණුක ප්‍රතිශක්තිවේදය පිළිබඳ MSc වැඩසටහන විසින් MSc සිසුන් තිදෙනෙකුට අනුග්‍රාහකත්වය ලබා දෙන ලදී.

(ආ) අණුක වෛද්‍ය පර්යේෂණ වැඩසටහන්

මිනිස් හෝ සත්ත්ව පරීක්ෂණය අවශ්‍ය වන ජෛව වෛද්‍ය විද්‍යා පිළිබඳ ව්‍යාපෘති කිහිපයක් ක්‍රියාත්මක කරන ලදී. ඒවාට ඇතුළත් වන්නේ පිළිකා, ගර්භණීභාවය සහ කළල වර්ධනය, ගර්භණීභාවය නිසා ඇතිවන අධි ආතතිය සහ මානව DNA විචල්‍යතාව යනාදිය ය.

(i) පිළිකා ප්‍රවේණි විද්‍යාව

චිකිත්සක වශයෙන් සනාථ වූ පියයුරු පිළිකා රෝගීන්ගෙන් ලබාගන්නා DNA විකෘති විශ්ලේෂණය

බොහෝ පිළිකාවලට ප්‍රවේණිමය වශයෙන් පූර්ව නැඹුරුවක් තිබෙන බව දැන් පිළිගනු ලැබේ. පවුල් වර්ගවල පියයුරු පිළිකා වර්ධනය වීමට BRCA – 1 සහ BRCA-2 යන ප්‍රවේණ්‍යාණු දෙක හේතු වන බව දැන් පිළිගැනේ. සියලු ම වර්ගවල පිළිකා සහ විශේෂයෙන් පියයුරු පිළිකා ප්‍රචලිත වීම ලෝකයේ ම ඉහළ යන ප්‍රවණතාවක් සේ පෙනේ. සමෘධිමත් සමාජයේ රෝගයක් වශයෙන් පිළිකා සලකනු ලැබුව ද එය දැන් වෙනස් වෙමින් තිබෙන අතර මහරගම පිළිකා රෝහලේ විශේෂඥයින් පවසන පරිදි ශ්‍රී ලංකාවේ ද මේ ප්‍රවණතාව ඉහළ යමින් පවතී.

විකෘතතා විශ්ලේෂණය තනිව සලකන කල එය ප්‍රතිකාරකයක්වත් නිවාරණයක්වත් නොවන නමුත්, ජන සංඛ්‍යාවන් අතර විකෘතතා වෙනස් වන බව පෙනෙන හෙයින් එවැනි දත්ත එකතු කිරීම ශ්‍රී ලංකාවේ ජනගහනයට අතිශයින් වැදගත් වේ. ඊට අමතරව, එවැනි විකෘතතාවක් පවතින තැනැත්තියකට, මැමෝග්‍රැෆි වැනි පරීක්ෂණ ක්‍රමානුකූලව කර ගැනීමට ද එය උපකාරි විය හැකිය.

රෝගීන් කිහිප දෙනෙකු තුළ නැවත නැවත ඇති වූ ව්‍යාධිජනක විකෘතිතාවක් ඇතුළුව නව්‍ය විකෘතතා සහ අනුක්‍රමණ විචල්‍යතා කිහිපයක් හඳුනා ගන්නා ලදී. BRCA 1 හි විභව්‍ය විශාල ජෙනෝම වෙනස්වීම් හඳුනා ගැනීම සඳහා ද අධ්‍යයනයන් ආරම්භ කරන ලදී. ඒ හැරුණු විට, MSc ව්‍යාපෘතියක් වශයෙන්, ඩිම්බකෝෂ පිළිකා රෝගීන්ගෙන් BRCA 2 විකෘතතා පරිලෝකනය ආරම්භ කරන ලදී. මේවා ජාතික පිළිකා ආයතනය සමඟ ඒකාබද්ධව කරන ලද අධ්‍යයනයන්ය. එක් පත්‍රිකාවක් ජාත්‍යන්තර සඟරාවක පළ කරන ලද අතර මේ අධ්‍යයනයන් පදනම් කරගෙන එක් පර්යේෂණ සන්නිවේදනයක් සිදු කරන ලදී.

(ii) ප්‍රජනන හා සංවර්ධන ජෛව විද්‍යාව

(අ) අඩු උපත් බර පිළිබඳ ගෙනෝම සහ ප්‍රෝටියෝමික අධ්‍යයනයක්

රුද්ධ රක්තක හෘද රෝග (ischemic heart diseases), මධුමේහය, අධිරක්ත පීඩනය, තරබාරුකම වැනි බෝ නොවන රෝග ජීවිතයේ පසුකාලයේදී පුද්ගලයන්ට ඇතිවීමේ හැකියාවක් අඩු උපත්බර හේතුකොට ගෙන ඇති වේ. ඒ නිසා අඩු උපත්බර ඇතිවීමේ හැකියාවට තුඩු දෙන ප්‍රවේණි විචල්‍යතා දැන ගැනීම වැදගත් වේ. ඉන්සියුලින් වැනි වර්ධක සාධක පද්ධතියේ ප්‍රවේණි විචල්‍යතා හඳුනා ගැනීම සඳහා මහාචාර්ය තෙන්නකෝන් වෙත ප්‍රදානය කරනු ලැබ SAREC සහ ජාතික පර්යේෂණ සභා ප්‍රදානයක උපකාරය ඇතිව, නිරෝගී මවුවරුන් හා අලුත උපන් දරුවන් 200 ක් පිළිබඳ අධ්‍යයනයක් සිදු කරන ලදී. මේ වැඩසටහන යටතේ 2006 දී එක් PhD ව්‍යාපෘතියක් ආරම්භ කරන ලද අතර 2010 දී රසායනාගාර කටයුතු සම්පූර්ණ කරන ලදී. ශ්‍රී ලාංකික පළමු දරු උපත්වලදී අඩු බර හා සම්බන්ධ වන IGF-1 ප්‍රවේණි දර්ශයේ විශේෂිත බුහුරූපතාවක් හඳුනා ගන්නා ලදී. මේ බහුරූපතාවේ එක්තරා ඇලිලියක (allele) පිටපත් එකක් හෝ දෙකක් සහිත පළමුව උපන් දරුවන් උපතේදී අන් අයට වඩා ප්‍රමාණයෙන් කුඩා වූ අතර ඔවුන්ගේ ඉන්සියුලින් වැනි වර්ධක සාධක - 1 හි රජ්ජු රුධිර මට්ටම් ද අඩු මට්ටමක විය. මේ ඇලිලය සහිත මවුවරුන් පළමු ගැබ් ගැනීමේදී බිහි කළේ

ප්‍රමාණයෙන් වඩා කුඩා ළදරුවන් ය. විද්‍යාත්මක සුවිගත සඟරාවක පත්‍රිකාවක් පළ කරන ලදී.

උපතේදී විශාලත්වය සමඟ වෙනත් බහුරූපතාවන් දෙකක (එකක් IGF-11 ප්‍රවේණි අනුවේ සහ අනෙක H19 ප්‍රවේණි අණුවේ) ඇති සම්බන්ධය පිළිබඳ මූලික අධ්‍යයනයක් මව, පියා සහ ළදරුවා යන ත්‍රිත්ව 60 ක් යොදාගෙන සිදු කරන ලද අතර වඩා විශාල උපත්බර සමඟ සම්බන්ධ වන්නක් වශයෙන් මව තුළ ඇති එක් බහුරූපතාවක් හඳුනා ගන්නා ලදී. MPhil අධ්‍යයනයක් වශයෙන් මේ ප්‍රවේණි අණු පිළිබඳ වැඩිදුර අධයයනයන් සිදු වෙමින් පවතී.

ලෙප්ටින් පද්ධතිය ද තක්සේරු කරන ලද අතර අලුත උපන් බිළිඳුන් 110 ක් සම්බන්ධයෙන් උපත් බර මෙන් ම ස්ත්‍රී පුරුෂභාවය සහ සාමාන්‍ය පිළිබඳ විශ්ලේෂණයක් ද සිදු කරන ලදී.

ජාතික පර්යේෂණ සභාව විසින් මේ අධ්‍යයනයන්ට සහාය ලබා දෙන ලද අතර IBMBB හි MSc සිසුන් දෙදෙනකු සඳහා පර්යේෂණ ව්‍යාපෘති ද සපයන ලදී.

වගාකරන ලද අන්තෝමාතෘක ස්ට්‍රෝමල් සෛල කෙරෙහි බැර ලෝහවල ඖෂධකාරක බලපෑම් පිළිබඳ අධ්‍යයනයක්

අන්තෝමාතෘක ප්‍රදානය (endometriosis) ඇතුළු ඊස්ට්‍රජන් මගින් ඇතිවන මානව රෝගවලට හේතුව වශයෙන් පෙනී ගොස් ඇත්තේ ඊස්ට්‍රජනක සංයෝගයන් ඒකරාශී වීම සහිත ශීඝ්‍ර පරිසර දූෂණයයි. ප්‍රජනක වයස් කාණ්ඩයේ 5%-10% දක්වා ඇස්තමේන්තුගත කාන්තාවන් සංඛ්‍යාවක් කෙරෙහි අන්තෝමාතෘක ප්‍රදාහය බලපායි. ඊස්ට්‍රජන් ධාරක ක්‍රියාත්මක කිරීමේ හැකියාව ඇති නිසා කැඩ්මියම් වැනි බැර ලෝහ දැන් හැඳින්වෙන්නේ ලෝහ ඊස්ට්‍රජන් (Metalloestrogens) වශයෙනි. Mcf -7 පියයුරු පිළිකා සෛල මාර්ග යොදා ගනිමින්, බැර ලෝහවල ඖෂධකාරක බලපෑම් කදාව තුළ *(in-vitro)* නිදර්ශනය කර ඇති නමුත්, රෝගය පිළිබඳ සාක්ෂි නොමැති සාමාන්‍ය කාන්තාවක් හා සැසඳීමේදී අන්තෝමාතෘක ප්‍රදාහය ඇති කාන්තාවන්ගේ අන්තෝමාතෘක සෛල කෙරෙහි බැර ලෝහවල ඖෂධ කාරක බලපෑම් විස්තර කරන කවර හෝ පරීක්ෂණයක් ගැන ප්‍රකාශයට පත් කරන ලද වාර්තා නැත. මේ ව්‍යාපෘතියේ පරමාර්ථය වන්නේ මේ කණ්ඩායම් දෙකේ ම eutopic අන්තෝමාතෘකයෙන් වෙන් කරන ලද වගා කරන ලද අන්තෝමාතෘක ස්ට්‍රෝමල් සෛල කෙරෙහි බැර ලෝහවල ඖෂධකාරක බලපෑම් අධ්‍යයනය කිරීමයි. කැඩ්මියම්, නිකල් සහ ඊයම් යන බැර

ලෝහවල ඔසප්කාරක බලපෑම් පැහැදිලි කිරීම සඳහා විවිධ පර්යේෂණවලදී එකී රෝපණයන් (unltures) භාවිත කරනු ලැබ ඇත.

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් සහ ශ්‍රී ලංකා ප්‍රජනන සෞඛ්‍ය පර්යේෂණ ජාතික සම්බන්ධීකරණ කමිටුවෙන් PhD ශිෂ්‍යයෙකුට (ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ පරිවාස කථිකාචාර්යවරයකු) ලැබුණු පර්යේෂණ ප්‍රදානයක් මගින් මේ ව්‍යාපෘතියට ආධාර සපයනු ලැබේ. අධ්‍යයනය අධීක්ෂණය කරනු ලබන්නේ මහාචාර්ය කේ. තෙන්නකෝන් (IBMBB), මහාචාර්ය හේමන්ත සේනානායක (වෛද්‍ය පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය සහ මහාචාර්ය රෝෂිණී ජෝන් පීරිස් (ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය) විසිනි. 2012 මාර්තු 7-10 දක්වා ඉතාලියේ ප්ලොරන්ස්හිදී පැවැත්වීමට නියමිත නාරිවේද අන්තෝසර්ග විද්‍යාව පිළිබඳ 15 වැනි ලෝක සමුළුවේදී 34ට පහළ තරගයේ හොඳ ම උද්ධෘත 100 අතරට මේ මූලික අධ්‍යයනයේ ප්‍රතිඵල අඩංගු උද්ධෘතයක් තෝරා ගන්නා ලදී.

(iii) මානව DNA විචල්‍යතාව

සියලුම මානවයන් 99.9% ක් ම සියලු ආකාරයෙන් ම සමාන වුවත්, ඔවුන් අතර පවත්නා වෙනස්කම් පුද්ගලයන්ගේ ප්‍රවේණි අනන්‍යතාව සඳහා මෙවලම් සපයයි. ලබා ගැනීමට තිබෙන ද්‍රව්‍ය ඉතා සීමාසහිත වන විට හෝ නැතහොත් ගුණාත්මකභාවයෙන් අඩු වන විට භාවිත කරනු ලබන සමහර ක්‍රම යෝග්‍ය නොවන අතර එබඳු අවස්ථාවලදී මයිටෝකොන්ඩ්‍රියල් DNA විශ්ලේෂණය ප්‍රයෝජනවත් බව සනාථ වී තිබේ. ශ්‍රී ලාංකිකයන්ගේ මයිටෝකොන්ඩ්‍රියල් D loop අනුක්‍රමණයන්ගේ දත්ත සමුදායක් පිහිටුවීම පිණිස ප්‍රධාන ජනවාර්ගික කණ්ඩායම්වලට අයත් ශ්‍රී ලාංකිකයින් රාශියක ම HV I සහ HV II ප්‍රවේණි අණු අධ්‍යයනයට ලක් කරන ලදී. ඒක දර්ශයන් (haplotypes) 137 ක් හඳුනා ගන්නා ලද අතර ඒවායින් 12 ක් විවිධ ජනවාර්ගික කණ්ඩායම්වල පුද්ගලයින් ස්වල්ප දෙනෙකු අතර හෝ පොදු මවු පාර්ශව පරම්පරාවක් ඇති එකම ජනවාර්ගික කණ්ඩායමක පුද්ගලයින් ස්වල්ප දෙනෙකු අතර බෙදන ලදී. විශේෂිත ඒක දර්ශ කණ්ඩායම්වලට (haplogroups) පුද්ගලයින් වෙන් කිරීම සඳහා haplogroup විශ්ලේෂණයක් ආරම්භ කරන ලදී. මහාචාර්ය කමනී තෙන්නකෝන් වෙත ජාතික පර්යේෂණ සභාවෙන් ලැබෙන අරමුදල්වලින් දැනට ක්‍රියාත්මක වන මේ ව්‍යාපෘතිය එක් PhD සිසුවකුට සහ එක් MSc සිසුවකුට සහාය වේ.

(iv) අඩු උස ප්‍රමාණය පිළිබඳ අණුක අධ්‍යයනයන්

වර්ධක හෝමෝන (GH) ප්‍රවේණි අණුවල මෙන් ම වර්ධන හෝමෝන අක්ෂයේ (axix) අනෙකුත් ප්‍රවේණි අණුවල විකෘතතා උස ප්‍රමාණය අඩුවීමට හේතු වේ. වර්ධක හෝමෝන ඌනතාවෙන් පෙළෙන ළමයින්ට ප්‍රමාණවත් ශාරීරික වර්ධනයක් ඇති කර ගැනීම සඳහා ප්‍රතිසම්බන්ධක (recombineant) වර්ධක හෝමෝන මගින් ප්‍රතිකාර කළ හැකිය. වර්ධක හෝමෝන අක්ෂයේ විකෘතතා ශ්‍රී ලංකාවේදී අධ්‍යයනයට ලක් වී නැත. වර්ධක හෝමෝන ඌනතාවෙන් පෙළෙන බවට සායනික වශයෙන් සහ ජෛව රසායනික වශයෙන් සනාථ කරන ලද ළමයින් කණ්ඩායමක වර්ධක හෝමෝන සහ වර්ධක හෝමෝන මුදාහරින හෝමෝන් ධාරකයේ විකෘතතා සහ අනුක්‍රමණ විචල්‍යතා හඳුනා ගැනීම සඳහා රිජ්වේ ආර්යා ළමා රෝහල සමඟ ඒකාබද්ධව අධ්‍යයනයක් සිදු කරන ලදී. මූලික කටයුතු කරන ලද්දේ IBMBB සහාය ලත් MSc සිසුන් දෙදෙනකු විසිනි. ඉන් පසුව, ජාතික විද්‍යා පදනමෙන් අරමුදල් ලබාගෙන දැනට කාර්යය සිදු වෙමින් පවතී.

(ඈ.) ශාක අණුක ජෛව විද්‍යා පර්යේෂණ වැඩසටහන්

(i) AFLP සලකුණුකරණයන් යොදා ගනිමින් ශ්‍රී ලංකාවේ සාම්ප්‍රදායික සහල් වර්ගවල අණුක විභේදනය

ශ්‍රී ලංකාවේ සහල් නිෂ්පාදනය පසුගිය තිස් වසර තුළ ඉහළ ගොස් තිබේ. ඊට ප්‍රධාන වශයෙන් ම හේතු වී ඇත්තේ නව සහල් විශේෂ වැඩි දියුණු කිරිම සඳහා සහල් අභිජනනය කරන්නන් දරා ඇති ප්‍රයත්නයය. දැනට ශ්‍රී ලංකාවේ වගා කරනු ලබන සහල් විශේෂ වැඩි සංඛ්‍යාවක්ම අයත් වන්නේ විදේශීය සහල් විශේෂ උපයෝගී කර ගෙන වැඩි දියුණු කරන ලද, නව වැඩි දියුණු කරන ලද විශේෂයන්ටය (NIV). එවැනි නව විශේෂවලින් වැඩි අස්වනු ලැබුණත්, ශ්‍රී ලංකාවේ සාම්ප්‍රදායික සහල් විශේෂවලට අපනයන වෙළෙඳපොළේ ඉහළ යන ඉල්ලුමක් තිබේ. ඊට හේතුව ඉහළ තන්තු සංයුතිය වැනි සහල් ඇටයේ ඇති ගුණාත්මකභාවයන්ය. එබැවින්, නව විශේෂ වැඩි දියුණු කිරීමේදී ශාක අභිජනනය කරන්නන්ට මේ සාම්ප්‍රදායික විශේෂවල ප්‍රවේණි විවිධත්ව විශ්ලේෂණය ඵලදායී වනු ඇත. මේ සහල් විශේෂවල ප්‍රවේණි විචල්‍යතාව සහ

ප්‍රවේණි ජනක ජීව සහ අජීව ප්‍රතිරෝධය තක්සේරු කිරීම සඳහා දැනට භාවිත වන්නේ ප්‍රතිදීප්ත ගුණිත ඛණ්ඩවල දිග බහුරූපතා සලකුණුකරණයන් (AFLP) සහ රෝග ප්‍රතිරෝධක ජාන ප්‍රතිසම සලකුණුකාරකයන්ය (gene analog markers). යාපනය විශ්වවිද්‍යාලයේ උද්භිද විද්‍යා දෙපාර්තමේන්තුවේ පරිවාස කථිකාචාර්යවරයකු වන PhD ශිෂ්‍යයකු විසින් මේ කාර්යය සිදු කරන ලදී. IBMBB හි ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ආචාර්ය ජගත් වීරසේන මහතා විසින් පර්යේෂණ අධීක්ෂණය කරනු ලබන අතර ඔහුට ලබා දී ඇති ජාතික පර්යේෂණ සභා ප්‍රදානයකින් ඊට සහාය ලැබේ.

ඊට අමතරව සහල් අණුක ජෛව විද්‍යාව සම්බන්ධයෙන් MSc සිසුහු දෙදෙනෙක් කටයුතු කළහ. සාම්ප්‍රදායික විශේෂයක් වන 'සුවදැල්' හාල්වල සුවඳේ අණුක පදනම හඳුනා ගැනීම මේ අධ්‍යයනවලින් එකක අරමුණ වූ අතර වයඹ විශ්වවිද්‍යාලයේ ආචාර්ය නිශා කෝට්ටෙආරච්චි සමඟ සහයෝගී අධයයනයක් වශයෙන් එය සිදු කරන ලදී. අනෙක් අධ්‍යයනයේ අරමුණ වූයේ ශාක මර්දන ප්‍රතිරෝධය සහ ඔරොත්තු දෙන සහල් වර්ග හඳුනා ගැනීම සඳහා අණුක සලකුණුකරණයන් වැඩි දියුණු කිරීමේ හැකියාව සොයා බැලීමය. විශ්වවිද්‍යාලයේ ආචාර්ය එස්. වීරකෝන් සමඟ සහයෝගිතා අධ්‍යයනයක් වශයෙන් මේ අධ්‍යයනය කරන ලදී. MSc ව්‍යාපෘති දෙකේ ම සම අධීක්ෂණය ආචාර්ය ජගත් වීරසේන විසින් සිදු කරන ලදී.

(ii) ශ්‍රී ලංකාවේ තේ ශාක විශේෂයන්හි *(Camellia sinensis* L) අණුක ලක්ෂණ විශ්ලේෂණය

තේ අභිජනනය කරන්නන්ගේ එකතුවේ ඇති ප්‍රවේණි විවිධත්ව රටාව ගැන ඇත්තේ ඉතා ම අඩු දැනුමක් වුවත් ගුණාත්මකභාවය සහ වර්ධන ගති ලක්ෂණ වැඩි දියුණු කිරීම ඉලක්ක කරගත් තේ අභිජනන වැඩසටහන ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනයේ ක්‍රියාත්මක වෙමින් පවතී. එබැවින්, මේ වැදගත් අපනයන වැවිලි බෝගයේ තිරසාර පැවැත්ම සහ වැඩි ඵලදායකත්වය උදෙසා ඵලදායී සංරක්ෂණය මෙන් ම තේවල ප්‍රවේණි සම්පත් භාවිතය අත්‍යවශ්‍යය. තේ පර්යේෂණ ආයතනයේ කණිෂ්ඨ විද්‍යාඥයකු වන එක් දර්ශනසූරි (PhD) ශිෂ්‍යයෙක් තේ සම්බන්ධ ප්‍රවේණි අධ්‍යයනයන්හි නියැළී සිය ආචාර්ය උපාධි පරීක්ෂණය සම්පූර්ණ කළේය.

(iii) තේ නටු පිළිකා රෝගයේ කාරණ රූප කාරකය වන *Macrophoma theicola* Petch හි DNA වංශ ප්‍රවේණිය, රූපවිද්‍යා ව්‍යාධිජනකතාව

Macrophoma theicola petch ඇස්කොමයිසීට් විසින් සිදු කරනු ලබන පහතරට නටු පිළිකාව ශ්‍රී ලංකාවේ පහළ උන්නතාංශවල සිදු වන ඉතා ම බරපතළ *Camellia sinensis* L (තේ) නටු රෝගය වේ. එය ශාඛා පිළිකාව ඇති කිරීමට හෝ ළා අංකුර විනාශ කිරීමට හේතු වන අතර දරුණු අවස්ථාවලදී, කඳවටා පොත්ත ඇරීමෙන් පසු මුළු තේ පඳුර ම විනාශ කර දමයි. මේ අධ්‍යයනයේ අරමුණු වන්නේ ශ්‍රී ලංකාවේ විවිධ ස්ථානවලින් ලබා ගන්නා *M. theicola* ඒකලනයන් (isolates) සැසඳීම සඳහා අණුක ක්‍රම සහ රූපවේදීය ලක්ෂණ භාවිත කිරීමත් *M. theicola* ආසාදනයට ප්‍රතිචාර වශයෙන් Camellia sinensis ප්‍රේරිත ප්‍රවේණි අණු හඳුනා ගැනීමත්ය. රූපවේදීය ලක්ෂණ පදනම් කරගෙන *M. theicola* වශයෙන් හඳුනා ගන්නා ලද දිලීර ඒකලන (isolates) 40 ක් සමීක්ෂණයෙන් හඳුනා ගන්නා ලදී. කෙසේ වුව ද, අණුක ලක්ෂණ විභාගයෙන් අනාවරණය වූයේ මේ *Lassiodiplodia theobroma* සමහරක් හා ඒකලනවල ව්‍යාධිජනකතාව නිරෝගී තේ පැළවල ස්ථාපිතව ඇති බවය. එසේ ම වැදගත් ලක්ෂණයක් වන්නේ අනුක්‍රමණ පාදක විශ්ලේෂණයේ හේතුකාරක සාධකය වශයෙන්, දෙහිඕවිටින් ලැබුණු පිළිකා නියැදි වලින් *Fusarium solani* අඛණ්ඩව ලැබුණු බවය. ශ්‍රී ලංකාවේ තේ නටු පිළිකා කාරක සාධකය වශයෙන් *Fusarium solani* පිළිබඳ පළමු වාර්තාව මෙයයි.

MPhil උපාධියක් සඳහා ලියාපදිංචි වී ඇති තේ පර්යේෂණ ආයතනයේ කණිෂ්ඨ විද්‍යාඥයෙක් මේ ව්‍යාපෘතිය සම්බන්ධ කටයුතුවල නියැළී සිටී.

(iv) AFLP සලකුණුකරණයන් භාවිත කරමින් ශ්‍රී ලංකාවේ අබ *(Brassica juncea)* විශේෂයන් විභේදනය කිරීම සහ *Brassica napus* (කැනෝලා) සමඟ අන්තර් විශේෂිත දෙමුහුම් කිරීම මගින් ඒවායේ මේද අම්ල පැතිකඩ විභේදනය කිරීම.

අබ *(Brassica juncea)* යනු ඉන්දියා උප මහාද්වීපයේ ප්‍රමුඛ cruciferous (සාර්ෂප) විශේෂය වන Brassica ගණයේ ඉතා ම වැදගත් විශේෂයයි. අබ බෝගයක් වශයෙන් වසර සිය ගණනක් වගා කරනු ලැබ ඇති අතර ශ්‍රී ලංකාවේ ආහාර පිසීමේදී ඒ ඇට බහුල වශයෙන් භාවිත කරනු ලැබේ. එසේ වුව ද, මිනිස්

සෞඛ්‍යයට අහිතකර සහ හෘද රෝගවලට හේතුකාරක වන එරුසික් අම්ලය වැනි ඉහළ මට්ටමේ මේද අම්ල අබවල ඉහළ මට්ටමෙන් තිබේ. ඊට ළඟින් ම සම්බන්ධ වන විශේෂයක් වන *Brassica napus* (කැනෝලා) වල මේද අම්ල පැතිකඩ, හෘද රෝගවලින් ආරක්ෂා වීමට වඩා හිතකරය. මේ ව්‍යාපෘතියේ අරමුණ වන්නේ අණුක සලකුණුකරණයන් භාවිත කරමින් ශ්‍රී ලංකාවේ අබ විශේෂයන් *(Brassica juncea)* විභේදනය කිරීමය. අබවල මේද අම්ල පැතිකඩ වැඩි දියුණු කිරීමේ ඉලක්කය ඇතිව *Brassica napus* සමඟ අන්තර් විශේෂිත දෙමුහුම් සිදුකිරීමට ද ප්‍රයත්න දැරෙමින් පවතී. පරීක්ෂා කරන ලද අබවල සහ කැනෝලා අනුක්‍රමණවල සැලකිය යුතු බහු සමරූපිතාවක් ඇති බව විස්තාරණය කරන ලද fragment length බහුරූපතාවෙන් පෙන්නුම් කරනු ලැබිණ. අනුක්‍රමයන් අතර ඇති සමරූපිතා වෙනස්කම් වාර්තා කිරීම සඳහා ශෂ්‍ය විද්‍යාත්මක ලක්ෂණ තක්සේරු කරන ලදී. ශාක රෝගකාරක දිලීර කිහිපයක් සම්බන්ධයෙන් අබ විශේෂවල ශාක සාරවල ප්‍රතිදිලීර ක්‍රියාකාරකම් පරීක්ෂණයට භාජන කරන ලදී.

ජාතික විද්‍යා පදනමේ සහාය ලබන මේ ව්‍යාපාතිය IBMBB (සම පරීක්ෂක ආචාර්ය ජගත් වීරසේන) සහ විවෘත විශ්වවිද්‍යාලය (ආචාර්ය එස්. ආර්. වීරකෝන් මිය) අතර ඒකාබද්ධ අධ්‍යයනයකි. මේ ව්‍යාපෘතියේ සහාය එක් MPhil ශිෂ්‍යයෙක් පරීක්ෂණය සඳහා නිබන්ධනය ඉදිරිපත් කර ඇත.

(v) *Bacillus thuringiensis* මගින් කෘෂිකාර්මික පළිබෝධයන් ජෛව විද්‍යාත්මකව පාලනය කිරීම.

තිරසාර කෘෂිකර්මය සම්බන්ධයෙන් ඵලදායී පළිබෝධ පාලනය සඳහා අණුක පළිබෝධ නාශක වැඩි දියුණු කිරීම රටේ මූලික අභියෝගයක් මෙන් ම ප්‍රමුඛතාවක් ද වේ. ක්‍රියාකාරී සංරචකයක් වශයෙන් Bt ශ්‍රී ලාංකික පාරිසරික ඒකලනයන් භාවිත කරමින් කෘෂිබෝග සම්බන්ධයෙන් වන මූලික ලෙපිඩොප්ටෙරාන්, කොලියොප්ටෙරාන් සහ ඩිප්ටෙරාන් යන පළිබෝධයන්ට එරෙහිව භාවිත කළ හැකි ජෛව විද්‍යාත්මක පළිබෝධ නාශක වැඩි දියුණු කිරීම මේ පර්යේෂණ ව්‍යාපෘතියේ අරමුණ වේ.

පර්යේෂණයේ අරමුණු වන්නේ එළවලු, පළතුරු, සහල් සහ තේ පළිබෝධයන්ට එරෙහිව ශ්‍රී ලාංකික Bt ඒකලනයන්හි පළිබෝධ ක්‍රියාකාරීත්වය නිගමනය කිරීමත්, Bt වලින් අණුක පළිබෝධනාශක වැඩි දියුණු කිරීමත්, Bt වලින් ධූලක (toxins) වෙන් කිරීම සහ ලක්ෂණ විභාග කිරීම සහ අණුක පළිබෝධනාශක සම්බන්ධයෙන් තත්ත්ව සහතික ක්‍රියාමාර්ග වැඩි දියුණු කිරීමත් ය. PCR පදනම් කරගත් Cry ජීවාණු හඳුනාගැනීම මගින් Bt විශේෂවල ලක්ෂණ විභාග කිරීම සිදු කරන ලදී. 16s rRNA සහ gyrb අනුක්‍රමණය මගින් Bti සහ Btk අණුක සනාථ කිරීම දැනට සිදුවෙමින් පවතී.

මෙය IBMBB සහ (සම පරීක්ෂක : ආචාර්ය ජගත් වීරසේන) කොළඹ, කාර්මික තාක්ෂණ ආයතනය (PI ආචාර්ය ආර්. සමරසේකර) අතර සහයෝගිතා අධ්‍යයනයක් වන අතර ශ්‍රී ලංකා ජාතික විද්‍යා සභාවෙන් සහ ජාතික පර්යේෂණ සභාවෙන් ඊට උපකාර ලැබේ. මේ ව්‍යාපෘතියෙන් සහාය ලැබූ එක් PhD ශිෂ්‍යයෙක් පරීක්ෂණය සම්පූර්ණ කළේය.

(ඇ) ඖෂධීය ශාක පිළිබඳ පර්යේෂණ

(i) ප්‍රතිප්‍රදාහක සහ ප්‍රතිශක්ති අනුකූලතා (immunomodulatoy) බලපෑම් සහිත ඖෂධීය ශාක පිළිබඳ පර්යේෂණ

මේ අධ්‍යයනයන්හි අවධානය යොමු වූයේ ප්‍රදාහක ප්‍රතිචාර හා සම්බන්ධ හෝ ඒවා මගින් සිදු වූ හෝ ප්‍රතිශක්ති අනුකූලතා වශයෙන් භාවිත කරනු ලබන ප්‍රතිචාර හා සම්බන්ධ රෝගවලට ප්‍රතිකාර කිරීමේදී භාවිත කරනු ලබන ඖෂධීය ශාක පිළිබඳවය.

(අ) *Wallidda antidysentrica (Wrightia antidysenterica)* L ජලීය ශාක නිෂ්කර්ෂකයේ (APE) ප්‍රතිප්‍රදාහක ක්‍රියාකාරීත්වය මීයන් තුළ සිදු වන ආකාරය

Wallidda antidysenterica යනු ටොන්සිල් ප්‍රදාහය (tonsillitis), අපිජිහ්විකා ප්‍රදාහය (epiglottis) සහ සර්ප දෂ්ටය වැනි ප්‍රදාහකාරක තත්ත්වයන් ඇතුළු බොහෝ රෝගවලදී කරනු ලබන සාම්ප්‍රදායික ප්‍රතිකාරවලදී භාවිත වන ශ්‍රී ලංකාවට ආවේණික ශාකයකි. මී පාද edema භාවිත කරමින් ප්‍රතිප්‍රදාහ

ක්‍රියාකාරීත්වය පරීක්ෂා කරන ලද අතර ක්‍රියාකාරීත්වය සනාථ කරන ලදුව විද්‍යාත්මකව වලංගු කරන ලදී. සෛල සංවරණය සීමාකිරීම, ප්‍රතික්‍රියාකාරක නයිට්‍රජන් විශේෂ නිෂ්පාදනය සහ free radical scavenging වැනි ප්‍රතිප්‍රදාහක යන්ත්‍රණයන් ආදර්ශනය කරන ලදී. *Wallidda antidysenterica* ජලීය ශාක නිෂ්කර්ෂකයේ (APE) අර්ධ උග්‍ර ධූලකතාවක් (sub - acute toxicity) සහ neurotoxic බලපෑම් නැති බව ද අපේ අධ්‍යයනවලින් පැහැදිලි විය.

කොළඹ විශ්වවිද්‍යාලයේ සත්ත්ව විද්‍යා දෙපාර්තමේන්තුව සහ කාර්මික තාක්ෂණ ආයතනයේ ශාක තාක්ෂණ අංශයේ සහභාගිත්වය ඇතිව IBMBB ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ආචාර්ය ශිරෝමා හඳුන්නෙත්ති විසින් මේ අධ්‍යයනය මෙහෙයවන ලදී. ඒ සඳහා IBMBB හි සෛල සහ අණුක ප්‍රතිශක්තිවේද MSc වැඩසටහන විසින් එක් MSc ශිෂ්‍යයකුට උපකාර කරන ලදී.

(ආ) *Coriandrum Sativum* L. (කොත්තමල්ලි) සහ *Coscinium Fenesratum* L. (වෙනිවැල්ගැට) උණු ජල නිෂ්කර්ෂකයක ප්‍රතිශක්ති අනුකූලතා ක්‍රියාකාරීත්වය මීයන් තුළ සිදු වන ආකාරය

මේ ඖෂධීය ශාක දෙක සම්බන්ධ ජෛව ක්‍රියාකාරකම් රාශියක් පෙනී ගොස් ඇති අතර අපේ අධ්‍යයනයේ අවධානය යොමු වූයේ සෙම්ප්‍රතිශ්‍යාව, කැස්ස, සිරුරේ වේදනාව සහ කැක්කුම් යනාදියට ගෘහස්ථ ප්‍රතිකාරයක් වශයෙන් පොදුවේ භාවිතා කරනු ලබන *Coriandum Sativum* සහ *Soscinium fenestratum* ඒකාබද්ධ උණුජල නිෂ්කර්ෂකයේ (Combined Water Extract) ප්‍රතිශක්ති අනුකූලතා බලපෑම් පෙන්වා දීමය. මීයන්ගේ පාද ඉදිමුම මගින් පාදක කරගත් පරීක්ෂණ මගින් CWE වල ප්‍රතිප්‍රදාහ බලපෑම් පැහැදිලි විය. ඒකාබද්ධ නිෂ්කර්ෂකය මානව ප්‍රතිශක්ති පද්ධතියේ ආවේණික මෙන්ම විශේෂිත ප්‍රතිචාර කෙරෙහි සැලකිය යුතු බලපෑම් පෙන්වමින් විශේෂිත ප්‍රතිදේහජනකවලට එරෙහිව ප්‍රතිශක්ති සෛල සංවරණය සහ ප්‍රතිදේහ නිෂ්පාදනය වැඩිවීමෙන් එහි ප්‍රතිශක්ති අනුකූලතා බලපෑම් ඇතිවන බව නිරීක්ෂණය කළ හැකි විය.

කොළඹ විශ්වවිද්‍යාලයේ විද්‍යා පීඨයේ සත්ව විද්‍යා දෙපාර්තමේන්තුවේ සහ කාර්මික තාක්ෂණ ආයතනයේ ශාක තාක්ෂණ අංශයේ සහභාගීත්වය ඇතිව IBMBB හි ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ආචාර්ය ශිරෝමා හඳුන්නෙත්ති මහත්මිය

විසින් මේ අධ්‍යයනය මෙහෙයවන ලදී. එය සිදු කිරීම සඳහා IBMBB හි සෛල සහ අණුක ප්‍රතිශක්තිවේද MSc වැඩසටහන විසින් එක් MSc සිසුවකුට උපකාර කරන ලදී.

(ඈ) *Pleurotus ostreatus, Aegle marmalos* සහ *Munronia Pinnata* **ශාකවල ප්‍රතිප්‍රදාහ යන්ත්‍රණයන් පිළිබඳ අධ්‍යයනයන්**

මේ ශාක තුන පිළිබඳ සජීවස්ථ *(in vivo)* අධ්‍යයනයන් සහ ඒවායේ නාලස්ථ යන්ත්‍රණයන් සිදු කරන ලද මේ ශාක 3ම විභව්‍ය ප්‍රතිප්‍රදාහ ක්‍රියාකාරීත්වයන් ප්‍රදර්ශනය කළේය. වැඩිදුර නාලස්ථ අධ්‍යයනයන් සිදු වෙමින් පවතී.

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ වෛද්‍ය විද්‍යා පීඨයේ ජෛව රසායනවේදී දෙපාර්තමේන්තුවේ සහයෝගීත්වය ඇතිව IBMBB හි ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ආචාර්ය ශිරෝමා හඳුන්නෙත්ති විසින් මේ අධ්‍යයනය මෙහෙයවන ලදී. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සහ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ප්‍රදානයන් මගින් ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ උපාධිධාරී අධ්‍යයන පීඨයේ එක් PhD සිසුවෙකුට සහ MPhil සිසුන් දෙදෙනකුට අනුග්‍රාහකත්වය ලබාදෙනු ලැබේ.

(ii) ඖෂධීය ශාකවල මැලේරියා මර්දන බලපෑම් :

මේ අධ්‍යයනයේ අවධානය යොමු වූයේ ශ්‍රී ලංකාවේ මැලේරියා ප්‍රතිකාරයේදී භාවිත වන ඖෂධීය ශාක 5 ක් එනම්, *Anisomeles indica, Andrographis paniculata, Caesalpinia bonduc, Toddalia asiatica* සහ *Vitex negundo* යන ශාක කෙරෙහිය. මැලේරියා ප්‍රතිකාරය උපාය මාර්ග 2 ක් මත පදනම් විය හැකිය. එනම් : ප්‍රතිපරපෝෂිත චිකිත්සාව හෝ රෝගවලට ප්‍රතිවිරෝධී චිකිත්සාව නැතහොත් ඒ දෙක ම වේ. ඖෂධීය ශාක 5 න් *A. paniculata, T. asiatica* සහ *V. negundo* යන ශාක බෙහෙවින් ප්‍රබල ප්‍රතිපරපෝෂිත බලපෑම් (Schizontizidal) ප්‍රදර්ශනය කළ අතර *A. indica* සහ *C. bonduc* ඊළඟට විය. නාලස්ථව වගා කරන ලද ප්ලැස්මෝඩියම් ෆැල්සිපාරුම් පරපෝෂිතයන් යොදා ගෙන මේ අධ්‍යයනයන් කරන ලදී. සායනික රෝග සහ රෝග ලක්ෂණවල තීව්‍රතාව සීමාකිරීමේ හැකියාව පිළිබිඹු කරමින් ශාක පහේම නිෂ්කර්ෂකයන් සතුව සැලකිය යුතු nitric oxide (NO) නිෂේධක ක්‍රියාකාරීත්වයක් තිබෙන බව

අපි කලින් පෙන්වා දී ඇත්තෙමු. *T. asiatica* සහ *A. Paniculata* ඉහළ ම පූර්ව ප්‍රදාහ සයිටොකයින් ශ්‍රාව වැළැක්වීම පෙන්වූ අතර *C. Bonduc* ශාකය ඉතා අඩු සයිටොකයින් වැළැක්වීමේ ක්‍රියාකාරීත්වයක් පෙන්වීය. මේ ප්‍රතිඵලවලින් පෙනෙන්නේ මැලේරියා පරපෝෂිතයා (ප්‍රතිපරපෝෂිත ක්‍රියාකාරීත්වය) සහ ධාරක ප්‍රතිශක්ත සෛල කාර්යයන් (රෝග මර්දන ; මැලේරියා රෝග ලක්ෂණ ඇති කරන ප්‍රතිප්‍රදාහ මාධ්‍යකයන් වැළැක්වීම) කෙරෙහි ඒ ශාකවල ඇති ඒකාබද්ධ ක්‍රියාකාරීත්වය ඒවායේ මැලේරියා මර්දක බලපෑම්වලට හේතු වන බවය. පරපෝෂිත භාරය (load), මැලේරියා රෝග ලක්ෂණ සහ බරපතල රෝග වර්ධනය අඩු කිරීමට ඉවහල් වන මැලේරියා ප්‍රතිකාරයේදී මේ ඖෂධීය ශාකවල සාම්ප්‍රදායික භාවිතයට මේ අධ්‍යයනවලින් සහාය ලැබේ.

ජාතික පර්යේෂණ සභාව විසින් සහාය දෙන ලද මේ අධ්‍යයනය මෙහෙයවන ලද්දේ කොළඹ විශ්වවිද්‍යාලයේ විද්‍යා පීඨයේ සත්ව විද්‍යා සහ රසායන විද්‍යා දෙපාර්තමේන්තුවේ සහයෝගිත්වය ඇතිව IBMBB හි ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ආචාර්ය ශිරෝමා හඳුන්නෙත්ති විසිනි. IBMBB හි MSc සිසුහු දෙදෙනෙක් පර්යේෂණ කාර්යය ඉටු කළහ.

ඖෂධීය ශාකවල පිළිකා මර්දන බලපෑම්

කලින් කැලණිය විශ්වවිද්‍යාලයේ සේවය කළ දැනට IBMBB හි බාහිර මහාචාර්යවරියක වන සම්මානිත මහාචාර්ය අයිරා තාබෲගේ සහයෝගීත්වය ඇතිව, ඖෂධීය ශාකවල ඇති පිළිකා මර්දන බලපෑම් අධ්‍යයනය සිදුවෙමින් පවතී. සිය ආචාර්ය උපාධි අධ්‍යයනයන්හි කොටසක් වශයෙන් සත්ව මාදිලියක තෝරා ගන්නා ලද ප්‍රවේණි අණු ප්‍රකාශනය කෙරෙහි ශාක කසායක බලපෑම IBMBB හිදී අධ්‍යයනය කළ කැලණිය විශ්වවිද්‍යාලයේ ජෛව රසායන හා සායනික රසායන විද්‍යා දෙපාර්තමේන්තුවේ පරිවාස කාර්ය මණ්ඩල සාමාජිකයෙක් 2011 දී පරීක්ෂණය සඳහා ආචාර්ය උපාධි නිබන්ධනය ඉදිරිපත් කළේය.

හේතුකාරක වන අණුක යන්ත්‍රණයන් තක්සේරු කිරීම සඳහා Hep G2 සෛලවල ප්‍රති apoptic සහ හිතකර apoptic ප්‍රවේණි අණු ප්‍රකාශනය පරීක්ෂා කිරීමේ නාලස්ථ අධ්‍යයනයන් ද සිදු කරන ලදී. *Nigella sativa* බීජ, *Hemidesmus indicus* මුල් සහ *Smilax glabra* රයිසෝම යන ඒවා සම ප්‍රමාණවලට ඇතුළත් වන මිශ්‍රණයක විභාජනය සිදු කරන ලදී. HepG2 සෛලවල සක්‍රීය භාගය

(active fraction) මගින් සිදු වන ප්‍රතිප්‍රගුණන බලපෑම් (anti - proliferative effects), සෛල චක්‍ර නැවැත්වීම (arrest) සහ ඇපොප්ටෝසිස් උත්පාදනය (induction of apoptosis) IBMBB රසායනාගාරවලදී තක්සේරු කරන ලදී. සක්‍රීය භාගයේ (fraction) ක්‍රියාකාරී සංයෝග ඒකලනය (isolation) සිදු කරන ලද්දේ HPLC සහ අනෙකුත් ක්‍රොමටොග්‍රැෆික් ශිල්පක්‍රම මගිනි. පකිස්තානයේ කරච්චි විශ්වවිද්‍යාලයේ රසායන විද්‍යා HEJ ආයතනයේ සහභාගිත්වය ඇතිව ඒකලිත සක්‍රීය සංයෝගවල වැඩිදුර වර්ණාවලීක්ෂ විශ්ලේෂණය (spectroscopic analysis) සිදු කරන ලදී. මේ කාර්යය සමන්විත වන්නේ IBMBB හි PhD අධ්‍යයනයකිනි. 2011 ඔක්තෝබර් මාසයේදී උතුරු ඇමෙරිකානු ISSX රැස්වීමේදී පර්යේෂණ ප්‍රතිඵල ඉදිරිපත් කිරීම සඳහා වන එක් අන්තර්ජාතික සංචාරක ප්‍රදානයක් Xenobiotics අධ්‍යයනය පිළිබඳ අන්තර්ජාතික සංගමයෙන් PhD ශිෂ්‍යයා වෙත ලැබුණි. අන්තර් ජාතික සමුළුවලදී 2 ක් සහ දේශීය සම්මන්ත්‍රණවලදී 4 ක් වශයෙන් පත්‍රිකා 6 ක් ඉදිරිපත් කරන ලදී. එක් පත්‍රිකාවක් ප්‍රකාශයට පත් කරන ලද අතර තවත් එකක් මුද්‍රණයේ ද, තවත් පත්‍රිකා 2 ක් අන්තර්ජාතික සඟරාවල සමාලෝචනයට භාජන වෙමින් ද පවතී.

ඉහත දක්වන ලද PhD අධ්‍යයනයන් 2 ට අමතරව, පිළිකා මර්දන ක්‍රියාකාරීත්වය ඇතැයි සැලකෙන තවත් ඖෂධීය ශාකයන් පිළිබඳ මූලික පරීක්ෂණ කටයුතු ද සිදු කරන ලදී. MSc සිසුන් දෙදෙනකු මේ ශාක නිෂ්කර්ෂකය සම්බන්ධයෙන් කටයුතු කළ අතර අන්තෝමාතෘක කාසිනෝමා සෛල line (AN3CA) කෙරෙහි එහි ඇති ප්‍රතිපිළිකාකාරක බලපෑම් තක්සේරු කරන ලදී. අන්තර්ජාතික සමුළුවකදී එක් පත්‍රිකාවක් ඉදිරිපත් කරන ලද අතර සමාලෝචන සඟරාවකට ඉදිරිපත් කිරීම සඳහා තවත් පත්‍රිකාවක් සකස් කැරෙමින් පවතී.

ආයතනයට පැමිණි අමුත්තන්

වසර තුළදී විදේශීය අමුත්තන් කිහිප දෙනෙක් ආයතනයට පැමිණියහ. 2011 වසරේ පැමිණි අමුත්තන්ට පහත දැක්වෙන අය ඇතුළත් වූහ:- උප්සලාහි ස්වීඩන් කෘෂිකර්ම විද්‍යා විශ්ව විද්‍යාලයේ ආශ්‍රේය මහාචාර්ය, ආචාර්ය එරික් බොන්ග්කැම් රඩ්ලොෆ්; ඕස්ට්‍රේලියාවේ ක්වීන්ස්ලන්ත තාක්ෂණ විශ්වවිද්‍යාලයේ විද්‍යාර්ථීන් කණ්ඩායමක්; කොල්කටා ජඩයිපූර් විශ්වවිද්‍යාලයේ පර්යේෂණ විද්‍යාඥ, මහාචාර්ය බන්සාරි හස්රා; කැනඩාවේ සයිමන් ෆ්‍රේසර් විශ්වවිද්‍යාලයේ පර්යේෂණ උප සභාපති, මහාචාර්ය මාරියෝ පින්ටෝ; ලන්ඩනයේ ඉම්පීරියල් විද්‍යාලයේ ප්‍රතිශක්තිවේදය පිළිබඳ

ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය සහ ශාන්ත මේරි රෝහලේ ප්‍රධාන ප්‍රතිශක්තිවේද සායනික විද්‍යාඥ වෛද්‍ය සුරන්ජිත් සෙනෙවිරත්න; එක්සත් රාජධානියේ ශරීර අර්බුද පිළිබඳ විශේෂඥ වෛද්‍ය (Medical Oncologist) මහේෂ් ඉද්දවල; සහ ඕස්ට්‍රේලියාවේ ජේම්ස්කුක් විශ්වවිද්‍යාලයේ ආසාදක රෝග සහ ප්‍රතිශක්ති ව්‍යාධිජනක පර්යේෂණ කණ්ඩායමේ ප්‍රධානී සහ සහකාර මහාචාර්ය ආචාර්ය නත්කුනම් කේතීසන්.

ආරාධිත දේශන

"ඊළඟ පරම්පරාවේ අනුක්‍රමණය" - උප්සලාහි ස්වීඩන් කෘෂි විද්‍යා විශ්වවිද්‍යාලයේ ආශ්‍රේය මහාචාර්ය ආචාර්ය එරික් බොන්ග්කැම් - රඩ්ලොෆ්.

"Interferon ගැමා ගමන් මඟ සහ අනුපූරකය" - ආචාර්ය සුරන්ජිත් සෙනෙවිරත්න, ප්‍රධාන ප්‍රතිශක්තිවේද සායනික විශේෂඥ, ලන්ඩනයේ ශාන්ත මේරි රෝහල සහ ඉම්පීරියල් විද්‍යාලයේ ප්‍රතිශක්තිවේදය පිළිබඳ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය.

"සෞඛ්‍යාරක්ෂාව සඳහා ශාක රසායන - වාසි සහ මිථ්‍යාවන්" - මහාචාර්ය බනාරිස් හස්රා, පර්යේෂණ විද්‍යාඥ, ඖෂධ තාක්ෂණ විද්‍යා දෙපාර්තමේන්තුව, ජඩායිපූර් විශ්වවිද්‍යාලය, කොල්කටා, ඉන්දියාව.

"පියයුරු පිළිකා පිළිබඳ අණුක සලකුණුකරණ අධ්‍යයන සඳහා ෆෝමලින් ස්ථාපිත පැරෆින් ගැල් වූ පටක භාවිතය" - වෛද්‍ය මහේෂ් ඉද්දවල, හිටපු පිළිකා රෝග විශේෂඥ වෛද්‍ය, ඇඩ්න්බෲක්ස් රෝහල, කේම්බ්‍රිජ්.

මානව සම්පත්

නව පත්වීම්

2011 මාර්තු 14 දින සිට ක්‍රියාත්මක වන පරිදි ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී වශයෙන් ධම්මිකා ගල්කඩුව මහත්මිය පත් කරන ලදී. අධ්‍යයන වැඩසටහන්වලට සහ පශ්චාත් උපාධි සිසුන් අධීක්ෂණය කිරීමට සැලකිය යුතු දායකත්වයක් ලබා දෙමින් ආරම්භක අධ්‍යක්ෂ සහ සම්මානිත මහාචාර්ය එරික් එච්. කරුණානායක මහතා තවදුරටත් IBMBB ආයතනයේ ගරු සේවයේ නියැළී සිටියේය. මහාචාර්ය අයිරා තාබෲ මහත්මිය බාහිර මහාචාර්යවරියක වශයෙන් තවදුරටත් IBMBB හි සේවය කළාය.

විශ්‍රාම යැම්, ඉල්ලා අස්වීම් සහ මාරුවීම්

2011 ජුලි 31 දින සිට ක්‍රියාත්මක වන පරිදි ආචාර්ය ඊ. නිරෝෂිණී මහත්මිය ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ධුරයෙන් ඉල්ලා අස්වූවාය.

2011 දෙසැම්බර් 31 දිනට කාර්ය මණ්ඩලය 36 පිටුවේ දැක්වේ.

සාමූහික සමාජ වගකීම් ක්‍රියාකාරකම්

2011 ජුනි 30 වන දින කාර්ය මණ්ඩලය සහ ශිෂ්‍යයින් විසින් ජාතික පිළිකා ආයතනය වෙනුවෙන් ලේ දන්දීමේ ව්‍යාපාරයක් සංවිධානය කරන ලද අතර එහිදී 49 දෙනෙක් ලේ දන් දුන්හ. ජාතික පිළිකා ආයතනයේ ළමා සත්කාර ඒකකය සඳහා ප්ලාස්ටික් අයිතම ප්‍රදානය කිරීමක් ද 2011 දෙසැම්බර් 5 දින සිසුන් සහ කාර්ය මණ්ඩලය විසින් සංවිධානය කරන ලදී.

බාධක

2007-2011 ආයතනික සැලැස්ම ප්‍රකාරව කාර්යයන් ක්‍රියාත්මක කිරීමේදී මූලික බාධකයන් වූයේ මානව සම්පත් හා මූල්‍ය සම්පත් ය. IBMBB විසින් පවත්වනු ලබන පූර්ණ කාලීන විද්‍යාපති (MSc) පාඨමාලාවල එක් අධ්‍යයන වාරයක් තුළ පූර්ණ කාලීන පර්යේෂණ සංරචකයක් ඇතුළත් වන අතර ඒ සඳහා 1:1 අනුපාතයට සිසුන් අධීක්ෂණය කිරීම අවශ්‍ය වේ. දර්ශනපති (MPhil) සහ ආචාර්ය උපාධි (PhD) පාඨමාලා පූර්ණ කාලීන පර්යේෂණ මත පදනම් වේ. IBMBB හි පුහුණු වැඩසටහන් මගින් දේශීය

විශ්වවිද්‍යාලවලට, පර්යේෂණ ආයතනවලට සහ පෞද්ගලික අංශයට මානව සම්පත් සපයා තිබේ. අවාසනාවකට මෙන්, ප්‍රමාණවත් අධ්‍යයන කාර්ය මණ්ඩලයක් නොමැති වීම නිසා තම උසස් තත්ත්වයේ මානව සම්පත් පුහුණු වැඩසටහන් ව්‍යාප්ත කිරීම IBMBB ආයතනයට දුෂ්කර වී තිබේ. එහි අධ්‍යයන කාර්ය මණ්ඩලයේ සිටින්නේ 4 දෙනෙකු පමණක් වන අතර (එක් මහාචාර්යවරයකු සහ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරුන් තිදෙනකු), දැනට ක්‍රියාත්මක වන වැඩසටහන් මේ දක්වා පවත්වාගෙන ගොස් ඇත්තේ ආරම්භක අධ්‍යක්ෂවරයාගේ (සම්මානිත මහාචාර්ය ධුරයක් උසුලන) සහ අනෙකුත් විශ්‍රාමික ජ්‍යෙෂ්ඨ විද්‍යාර්ථීන්ගේ සැලකිය යුතු දායකත්වය නිසාය. ඉගැන්වීම් සහ පර්යේෂණ වැඩසටහන් අඛණ්ඩව පවත්වාගෙන යෑම සහ ව්‍යාප්ත කිරීම සඳහා අතිරේක අධ්‍යයන සේවක සංඛ්‍යා, පශ්චාත් ආචාර්ය විද්‍යාර්ථීන් සහ විද්‍යාත්මක සහායකයින් අවශ්‍ය වේ.

2011 දෙසැම්බර් 31 දිනට කාර්ය මණ්ඩලය

ස්ථිර සේවක සංඛ්‍යාව

මහාචාර්ය කමනී එච්. තෙන්නකෝන්	-	අධ්‍යක්ෂ සහ අණුක ජීවන විද්‍යා මහාචාර්ය.
ආචාර්ය ශිරෝමා හඳුන්නෙත්ති	-	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I ශ්‍රේණිය
ආචාර්ය ඕ.වී.ඩී.එස්.ජේ. වීරසේන	-	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II ශ්‍රේණිය
ආචාර්ය ඊ. නිරෝෂිනී	-	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II ශ්‍රේණිය (2011.07.31 දින ඉල්ලා අස්විය.)
අනෝමා රත්නායක මහත්මිය	-	ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරි
ධම්මිකා ගල්කඩුව මහත්මිය	-	ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී (2011.03.14 දින සිට)
කාන්චන සේනානායක මහතා	-	සහකාර ජාල කළමනාකරු
සුදේශිනී හේවගේ මිය	-	විද්‍යාත්මක සහකාර
සී. එස්. පී. අබේසිංහ මහතා	-	කාර්ය මණ්ඩල තාක්ෂණික නිලධාරී
අනෝමා ජයසෝම මිය	-	තාක්ෂණික නිලධාරී
එන්. සී. ඒ. ගුණසේකර මහතා	-	තාක්ෂණික නිලධාරි
තනුජා අතපත්තු මිය	-	පොත් තබන්නා
එන්. කේ. එස්. චම්පිකා මිය	-	පරිගණක යෙදවුම් සහකාර
කේ. ඩබ්ලිව්. සී. එස්. ප්‍රනාන්දු	-	පරිගණක යෙදවුම් සහකාර
සශික නිරංජන් මහතා	-	පරිගණක යෙදවුම් සහකාර
නදීශා ජයවර්ධන මිය	-	පරිගණක යෙදවුම් සහකාර
එච්.ඒ.එස්. චන්ද්‍රසෝම මහතා	-	පුස්තකාල සහකාර
ඩබ්ලිව්. එස්. ආර්. ජයලත් මිය	-	පිළිගැනීමේ නිලධාරී / දුරකථන ක්‍රියාකරු
වයි. බී. එම්. එන්. වයි. බණ්ඩාර මහතා	-	රසායනාගාර සහායක
ඩබ්ලිව්. ජී. පී. එම්. තිලකරත්න මහතා	-	රසායනාගාර සහායක
ටී. එස්. ආර්. රුබේරු මහතා	-	කම්කරු

තාවකාලික / පැවරුම්

ඉනෝකා සංජීවනී මිය	-	වැඩබලන ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරි (2011.03.13 දක්වා)
ආචාර්ය එෆ්.එම්.එම්.ටී. මරිකාර්	-	තාවකාලික ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය (2011.01.03 සිට 2011.03.31 දක්වා)
සචින්තිකා ගුණතිලක මිය	-	ඉගැන්වීම් / පර්යේෂණ සහකාර (2011.03.15 සිට 2011.09.12 දක්වා)
සුමාධී ද සිල්වා මිය	-	ඉගැන්වීම් / පර්යේෂණ සහකාර (2011.03.31 සිට)
සමීර සමරකෝන් මහතා	-	විද්‍යාත්මක සහකාර (2011.03.01 සිට)
ප්‍රියංගනී දාබරේ මිය	-	ගිණුම් සහකාර (2011.07.24 සිට)

වර්තමාන පර්යේෂකයින්

මහාචාර්ය කමනී එච්. තෙන්නකෝන්	-	අධ්‍යක්ෂ සහ අණුක ජීවන විද්‍යා මහාචාර්ය, IBMBB
මහාචාර්ය එරික් එච්. කරුණානායක	-	IBMBB සම්මානිත මහාචාර්ය සහ ආරම්භක අධ්‍යක්ෂ
මහාචාර්ය අයිරා තාබෲ	-	බාහිර මහාචාර්ය සහ ජා.වි.ප. පර්යේෂණ විද්‍යාර්ථී, IBMBB
ආචාර්ය ශිරෝමා හඳුන්නෙත්ති	-	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය / ප්‍රතිශක්තිවේදය, IBMBB
ආචාර්ය ඕ. වී. ඩී. එස්. ජේ. වීරසේන	-	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය / අණුක තාක්ෂණවිද්‍යා IBMBB
එන්. ජයසේකර මිය	-	කීට විද්‍යාඥ SAREC ව්‍යාපෘතිය, IBMBB

පර්යේෂණ සහායකයින්

මහාචාර්ය ප්‍රිතිකා අඹුණාවෙල	-	ව්‍යාධිවේද මහාචාර්ය, වෛද්‍ය පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය.
මහාචාර්ය දිලිප් ද සිල්වා	-	කාබනික රසායන විද්‍යා මහාචාර්ය, විද්‍යා පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය.
මහාචාර්ය ජනක ද සිල්වා	-	වෛද්‍ය විද්යා මහාචාර්ය, වෛද්‍ය පීඨය, කැලණිය විශ්වවිද්‍යාලය.
මහාචාර්ය සුනිල් ප්‍රේමවංශ	-	සත්ත්ව විද්‍යා මහාචාර්ය, විද්‍යා පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය.
මහාචාර්ය ඩබ්ලිව්. ඩී. රත්නසූරිය	-	සත්ත්ව විද්‍යා මහාචාර්ය, විද්‍යා පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය.
මහාචාර්ය සේනක රාජපක්ෂ	-	සායනික වෛද්‍ය විද්‍යා මහාචාර්ය, වෛද්‍ය පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය.
මහාචාර්ය හේමන්ත සේනානායක	-	ප්‍රසව හා නාරිවේද මහාචාර්ය, කොළඹ විශ්වවිද්‍යාලය.
මහාචාර්ය එම්. එච්. ආර්. ෂෙරිෆ්	-	සායනික වෛද්‍ය විද්‍යා මහාචාර්ය, වෛද්‍ය පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය.
ආචාර්ය මාරි ඇලන්	-	ආශ්‍රේය මහාචාර්ය, ප්‍රවේණි විද්‍යා සහ ව්‍යාධිවේද, උප්සලා විශ්වවිද්‍යාලය.
වෛද්‍ය ඉන්ද්‍රානි අමරසිංහ	-	ශල්‍ය වෛද්‍ය විශේෂඥ, ජාතික පිළිකා ආයතනය, මහරගම.
ආචාර්ය එරික් රුඩොල්ෆ් බොංග්කැම්	-	ආශ්‍රේය මහාචාර්ය, ස්වීඩන කෘෂිකර්ම විශ්ව විද්‍යාලය, උප්සලා.
ආචාර්ය රනිල් දසනායක	-	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, රසායන විද්‍යා දෙපාර්තමේන්තුව, විද්‍යා පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය.
වෛද්‍ය නන්දන දික්මදුගොඩ	-	විශේෂඥ කායික වෛද්‍ය, මූලික රෝහල, හෝමාගම.
ආචාර්ය ශ්‍යාමා ද සිල්වා	-	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ළමා රෝග දෙපාර්තමේන්තුව, කොළඹ විශ්වවිද්‍යාලය.

ආචාර්ය කුමුදු ප්‍රනාන්දු	-	අධ්‍යක්ෂ, කෘෂි ජෛව තාක්ෂණ මධ්‍යස්ථානය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය.
වෛද්‍ය ලිලානි කරුණානායක	-	අණුක ජෛව විද්‍යා විශේෂඥ, වෛද්‍ය පර්යේෂණ ආයතනය, කොළඹ.
වෛද්‍ය නිශා කෝට්ටේආරච්චි	-	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය වයඹ විශ්වවිද්‍යාලය.
වෛද්‍ය ජේ. එම්. කුමාරසිරි	-	ප්‍රසව හා නාරිවේද විශේෂඥ, කාසල් වීදියේ කාන්තා රෝහල.
මහාචාර්ය ආලෝක පතිරණ	-	ශල්‍ය වෛද්‍ය විශේෂඥ, කොළඹ දකුණ ශික්ෂණ රෝහල.
ආචාර්ය ජී. ඒ. සිරිමල් ප්‍රේමකුමාර	-	ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධ්‍යක්ෂ, කාර්මික තාක්ෂණ ආයතනය, කොළඹ.
වෛද්‍ය ගයනී ප්‍රේමවංශ	-	විශේෂඥ වෛද්‍ය, උතුරු කොළඹ ශික්ෂණ රෝහල, රාගම.
ආචාර්ය ආර්. සමරසේකර	-	ශාක තාක්ෂණ අංශය, කාර්මික තාක්ෂණ ආයතනය, කොළඹ.
වෛද්‍ය ප්‍රණීතා සෝමරත්න	-	ක්ෂුද්‍රජීව විශේෂඥ, වෛද්‍ය පර්යේෂණ ආයතනය, කොළඹ.
ආචාර්ය සුගන්දි සුරේශ්	-	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ජෛව රසායන විද්‍යා දෙපාර්තමේන්තුව, වෛද්‍ය පීඨය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය.
ආචාර්ය එස්. වීරකෝන්	-	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, විවෘත විශ්වවිද්‍යාලය.
වෛද්‍ය හසිත වික්‍රමසිංහ	-	විශේෂඥ වෛද්‍ය, මූලික රෝහල, හෝමාගම.
වෛද්‍ය අජිතා විජේසුන්දර	-	ප්‍රසව හා නාරි වෛද්‍ය විශේෂඥ, කලින් කාසල්වීදියේ කාන්තා රෝහල.
හර්ෂ විජේවර්ධන මහතා	-	උපදේශක, කොළඹ විශ්වවිද්‍යාලය, පරිගණක පාසල.

පර්යේෂණ (MPhil/PhD) ශිෂ්‍යයෝ

සුමාදී ද සිල්වා මිය		
පී. ජයන්තිනි මිය	-	මානව ජෛව විද්‍යා පරිවාස කථිකාචාර්ය, සෞඛ්‍ය විද්‍යා පීඨය, නැගෙනහිර විශ්වවිද්‍යාලය
සුදේශිනි හේවගේ මිය	-	විද්‍යාත්මක සහකාර, IBMBB
ආර්. ආර්. කුමාර මහතා		
කේ. මෙවන් මහතා	-	පර්යේෂණ නිලධාරී, තේ පර්යේෂණ ආයතනය
එන්. එච්. එල්. ප්‍රදීපා මිය	-	පර්යේෂණ නිලධාරී, තේ පර්යේෂණ ආයතනය
කැලුම් පීරිස් මහතා		
රුවින්දි රණසිංහ මිය		
සමීර සමරකෝන් මහතා		
බී. එච්. කේ. ආර්. සුගතදාස මහතා	-	රසායනාගාර කළමනාකරු, හේමාස් රෝහල
ගෞරි රාජ්කුමාර් මිය	-	උද්භිද විද්‍යා පරිවාස කථිකාචාර්ය, විද්‍යා පීඨය, යාපනය විශ්වවිද්‍යාලය
වෛද්‍ය බී. පී. ගල්හේන	-	ජෛව රසායන විද්‍යා පරිවාස කථිකාචාර්ය, වෛද්‍ය පීඨය, කැලණිය විශ්වවිද්‍යාලය
වාසනා රුද්‍රිගු මිය		
එම්. ඩී. ආර්.එල්. සිල්වා මිය	-	මොරටුව විශ්වවිද්‍යාලය
වෛද්‍ය වයි. එන්. සිල්වා	-	භෞතවේද පරිවාස කථිකාචාර්ය, වෛද්‍ය විද්‍යා පීඨය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය.
ඩී. ඒ. එස්. සිරිවර්ධන මයා	-	පර්යේෂණ නිලධාරි, කර්මාන්ත තාක්ෂණ ආයතනය.
රුපිකා විජේසිංහ මිය	-	කොළඹ විශ්වවිද්‍යාලය, පරිගණක පාසල.

පර්යේෂණ ප්‍රකාශන

සුවිගත/විමර්ශන වාර ප්‍රකාශනවල පළ කරන ලද පර්යේෂණ පත්‍රිකා

ද සිල්වා එච්.; තෙන්නකෝන් කේ. එච්.; කරුණානායක ඊ.එච්.; ද සිල්වා ඩබ්ලිව්.; අමරසිංහ අයි.; අඟුණාවල පී. (මුද්‍රණයේ) : ශ්‍රී ලංකාවේ පියයුරු පිළිකා රෝගීන්ගේ සහ BRCA I විකෘතතා සහිත පවුලක BRCA 2 නව අනුක්‍රමණ විචල්‍යතා සහ පොදු පුනරාවර්තී බහුරූපතා. Experimental and Theraputic Medicine. මාර්ගගත ප්‍රකාශනය; 2011 අගෝස්තු 17, බදාදා දින.

ජයන්තිනි පී; තෙන්නකෝන් කේ. එච්.; කරුණානායක ඊ. එච්; කුමාරසිරි ජේ. එම්.; විජේසුන්දර ඒ. පී. ඩී. ද. එස්.: ඉන්සියුලින් වැනි වර්ධක සාධක - 1 (IGF-1) ප්‍රවේණි දර්ශයේ ඩිනියුක්ලියෝටයිඩ් පුනර් බහුරූපතා සහ ශ්‍රී ලාංකික උපත් කාණ්ඩයක IGF-1 ඉන්සියුලින් වැනි වර්ධක සාධක බන්ධක ප්‍රෝටීන් 1 සහ උපතේදී විශාලත්වය සමඟ ඒවායේ ඇති සම්බන්ධතාව. Neonatology 2011; 100:37-43

ගල්හේන පී. බී.; සමරකෝන් එස්. එස්. ආර්.; තාබෲ එම්. අයි. සොලමන් එෆ්. ඩී. පෝල්; වෙන්කටවලම්. පී; සහ වින්නදුරෙයි එම්. : *Nigella Sativa* (බීජ), *Hemidesmus indicus* (මුල්) සහ *smilax glabra* (රයිසෝම) ශාක කෂායක රසායනික ආරක්ෂක විභව්‍යතාව නිගමනය කිරීම සඳහා මූලික අධ්‍යයනයක්. Phototherapy Research - සමාලෝචනයට භාජන වෙමින් පවතී.

ගල්හේන පී. බී.; සමරකෝන් එස්. ආර්.; තාබෲ එම්. අයි. ; තම්මිටියගොඩගේ එම්. ජී.; රත්නසූරිය ඩබ්ලිව්. ඩී.; **තෙන්නකෝන් කේ. එච්.** : ප්‍රතිප්‍රදාහ ක්‍රියාකාරීත්වය යනු *Nigella Sativa* (බීජ), *Hemidesmus indicus* (මුල්) සහ *smilax glabra* (රයිසෝම) වලින් සමන්විත බහුශාක සැකැස්ම එහි ප්‍රති හෙපටොකාසිනෝජෙනික් බලපෑම්වලට මැදිහත් වන විභවය යන්ත්‍රණයකි. Journal of Ethnopharmacology - සමාලෝචනයට භාජන වෙමින් පවතී.

ගුණරත්න ආර්. අයි.; හඳුන්නෙත්ති එස්. එම්.; බුලත්සිංහලගේ එම්.ආර්.සී.; සෝමරත්න පී.; ජයනාග ඒ.; ද සිල්වා එච්. ජේ.; රාජපක්ෂ එස්.; ලෙප්ටොපයිරෝසිස් වැළඳුණු ශ්‍රී ලාංකික රෝගීන්ගේ මස්තු නයිට්‍රයිට් මට්ටම; Asian Pacific Journal of Tropical Medicine වාර සගරාව (මුද්‍රණයේ)

රාජ්කුමාර් ජී.; වීරසේන ඕ. වී. ඩී. එස්. ජේ.; ප්‍රනාන්දු කේ. කේ. එස්.; ලියනගේ ඒ. එස්. යූ. සහ රංගිකා එස්. : AFLP සලකුණුකරණයන් මගින් සාම්ප්‍රදායික ශ්‍රී ලාංකික සහල් උපවර්ග (Oryza sativa) සහ ස්වාභාවික සහල් විශේෂ අතර ප්‍රවේණි විචල්‍යතාව. Nordic Journal of Botany – 2011; 29(2) : 238-243

රාජ්කුමාර් ජී.; වීරසේන ඕ. වී. ඩී. එස්. ජේ.; ප්‍රනාන්දු කේ. කේ. එස්.; ලියනගේ ඒ. එස්. යූ. : AFLP සලකුණුකරණයන් මගින් ශ්‍රී ලාංකික සහල් උපවර්ග අතර ඇති ප්‍රවේණි විවිධත්වය තක්සේරු කිරීම. Plant Genetic Resources : Characterization and Utilization; 2011; 9: 224-228.

සමරකෝන් එස්. ආර්.; තාබ්‍රෑ එම්. අයි.; ගල්හේන පී. බී.; තෙන්නකෝන් කේ. එච්.; මානව හෙපටෝම සෛලවල (HepG2) සහ රසායනික වශයෙන් උත්තේජනය කරන ලද හෙපටොකාසිනෝජෙනෙසිස් සහිත මීයන්ගේ අක්මාවල P53 සහ P21 ප්‍රවේණිවල ප්‍රකාශනය කෙරෙහි *Nigella Sativa* (බීජ), *Hemidesmus indicus* (මුල්) සහ *Smilax glabra* (රයිසෝම) වලින් සමන්විත ප්‍රමිතිගත ලෙස සකස් කරන ලද කසායක බලපෑම්. Tropical Journal of Pharmceutical Research (මුද්‍රණයේ)

සමරකෝන් එස්.; තාබ්‍රෑ අයි.; තෙන්නකෝන් කේ. : ප්‍රති හෙපටොකාසිනෝජෙනික් බලපෑම සහිත ප්‍රමිතිගත ශාක කසායක් මගින් මානව හෙපටොසෙලියුලර් කාසිනෝමාවල (Hep G2 සෛල) ඇපොප්ටෝසිස් මූර්ජනය (modulation).

උද්ධෘත ප්‍රකාශයට පත් කරනු ලබන විද්‍යාත්මක රැස්වීම් (මුද්‍රිත හෝ ඉලෙක්ට්‍රොනික)

අළුවිහාරේ ඩබ්ලිව්. බී. ඩබ්ලිව්. එම්. ආර්. වයි. සී.; වීරසේන ඕ. වී. ඩී. එස්. ජේ.; ශ්‍රී ලාංකික සහල් ප්‍රභේදවලින් Putative ශාක රෝග ප්‍රතිරෝධක ප්‍රවේණි ඇනලෝග වෙන් කිරීම සහ ඒවායේ ලක්ෂණ විභාගය. IBMBB හි සිව්වැනි වාර්ෂික විද්‍යාත්මක සැසිය, කොළඹ, 2011 මැයි, 27 පිටුව.

ද සිල්වා එස්.; තෙන්නකෝන් කේ.එච්.; කරුණානායක ඊ.එච්.; ද සිල්වා ජේ.ඩබ්ලිව්.එන්.; අමරසිංහ අයි.; අභූනාවල පී. : ශ්‍රී ලංකාවේ පියයුරු පිළිකා රෝගීන් කණ්ඩායමක BRCA 2 නව අනුක්‍රමණ විචල්‍යතා සහ පොදු පුනරාවර්තී බහුරූපකතාවන්. IBMBB හි සිව්වැනි වාර්ෂික විද්‍යාත්මක සැසිය, කොළඹ. 2011 මැයි, පිටුව 13.

ද සිල්වා ඩී. එස්. ඩී.; ද සිල්වා ඊ. ඩී. සහ **හඳුන්නෙත්ති එස්. එම්. :** *Ixora Coccinea* සහ *Vitex negundo* වල ජලීය සහ ද්‍රාවක නිස්සාරකයන්හි ප්‍රතිධූලක ක්‍රියාකාරීත්වය. 2011 SLAAS වාර්ෂික සැසිවාරයේ වැඩකටයුතු ; 67:140 යි.

ද සිල්වා ඩබ්ලිව්. එච්. වයි. ඩී.; පතිරණ ඒ.; **වීරසේන ඕ.වී.ඩී.එස්.ජේ.; හඳුන්නෙත්ති එස්. එම්. :** පියයුරු පිළිකාවල මයිරෝමෙටස්ටාසිස් නිරීක්ෂණය සඳහා සයිටොකෙරටින් - 19 පාදක ප්‍රතිවර්තී transoriptase polymerase දාම ප්‍රතික්‍රියාව යොදා ගැනීම. පියයුරු පිළිකා වැළැක්වීම පිළිබඳ දෙවැනි අන්තර්ජාතික සමුළුවේ වැඩ කටයුතු, 2011 ඔක්තෝබර් 9-11, රෙනේ, ප්‍රංශය; 43 පිටුව.

ද සිල්වා ඩබ්ලිව්. එච්. වයි. ඩී.; පතිරණ ඒ.; වීරසිංහ ඒ. **වීරසේන ඕ.වී.ඩී.එස්.ජේ.; හඳුන්නෙත්ති එස්. එම්. :** සයිටොකෙරටින් - 19 පාදක ප්‍රතිවර්තී ට්‍රාන්ස්ක්‍රිප්ටේස් පොලිමෙරේස් දාම ප්‍රතික්‍රියාව භාවිත කරමින් පියයුරු පිළිකාවල ක්ෂුද්‍ර සංක්‍රමණය නිරීක්ෂණය කිරීම IBMBB සිව්වැනි වාර්ෂික විද්‍යාත්මක සැසිය, කොළඹ. 2011 මැයි : 33 පිටුව

ගල්හේන බී. පී.; තාබෲ එම්. අයි. සමරකෝන් එස්.එස්.ආර්.; සොලමන් එෆ්. ඩී. පී.; වෙන්කටවලම් පී.; **තෙන්නකෝන් කේ. එච්. :** මානව පර්යන්ත රුධිර ලිම්ෆොසයිටවල බ්ලෙයොමයිසින් කාරක සයිටොජෙනටික් හානිවලට එරෙහිව *Nigella Sativa* (බීජ). *Hemidesmus indicus* (මුල්) සහ *Smilax glabra* (රයිසෝම) ශාකවලින් සමන්විත බහු ශාක මිශ්‍රණයක නාලස්ථ ආරක්ෂක කාර්ය භාරය: මූලික අධ්‍යයනයක්; IBMBB සිව්වැනි වාර්ෂික විද්‍යාත්මක සැසිය, කොළඹ, 2011 මැයි, 23 පිටුව.

ගම්මුල්ල ඒ. එස්.; රත්නසූරිය ඩබ්ලිව්. ඩී.; රන්දෙනිය පී. වී.; මී තොම්බ්‍රොසයිට (ප්ලේට්ලට්) ප්‍රමාණය කෙරෙහි Carica Papaya පත්‍ර සාන්ද්‍රණයේ ඇති බලපෑම: IBMBB සිව්වැනි වාර්ෂික විද්‍යාත්මක සැසිය, කොළඹ, 2011 මැයි, 40 පිටුව.

ගෞරී ආර්. වීරසේන ඕ. වී. ඩී. එස්. ජේ.; ප්‍රනාන්දු කේ. කේ. එස්. : සාම්ප්‍රදායික ශ්‍රී ලාංකික ස්වාභාවික සහ වැඩි දියුණු කරන ලද සහල් විශේෂවල ප්‍රවේණි විවිධත්වය අනාවරණය කිරීම. IBMBB සිව්වැනි වාර්ෂික විද්‍යාත්මක සැසිය, කොළඹ, 2011 මැයි, 21 පිටුව.

හේවගේ ඒ. එස්.; ජයන්තිනි පී.; තෙන්නකෝන් කේ. එච්.; කරුනානායක ඊ. එච්.; කුමාරසිරි ජේ. එම්.; විජේසුන්දර ඒ. පී. ද එස්. : ශ්‍රී ලාංකික මව හා ළදරු කණ්ඩායමක H 19 ප්‍රවේණි අණුවේ 1737 A/G බහුරූපතාව පිළිබඳ මූලික වාර්තාවක්; IBMBB සිව්වැනි වාර්ෂික විද්‍යාත්මක සැසිය, කොළඹ, 2011 මැයි, 29 පිටුව.

ජයන්තිනි පී.; තෙන්නකෝන් කේ. එච්.; කරුණානායක ඊ.එච්.; කුමාරසිරි ජේ. එම්.; විජේසුන්දර ඒ. පී. ද එස්. : ඉන්සියුලින් වැනි වර්ධක සාධක (IGF) II වල රජ්ජු රුධිර මට්ටම් සහ උපතේදී විශාලත්වය කෙරෙහි H19 ප්‍රවේණි අණුවේ 2992 C/T බහුරූපතා සම්බන්ධය : IBMBB සිව්වැනි වාර්ෂික විද්‍යාත්මක සැසිය, කොළඹ, 2011 මැයි, 15 පිටුව.

කළුගලගේ ටී. එල්.; විතානගේ ටී. ඩී. පී.; සෝමරත්න පී.; ද සිල්වා එච්.ජේ.; රාජපක්ෂ එස්.; **හඳුන්නෙත්ති එස්. එම්.:** ශ්‍රී ලංකාවේ උග්‍ර ලෙප්ටොපයිරෝසිස් රෝගීන්ගේ මස්තු NO_X. මට්ටම් පිළිබඳ අධ්‍යයනයක්, IBMBB සිව්වැනි වාර්ෂික විද්‍යාත්මක සැසිය, කොළඹ, 2011 මැයි, 34 පිටුව.

කළුගලගේ ටී. එල්., විතානගේ ටී. ඩී. පී., සෝමරත්න පී., ද සිල්වා එච්.ජේ., රාජපක්ෂ එස්., **හඳුන්නෙත්ති එස්. එම්.:** ශ්‍රී ලංකාවේ උග්‍ර ලෙප්ටොපයිරෝසිස් රෝගීන්ගේ වර්ධිත මස්තු NO_x. මට්ටම් : ශ්‍රී ලංකා ජෛව වෛද ආයතනයේ වාර්ෂික සැසියේ වාර්තා, 2011;31 : 49 පිටුව.

කන්නන්ගර යූ. එම්.; වීරසේන ඕ.වී.ඩී.එස්.ජේ.; දසනායක පී. එන්. ; ක්ෂුද්‍ර චන්ද්‍රිකා (මයික්‍රොසැටලයිට්) සලකුණුකරණයන් භාවිත කරමින් finger millet ධාන්‍යවල ප්‍රවේණි විවිධත්වය තක්සේරු කිරීම. IBMBB සිව්වැනි වාර්ෂික විද්‍යාත්මක සැසිය, කොළඹ, 2011 මැයි, 36 පිටුව.

කාරියවසම් කේ. ඩබ්ලිව්. ජේ. සී.; සිරිසේන පී. ඩී. එන්. එන්. ; ද සිල්වා ඊ. ඩී.; රත්නසූරිය ඩබ්ලිව්. ඩී. සහ **හඳුන්නෙත්ති එස්. එම්. :** මානව ඒක න්‍යෂ්ටිය සෛල මගින් ප්‍රදාහකාරක සයිටොකයින් ස්‍රාවය වැළැක්වීම සහ *Vitex negundo* අම්මය ශාක නිෂ්කර්ෂකය විසින් මානව න්‍යුට්‍රොෆිල්ස්හි ෆැගෝසයිටික් ක්‍රියාකාරීත්වය ; SLAAS 2011 වාර්ෂික සැසියේ කටයුතු ; 67;57

කරුණානායක ජී. ඒ.; ජයන්තිනි පී. ; සිල්වා එන්. වයි.; තෙන්නකෝන් කේ.එච්.; කරුණානායක ඊ.එච්.; සේනානායක එල්. : සාමාන්‍ය ගර්භණීභාවයේදී අපරා වර්ධක සාධක මට්ටම්, ගැබ් දැරීමේදී මධුමේහය සහ ගර්භණීභාවයෙන් ඇති වන අධිරක්ත පීඩනය: IBMBB සිව්වැනි වාර්ෂික විද්‍යාත්මක සැසිය, කොළඹ, 2011 මැයි, 32 පිටුව.

කරුණානායක ජී.ඒ.; සමරකෝන් එස්.ආර්.; පෙරේරා එම්.ඊ.; මුරුගානන්දන් ඒ.; තෙන්නකෝන් කේ.එච්.; කරුණානායක ඊ.එච්. : *Setaria digitata* හි cDNA ක්ලෝන සමහරක මූලික ලක්ෂණ විභාගය; IBMBB සිව්වැනි වාර්ෂික විද්‍යාත්මක සැසිය, කොළඹ, 2011 මැයි, 35 පිටුව.

කරුණානායක ජී. ඒ.; තෙන්නකෝන් කේ. එච්.; ජයසෝම ඒ. ඒ.; ජයන්තිනි පී.; කරුණානායක ඊ. එච්.; කුමාරසිරි ජේ. ඩබ්ලිව්.; විජේසුන්දර ඒ. පී. ද එස්. : සාමාන්‍ය අසංකීර්ණ තනි පුද්ගල ගර්භණීභාවයන්හි නවජයන් තුළ රජ්ජු රුධිර ලෙප්ටින් මට්ටම් : ස්ත්‍රී පුරුෂ භාවයේ සහ සාමාන්‍යත්වයේ බලපෑම. IBMBB සිව්වැනි වාර්ෂික විද්‍යාත්මක සැසිය, කොළඹ, 2011 මැයි, 28 පිටුව.

කොතලාවල එස්. ඩී. ; ප්‍රේමකුමාර ජී.ඒ.එස්. **හඳුන්නෙත්ති එස්. එම්.;** රත්නසූරිය ඩබ්ලිව්. ඩී. : මීයන් තුළ *Coriandrum sativum* L. සහ *Coscinium fenestratum* L. ඒකාබද්ධ උණු දිය නිෂ්කර්ෂකයේ ප්‍රතිශක්ති අනුකූලන ක්‍රියාකාරීත්වය. ඖෂධීය ශාක සහ ශාක ඖෂධ පිළිබඳ තුන්වැනි අන්තර්ජාතික සම්මන්ත්‍රණයේ කටයුතු, 2011 දෙසැම්බර් 19-21; කොළඹ, ශ්‍රී ලංකාව ; 81 පිටුව.

කොටිගල එස්. බී.; ගම්මන ලියනගේ අයි.; සමරකෝන් එස්. ආර්.; තාබෲ අයි.; තෙන්නකෝන් කේ. එච්. : මානව අන්තෝමාතෘක කාසිනෝමා (AN3CA) සෛල කෙරෙහි Fluggea *Leucopyrus* (වායව කොටස්) කසායක නාලස්ථ ප්‍රති - කාසිනෝජෙනික් බලපෑම්: ඖෂධීය ශාක සහ ශාක නිෂ්පාදන පිළිබඳ තුන්වැනි අන්තර්ජාතික සම්මන්ත්‍රණය, කොළඹ, 2011 දෙසැම්බර්; 58.

කුමාරසිවම් කේ.; ගුණවර්ධන ඩී.; *Oryza Sativa* හි OSA 3 ප්‍රවේණි අණුවේ සීමාකාරක ඛණ්ඩ දිගු බහුරූපතා විශ්ලේෂණය IBMBB සිව්වැනි වාර්ෂික විද්‍යාත්මක සැසිය, කොළඹ, 2011 මැයි, 38 පිටුව.

කුමාරි කේ.ඩී.කේ.පී.; **හඳුන්නෙත්ති එස්. එම්. ;** සුරේශ් ටී. එස්.; සමරසිංහ කේ. Wistar මීයන් සම්බන්ධයෙන් *Aegle marmelos* වියලි පුෂ්ප නිෂ්කර්ෂකවල ප්‍රතිප්‍රදාහ බලපෑම : IBMBB සිව්වැනි වාර්ෂික විද්‍යාත්මක සැසිය, කොළඹ, 2011 මැයි, 24 පිටුව.

කුමාරි කේ.ඩී.කේ.පී.; **හඳුන්නෙත්ති එස්. එම්. ;** සුරේශ් ටී. එස්.; සමරසිංහ කේ. Wistar මීයන් සම්බන්ධයෙන් *Aegle marmelos* වියලි පුෂ්ප නිර්කර්ෂකවල හයිපොග්ලයිසෙමික් සහ ප්‍රතිප්‍රදාහ බලපෑම : ඖෂධීය ශාක සහ ශාක ඖෂධ පිළිබඳ තුන්වැනි අන්තර්ජාතික සම්මන්ත්‍රණයේ කටයුතු, 2011 දෙසැම්බර් 19-21, කොළඹ, ශ්‍රී ලංකාව, 39 පිටුව.

රණසිංහ ආර්. ඒ. සී. ආර්.; තෙන්නකෝන් කේ. එච්.; කරුණානායක ඊ.එච්.; ඇලන් එම්.; ෂෙරීෆ් ආර්.; සෙරීෆ් එම්.එච්. ආර්.; විජයවර්ධන එච්. ඒ : ශ්‍රී ලාංකික ජනගහනයේ I සහ II වැනි මයිටෝකෝන්ඩ්‍රියල් ඩී.එන්.ඒ. අධි විචල්‍ය කලාපවල ප්‍රභවාත්මක

බහුරූපතා අධ්‍යයනයක්; IBMBB සිව්වැනි වාර්ෂික විද්‍යාත්මක සැසිය, කොළඹ, 2011 මැයි, 14 පිටුව.

රත්නායක ඒ. ආර්. එම්. එන්. එන්. කේ.; සමරකෝන් එස්. ආර්. තාබ්‍රෑ එම්. අයි.: හෙපටොසෙලියුලර් කාසිනෝමා සෛල දාමයේ සජීවී ප්‍රවේණි අණු ප්‍රකාශනය : PCR ප්‍රශස්තකරණය. IBMBB සිව්වැනි වාර්ෂික විද්‍යාත්මක සැසිය, කොළඹ, 2011 මැයි, 42 පිටුව.

රොඩ්රිගෝ ඩබ්ලිව්. ඩබ්ලිව්. පී.; දසනායක ආර්. එස්.; **වීරසේන ඕ.වී.ඩී.එස්.ජේ.; කරුණානායක ඊ. එච්.** : *Setaria digitata* වල පරපෝෂිත නෙමටෝඩ විශේෂිත වර්ධක සාධක වැනි ප්‍රෝටීන කෙරෙහි Chaperone Mediated අධි ප්‍රකාශනය. IBMBB සිව්වැනි වාර්ෂික විද්‍යාත්මක සැසිය, කොළඹ, 2011 මැයි, 18 පිටුව.

සමරකෝන් එස්. ආර්. තාබ්‍රෑ එම්. අයි.; ගල්හේන පී. බී.; තෙන්නකෝන් කේ. එච්. ද සිල්වා ඊ. ඩී.: Bax සහ Bcl – 2 ප්‍රවේණි අණු විධිමත් කිරීම මගින් මානව හෙපටොසෙලියුලර් කාසිනෝමා සෛලවල (Hep G2) *Nigella sativa* (බීජ), *Hemidesmus indicus* (මුල්) සහ *Smilax glabra* (රයිසෝම) උත්තේජක ඇපොප්ටෝසිස් : ඉන්දියාවේ තමිල්නාඩු හි අන්නමලේ විශ්වවිද්‍යාලය විසින් සංවිධානය කරන ලද ස්වාභාවික නිෂ්පාදන සහ ජෛව වෛද්‍ය තාක්ෂණය පිළිබඳ අන්තර්ජාතික සම්මන්ත්‍රණය, 2011 ජනවාරි.

සමරකෝන් එස්. ආර්. තාබ්‍රෑ එම්. අයි.; ගල්හේන පී. බී.; තෙන්නකෝන් කේ. එච්. ද සිල්වා ඊ. ඩී.: මානව හෙපටෝමා (Hep G2) සෛලවල අර්බුද (අසාමාන්‍ය වැඩීම්) මර්දනය, සෛල වක්‍ර පාලනය සහ ඇපොප්ටෝසිස් හා සම්බන්ධ වන ප්‍රමුඛ ප්‍රවේණි අණු ප්‍රකාශනය කෙරෙහි *Nigella sativa* (බීජ), *Hemidesmus indicus* (මුල්) සහ *Smilax glabra* (රයිසෝම) වලින් සමන්විත කසායක ප්‍රමිතිගත සැකසුමක ED බලපෑම්. IBMBB සිව්වැනි වාර්ෂික විද්‍යාත්මක සැසිය, කොළඹ, 2011 මැයි, 22 පිටුව.

සමරකෝන් එස්. ආර්. තාබ්‍රෑ එම්. අයි.; ගල්හේන පී. බී.; තෙන්නකෝන් කේ. එච්.: මානව හෙපටොසෙලියුලර් කාසිනෝමා (Hep G2) සෛල කෙරෙහි *Nigella sativa* (බීජ), *Hemidesmus indicus* (මුල්) සහ *Smilax glabra* (රයිසෝම) අඩංගු සම්මත කසායකින් උත්තේජනය වූ ඇපොප්ටෝසිස්හි බලපෑම : 17 වැනි උතුරු ඇමරිකානු කලාපීය ISSX රැස්වීම; 2011 ඔක්තෝබර් මස ඇමෙරිකා එක්සත් ජනපදයේ ඇට්ලන්ටාහිදී.

සින්නතම්බි එස්.; ජයන්තිනි පී.; සුගතදාස බී.එච්.ආර්.කේ.; තෙන්නකෝන් කේ. එච්.; කරුණානායක ඊ. එච්. කුමාරසිරි ජේ.එම්. ; විජේසුන්දර ඒ.පී. ද එස්.: ගර්භණීභාවය නිසා හටගන්නා අධිරක්ත පීඩනය / පූර්ව ගැබ්වලිප්පුව ඇති මවුවරුන්ට උපදින නවජයින් තුළ ඇති H 19 බහුරූපකතාව; මූලික අධ්‍යයනයක්. IBMBB සිව්වැනි වාර්ෂික විද්‍යාත්මක සැසිය, කොළඹ, 2011 මැයි, 31 පිටුව.

සිරිසේන පී.ඩී.එන්.එන්.; වික්‍රමසිංහ එන්.කේ.ආර්. ඩී.; ද සිල්වා ඊ. ඩී.; රත්නසූරිය ඩබ්ලිව්. ඩී.; **හඳුන්නෙත්ති එස්. එම්. :** මානව නියුට්‍රොපිල්වල අන්තර් සෛල විනාශ කිරීමේ යන්ත්‍රණයන් අක්‍රියකරණය සහ *Vitex negundo* ජලීය ශාක නිෂ්කර්ෂකයේ ජෛව ක්‍රියාකාරීත්වයන්හි දීර්ඝ කාලීනතාව; IBMBB සිව්වැනි වාර්ෂික විද්‍යාත්මක සැසිය, කොළඹ, 2011 මැයි, 41 පිටුව.

යසස්නි එච්.ඩී.පී.; ජයන්තිනි පී.; සුගතදාස බී.එච්.ආර්.කේ.; තෙන්නකෝන් කේ.එච්. කරුණානායක ඊ.එච්.; කුමාරසිරි ජේ. එම්.; විජේසුන්දර ඒ.පී. ද එස්. : පූර්ව ගැබ් වලිප්පුව / ගර්භණීභාවය නිසා ඇති වන අධිරක්ත පීඩන අවස්ථාවලදී IGFJ ප්‍රවේණි බහුරූපතාවේ CA ප්‍රවර්ධකය; මූලික වාර්තාවක්: IBMBB සිව්වැනි වාර්ෂික විද්‍යාත්මක සැසිය, කොළඹ, 2011 මැයි, 30 පිටුව.

වික්‍රමසේකර එස්.; වීරකෝන් එස්. ආර්.; **වීරසේන ඕ.වී.ඩී.එස්.ජේ. :** *Brassica Juncea* සහ *Brassica oleracea* අතර සත්‍ය දෙමුහුන්භාවය සනාථ කිරීම සඳහා F1 දෙමුහුන් ශාකවල (triploids, ABC) අණුක විශ්ලේෂණය: IBMBB සිව්වැනි වාර්ෂික විද්‍යාත්මක සැසිය, කොළඹ, 2011 මැයි, 39 පිටුව.

1 වගුව - ක්‍රියාත්මකව පවතින දර්ශනපති (MPhil), දර්ශනසූරි (PhD) උපාධි පාඨමාලා සහ නව ලියාපදිංචි වීම් - 2011 වර්ෂය

පර්යේෂක ශිෂ්‍යයාගේ නම	ලියාපදිංචි වී ඇති උපාධිය සහ ආයතනය	නිබන්ධනයේ තාවකාලික මාතෘකාව	අධීක්ෂකයින්ගේ නම්
සුමදී ද සිල්වා	PhD – IBMBB	ශ්‍රී ලංකාවේ තෝරාගත් පියයුරු පිළිකා රෝගීන් කණ්ඩායමක පියයුරු පිළිකා ඇතිවීමේ හැකියාව ඇති BRCA 2 හි විකෘතතා සහ අනුක්‍රම විචල්‍යයන් ස්වභාව නිරූපණය	කේ. එච්. තෙන්නකෝන් ඊ. එච්. කරුණානායක
පී. ජයන්තිනි	PhD,IBMBB	ශ්‍රී ලංකාවේ ඉන්සියුලින් වැනි වර්ධන සාධක (IGF) - I සහ II ප්‍රවේණි දර්ශයන් සහ උපත් බර හා ඒවායේ සම්බන්ධය අධ්‍යයනය.	කේ. එච්. තෙන්නකෝන් ඊ. එච්. කරුණානායක
ආර්. ඒ. සී. ආර්. රණසිංහ	PhD – IBMBB	ශ්‍රී ලාංකික ජනගහනයේ මයිටො කොන්ඩ්‍රියල් DNA අධි විචල්‍ය කලා I හා II හි ප්‍රවේණි බහුරූපතාවන් පිළිබඳ අධ්‍යයනයක්	කේ. එච්. තෙන්නකෝන් ඊ. එච්. කරුණානායක මාරි ඇලන් (UU)
ජී. රාජ්කුමාර්	PhD – IBMBB	ශ්‍රී ලංකාවේ සහල් විශේෂවල ප්‍රවේණි විභේදනය සහ ශ්‍රී ලංකාවේ වල් සහ පැල වීවල ජෛව හා අජෛව ප්‍රතිරෝධයට හේතුකාරක වන ප්‍රවේණි හඳුනා ගැනීම.	ඕ. වී. ඩී. එස්. ජේ. වීරසේන කේ. කේ. එස්. ප්‍රනාන්දු (UOP)

එස්.එස්.ආර්. සමරකෝන්	PhD – IBMBB	Hep G2 සෛලවල NFKbB සහ P53 ප්‍රවේණි අණු ප්‍රකාශනය සම්බන්ධයෙන් සාම්ප්‍රදායික වෛද්‍ය විද්‍යාවේ භාවිත වන ඖෂධීය කසායක බලපෑම.	එම්. අයි. තාබaa කේ. එච්. තෙන්නකෝන්
බී. එච්. කේ. ආර්. සුගතදාස	PhD – IBMBB	පූර්ව ගැබ් වලිප්පු ටොක්සීමියා / ගර්භණීභාවය නිසා ඇති වන අධි රුධිර පීඩනය අනාවරණය කර ගැනීමේදී මාතෘක ලෙප්ටින් මට්ටම්, ද්‍රාව්‍ය ලෙප්ටින් ධාරකයේ සහ ලෙප්ටින් ප්‍රවේණි දර්ශකයේ පුරෝකථ්‍ය අගය	කේ. එච්. තෙන්නකෝන් ඊ. එච්. කරුණානායක
ආර්. ආර්. කුමාර	MPhil - IBMBB	Ixora coccinea, ශාක පත්‍රවල ප්‍රතිප්‍රදාහ බලපෑම් හඳුනා ගැනීම.	එස්. හඳුන්නෙත්ති ඩබ්ලිව්. ඩී. රත්නසූරිය (UOC) එස්. ඒ. දැරණියගල (UOC)
කේ. එස්. ප්‍රේමකුමාර	MPhil - IBMBB	අන්තෝ මාතෘක ක්‍රියාකාරීත්වය පිළිබඳ වැඩිදුර අධ්‍යයනයන්	කේ. එච්. තෙන්නකෝන් ඊ. එච්. කරුණානායක
පී. කේ. ඩී. පීරිස්	MPhil - IBMBB	AFLP සලකුණුකරණයන් භාවිතයෙන් සහ *Brassica napus* (කැනෝලා) සමඟ මුහුන් කිරීම මගින් ඒවායේ මේද අම්ල පැතිකඩ වෙනස් කිරීමෙන් ශ්‍රී ලංකාවේ අබ විශේෂයන් *(Brassica Juncea)* විභේදනය කිරීම.	ඕ. වී. ඩී. එස්. ජේ. වීරසේන එස්. ආර්. වීරකෝන් (OU)

එන්. එච්. එල්. ප්‍රදීපා	MPhil - IBMBB	කඳ දිලීරවල හේතුකාරකය වන *Macrophoma theicola Petch* වල DNA වංශ ජනනය, රූප අධ්‍යයන විද්‍යාව සහ ව්‍යාධි ජනකත්වය	එස්. අබේසිංහ (TRI) ඕ. වී. ඩී. එස්. ජේ. වීරසේන ආර්. විජේසුන්දර (UOC)
සුදේශිනි හේවගේ	MPhil - IBMBB	ශ්‍රී ලාංකික උපත් කාණ්ඩයක H 19 සහ IGA – II ප්‍රවේණි අණුවල තෝරාගන්නා ලද බහුරූපතාව : උපතේදී විශාලත්වය කෙරෙහි මාතෘ සහ නවජ ප්‍රවේණි දර්ශයේ බලපෑම.	කේ. එච්. තෙන්නකෝන්
කේ. එම්. මෙවන්	PhD, විද්‍යාපීඨය, කොළඹ විශ්වවිද්‍යාලය	RAPD සලකුණුකාරකයන් මගින් තක්සේරු කරන ලද, ශ්‍රී ලංකාවේ තේ ආබද්ධය පිළිබඳ ප්‍රවේණි විවිධත්වය	ඊ. එච්. කරුණානායක එස්. තිරිමාන්න (UOC) ජේ.එම්.ඩී.ටී. එවරඩ් (CRI)
ඩබ්ලිව්. ඩබ්ලිව්. ආර්. රොඩ්‍රිගෝ	MPhil, විද්‍යාපීඨය, කොළඹ විශ්වවිද්‍යාලය	එළු සහ බැටළු පරපෝෂිතය වන *Setaria digitata* සහ මානව බරවා පරපෝෂිතය වන *Wuchereria bancrofti* වලින් කල්පිත න්‍යෂ්ටික සෛල ආවරණය බඳු පරපෝෂිත නෙමටෝඩ වර්ධන සාධක ප්‍රෝටීනවල ව්‍යුහය සහ ඒවායේ කාර්යාත්මක ස්වභාව නිරීක්ෂණය.	ආර්. එස්. දසනායක (UOC) ඕ. වී. ඩී. එස්. ජේ. වීරසේන ඊ. එච්. කරුණානායක

ආර්. විජයසිංහ	MPhil - කොළඹ විශ්වවිද්‍යාලයේ පරිගණක පාසල	*Wuchereria bancrofti* හි ප්‍රෝටීන ව්‍යුහ පුරෝකථනයට ප්‍රවේශයක්	ඊ. එච්. කරුණානායක ඒ. ආර්. වීරසිංහ (UCSC) එරික් බොන්ග්කැම් රුඩ්ලෝෆ්(SLU)
බී. පී. ගල්හේන	PhD - කැලණිය විශ්වවිද්‍යාලය	ඖෂධීය ප්‍රතිකාරයක ප්‍රතිකාසිනෝජනීය යන්ත්‍රණයන් සහ විකිරණයෙන් හටගන්නා පටක තුවාල ආරක්ෂා කිරීමට එහි ඇති හැකියාව පිළිබඳ විමර්ශනයක්	එම්. අයි. තාබෲ කේ. එච්. තෙන්නකෝන්.
ඩී.ඒ.එස්. සිරිවර්ධන	PhD /පේරාදෙණිය විශ්වවිද්‍යාලය	*Bacillus thuringiensis* මගින් කෘෂිකාර්මික පලිබෝධ ජෛව විද්‍යාත්මකව පාලනය කිරීම.	ආර්. සමරසේකර (ITI) වී. කරුණාරත්න (UOP) ඕ.වී.ඩී.එස්.ජේ. වීරසේන
එම්. ඩී. ආර්.එල්. සිල්වා	MPhil, මොරටුව විශ්වවිද්‍යාලය	සහල්වල ජෛව සහ අජෛව ආතති ප්‍රතිරෝධය සඳහා ප්‍රවේණි අණු සහ අණුක සලකුණුකරණයන් හඳුනා ගැනීම සඳහා තුලනාත්මක අනුක්‍රමණ විශ්ලේෂණය සහ සංඛ්‍යා විද්‍යාත්මක ප්‍රවේශය	එන්. වික්‍රමරත්න (UOM) ඕ.වී.ඩී.එස්. ජේ.වීරසේන
වයි. එන්. සිල්වා	PhD / ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය	ප්‍රජනන වයස් කාණ්ඩයේ සිටින ශ්‍රී ලාංකික කාන්තාවන්ගේ වගා කරන ලද අන්තෝමාතෘක සෛල කෙරෙහි බැර ලෝහවල ඔසප්කාරක බලපෑම්	රෝෂිණී ජෝන් පීරිස් (USJP) එච්. සේනානායක (UOC) කේ. එච්. තෙන්නකෝන්

CRI : පොල් පර්යේෂණ ආයතනය; ITI : කාර්මික තාක්ෂණ ආයතනය;

RRI : රබර් පර්යේෂණ ආයතනය; TRI : තේ පර්යේෂණ ආයතනය ;

OU : විවෘත විශ්වවිද්‍යාලය; SLU : ස්වීඩන කෘෂිකාර්මික විශ්ව විද්‍යාලය ; UCSC : කොළඹ විශ්වවිද්‍යාලය, පරිගණක පාසල.

UOC : කොළඹ විශ්වවිද්‍යාලය; UOK : කැලණිය විශ්වවිද්‍යාලය; UOM : මොරටුව විශ්වවිද්‍යාලය; UOP: පේරාදෙණිය විශ්වවිද්‍යාලය; UOSJP : ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය; UU : උප්සලා විශ්වවිද්‍යාලය;

2 වගුව - පර්යේෂණ සඳහා අරමුදල් සම්පාදනය

අරමුදල් ලැබූ අය	ව්‍යාපෘතියේ නම	මූල්‍ය සම්පාදන ආයතනය	2011 දී ලබාදුන් අරමුදල්
මහාචාර්ය කමනී තෙන්නකෝන්	ශ්‍රී ලාංකිකයන්ගේ මයිටොකොන්ඩ්‍රියල් අධිවිචල්‍යතා කලාප I සහ II හි ප්‍රවේණි බහුරූපතා පිළිබඳ අධ්‍යයනයක්	ජාතික පර්යේෂණ සභාව *	රු. 1,297,871.31
මහාචාර්ය කමනී තෙන්නකෝන්	උපතේදී හෝමෝන ඌනතා සහිත ළමයින් කණ්ඩායමක වර්ධක හෝමෝනවල සහ වර්ධක හෝමෝන නිකුත් කරන හෝමෝන් ධාරකයේ විකෘතතා සහ අනුක්‍රමණ විචල්‍යතා පිළිබඳ ලක්ෂණ විභාගය	ජාතික විද්‍යා පදනම	රු. 423,638.72
ආචාර්ය ශිරෝමා හඳුන්නෙත්ති	ශ්‍රී ලංකාවේ ඖෂධීය ශාකවල ප්‍රතිප්‍රදාහක සහ මැලේරියා මර්දන බලපෑම්වල යන්ත්‍රණයන් සහ සක්‍රිය සංරචක හඳුනා ගැනීම.	ජාතික පර්යේෂණ සභාව*	රු. 284,523.65
මහාචාර්ය අයිරා තාබෲ	පර්යන්ත රුධිර ලිම්පොසයිට කෙරෙහි *Nigella Sativa, Hemidesmus indicus* ශාක කසාය මගින් ඇති කරනු ලබන Bleomycin ප්‍රේරිත Cryogenic හානි විකරණය සහ මානව හෙපටෝමා HepG2 සෛල කෙරෙහි එහි සෘජු සයිටො ධූලකතාව	ආයුර්වේද දෙපාර්තමේන්තුව	රු. 101301.90
පර්යේෂණ ප්‍රදානයන් සපයන ලද සමස්ත අරමුදල් ප්‍රමාණය **			රු. 2,107,335.58

* මේ ප්‍රදානයන් පාලනය කරනු ලබන්නේ ජාතික පර්යේෂණ සභාව විසිනි.

** රු. 1,200,000/= ක PhD ව්‍යාපෘතියක් සඳහා තේ පර්යේෂණ ආයතනයෙන් සපයන ලද ද්‍රව්‍යය ද; රු. 878,000/= ක PhD ව්‍යාපෘතියක් සඳහා ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය (රු. 638,000/=) සහ ප්‍රජනන සෞඛ්‍ය පර්යේෂණ සඳහා ජාතික සම්බන්ධීකරණ කමිටුව (රු. 240,000/=) මගින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් සපයන ලද ද්‍රව්‍යය ද ඇතුළත් නොවේ.

3 වගුව : විද්‍යාපති (MSc) නිබන්ධන - 2011

ශිෂ්‍යයාගේ නම	ස්ත්‍රී පුරුෂ භාවය	ඇතුළත් වූ වර්ෂය	අධ්‍යයන කටයුතු අවසන් කළ වර්ෂය	උපාධි පාඨමාලාව	නිබන්ධනයේ / උපාධි නිබන්ධනයේ මාතෘකාව
ආර්. එම්. එල්. තන්තිරිගේ	ස්ත්‍රී	2008	2011	MSc/MLS	ශ්‍රී ලංකාවේ කොස් විශේෂ *(Artocarpus heterophyllus Lam)* හඳුනා ගැනීම සඳහා විශේෂිත AFLP සලකුණුකරණයන් වැඩි දියුණු කිරීම.
එස්.අයි.සී. සිල්වා	ස්ත්‍රී	2008	2011	MSc/MLS	රූපවේදය සහ AFLP සලකුණුකරණයන් භාවිත කරමින් ශ්‍රී ලංකාවේ තෝරාගන්නා ලද *Piper nigrum* (කළු ගම්මිරිස්) cultivar හි ප්‍රභේදනය
ජ්. එම්. ඩී. එස්. ඩී. ද සිල්වා	ස්ත්‍රී	2009	2011	MSc/ CMI	නියුට්‍රොෆිල් රසායනික සාර්වසරණය (chemotaxis) කෙරෙහි *Ixora cocainea* සහ *Vitex neguudo* ජලීය ශාක නිෂ්කර්ෂවල බලපෑම පිළිබඳ අධ්‍යයනයන්.
ආර්. තිප්පලගම	ස්ත්‍රී	2009	2011	MSc/ CMI	PCR සහ ශ්‍රී ලංකාවේ අනුක්‍රමණය මගින් HLA typing MHC I වන පන්තියේ අණු.
කේ. වී. පී. කේ. බණ්ඩාර	පුරුෂ	2010	ක්‍රියාත්මකයි.	MSc/ MLS	BRCA 2 ප්‍රවේණි අණුවේ ව්‍යාධිජනක විකෘතියක් සඳහා ඩිම්බ පිළිකා රෝගීන් පරිලෝකනය කිරීම.
එම්. ඩී. එම්. ප්‍රනාන්දු	ස්ත්‍රී	2010	2011	MSc/ MLS	වර්ධක හෝමෝන ඌනතාව සහිත ළමයින් තුළ වර්ධක හෝමෝන නිකුත් කරන හෝමෝන ධාරකයේ (GHRH – R) විකෘතතා සහ අනුක්‍රමණ විචල්‍යතා - මූලික අධ්‍යයනයක්.

එන්. කාන්ත කුමාරන්	පුරුෂ	2010	ක්‍රියාත්මකයි.	MSc/ MLS	ශ්‍රී ලංකාවේ *Anopheles subpictus* අභ්‍යන්තර සහ වෙරළබඩ ගහනයන් හි අණුක ලක්ෂණ විභාගය : මයිටොකෝන්ඩ්‍රියල් DNA පාදක විශ්ලේෂණයක්.
කේ. එච්. ටී. කරුණාරත්න	පුරුෂ	2010	2011	MSc/ MLS	පළිබෝධ නාශක ප්‍රතිරෝධී සහග්‍රාහී (susceptible) සහල් විශේෂ හඳුනා ගැනීම සඳහා අණුක සලකුණුකරණයන් වැඩි දියුණු කිරීම.
යූ. ජී.අයි.යූ. කාරියවසම්	ස්ත්‍රී	2010	2011	MSc/ MLS	වර්ධක හෝමෝන ඌනතාව සහිත ළමයින්ගේ වර්ධක හෝමෝන විකෘතතා සහ අනුක්‍රමණ විචල්‍යතා - මූලික අධ්‍යයනයක්
ඊ.පී.එම්. කේශව	පුරුෂ	2010	2011	MSc/ MLS	ශ්‍රී ලංකාවේ පරණ රෝපණ තේවල *(Camellia sinensis* L) ප්‍රභවාත්මක විවිධත්වය විශ්ලේෂණය කිරීම සඳහා ක්ෂුද්‍ර චන්ද්‍රිකා සලකුණු කරණයන් භාවිතය
එස්. බී. කොටිගල	පුරුෂ	2010	2011	MSc/ MLS	අන්තෝමාතෘක කාසිනෝමා සෛලවල Caspace-3 සහ Caspace – 9 ප්‍රකාශනය කෙරෙහි ශාක නිෂ්කර්ෂකයක බලපෑම.
ඩබ්ලිව්. ඒ. එම්. පීරිස්	ස්ත්‍රී	2010	2011	MSc/ MLS	ශ්‍රී ලංකාවේ සාම්ප්‍රදායික සහල් විශේෂවල Badh 2 locus හි ඇලිල විවිධත්වය හඳුනා ගැනීම.
ජී.එල්.අයි.එම්. ප්‍රේමතිලක	ස්ත්‍රී	2010	2011	MSc/ MLS	අන්තෝමාතෘක කාසිනෝමා සෛලවල BCI-2 සහ Bax ප්‍රකාශනය කෙරෙහි ශාක නිෂ්කර්ෂකයක බලපෑම.
බී. සැන්වෙව්	ස්ත්‍රී	2010	ක්‍රියාත්මකයි.	MSc/ MLS	සෙලියුලෝස් අවක්‍රමණ දිලීරවල අණුක ලක්ෂණ විභාගය සහ සෙලියුලෝස් නිෂ්කර්ෂණය සහ පවිත්‍රකරණය

එන්.එච්.කේ.එස්. සේනාතිලක	පුරුෂ	2010	2011	MSc/ MLS	*Setaria digitata* cDNA ලේඛනාගාරයකින් ලබා ගන්නා ලද තෝරා ගත් ක්ලෝන පිළිබඳ ලක්ෂණ විභාගය
බී. සින්තනයි සෙල්වන්	ස්ත්‍රී	2010	ක්‍රියාත්මකයි.		මයිටොකෝන්ඩ්‍රියල් haplogroups පිළිබඳ මූලික විශ්ලේෂණයක්
ඊ. ජේ. ඉයුජින්	ස්ත්‍රී	2010	2011	MSc/ CMI	ලෙප්ටොස්පයිරෝසිස් පිළිබඳ මස්තුවේදීය රෝග විනිශ්චය ක්‍රම සැසඳීම.
එස්. ඩී. කොතලාවල	ස්ත්‍රී	2010	2011	MSc/ CMI	*Coriandrum sativuum* L සහ *Coscinium fenestratum* L මිශ්‍රිත උණු දිය නිෂ්කර්ෂකයක ප්‍රතිශක්ති අනුකූලක ක්‍රියාකාරීත්වය.
එම්.ජේ.ආර්. නිලූෂා	ස්ත්‍රී	2010	2011	MSc/ CMI	නිතර නිතර ආසාදනයන් සිදු වන රෝගීන්ගේ විශේෂිත ප්‍රතිදේහ ඌනතාව නිශ්චය කිරීම සඳහා ටෙටනස් ටොක්සොයිඩ් එන්නත් කිරීමෙන් පසු මස්තු පරිවර්තනය.
වයි. එස්. වාහලතන්ත්‍රී	ස්ත්‍රී	2010	2011	MSc/ CMI	*Wallidda antidysenterica (Wrightia antidysenterica)* L ජලීය ශාක නිෂ්කර්ෂකයක් (APE) මීයන් තුළ ඇති කරන ප්‍රතිප්‍රදාහ ක්‍රියාකාරීත්වය.
එස්. ඒ. වික්‍රමසිංහ	ස්ත්‍රී	2010	2011	MSc/ CMI	උග්‍ර ලෙප්ටොස්පයිරෝසිස් රෝගීන් තුළ ඇති ඔක්සිකාරක ආතතිය තක්සේරු කිරීම.

වාර්ෂික විද්‍යාත්මක සැසිවාරයේ ආරම්භය

උපකුලපතිතුමිය සභාව අමතමින්

මහාචාර්ය ස්ටැන්ලි විජේසුන්දර අනුස්මරණ දේශන

ආරම්භක අධ්‍යක්ෂ විසින් මහාචාර්ය දිලිප් ද සිල්වා මහතා වෙත තිළිණ ප්‍රදානය කරමින්

මහාචාර්ය දිලිප් ද සිල්වා මහතා අනුස්මරණ දේශනය පවත්වමින්

ආචාර්ය එරික් බොංග්කාමි රුඩ්ලොෆ් මහතා විසින් පූර්ණ සාමාජික දේශණය පවත්වමින්

සහතිකපත්‍ර පාඨමාලාව

බෝවන රෝග පිළිබඳ සම්මන්ත්‍රණය

ජෛව රසායන, අණුක ජෛවවේද හා ජෛව තාක්ෂණ ආයතනය

කොළඹ විශ්වවිද්‍යාලය

2011 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය

(සංඛ්‍යා ආසන්නතම රුපියලට ගලපා ඇත.)

		2011	2010
		රු.	රු.
		ශු. පො.අ.	ශු. පො. අ.
<u>ප්‍රවර්තන නොවන වත්කම්</u>	සටහන - 02		
ගෘහභාණ්ඩ හා කාර්යාල උපකරණ		3,412,264	3,199,235
පරිගණක		1,386,855	1,108,928
රසායනාගාර සහ ඉගැන්වීමේ උපකරණ		8,472,982	4,412,297
වැද්දුම් හා සවිකිරීම්		143,835	56,619
රසායනාගාර මෙවලම්		191,673	244,052
පුස්තකාල පොත් හා වාර ප්‍රකාශන		577,339	449,857
		14,184,948	9,470,988
ආයෝජන - පැවරුම් අරමුදල		2,186,620	1,988,872
		16,371,568	**11,459,860**
<u>ප්‍රවර්තන වත්කම්</u>			
ආයෝජන	සටහන - 03	9,001,374	11,837,273
කාර්ය මණ්ඩල ණය	සටහන - 04	1,999,146	1,330,104
අත්තිකාරම් ගිණුම		968,444	3,840,351
වෙනත් ලැබීම්	සටහන - 05	75,349	102,200
කාල තැන්පතුවල ආයෝජන	සටහන - 06	2,024,296	1,750,000
බැංකු ශේෂ	සටහන - 07	16,648,842	6,019,792
		30,717,451	**24,879,720**
මුළු වත්කම්		**47,089,019**	**36,339,580**

ජෛව රසායන, අණුක ජෛවවේද හා ජෛව තාක්ෂණ ආයතනය

කොළඹ විශ්වවිද්‍යාලය

2011 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය (ඉතිරි)

		2011	2010
		රු.	රු.
ප්‍රාග්ධනයෙන් මූල්‍ය සම්පාදනය කරන ලද			
වියදම් කරන ලද ප්‍රාග්ධන ප්‍රදානය	සටහන - 08	7,681,819	5,171,750
වියදම් නොකරන ලද ප්‍රාග්ධන ප්‍රදානය		8,974,690	4,644,778
ත්‍යාග හා පරිත්‍යාග		1,774,239	2,742,512
		18,430,748	**12,559,040**
සංචිත			
ආදායම් හා වියදම් ගිණුම		13,068,932	11,991,357
සීමාකරන ලද අරමුදල්			
පැවරුම් අරමුදල		2,262,592	2,064,843
පර්යේෂණ ප්‍රදානයන්	සටහන - 09	3,182,388	2,123,856
ආයතන සංවර්ධන අරමුදල		1,347,755	892,901
2010 විද්‍යාපති පර්යේෂණ ව්‍යාපෘති		2,200,000	1,922,500
		8,992,735	**7,004,100**
ප්‍රවර්තන බැරකම්			
උපචිත වියදම්		2,302,102	1,985,345
පාරිතෝෂිත සඳහා ප්‍රතිපාදන	සටහන - 10	3,126,703	1,725,127
ආපසු ගෙවිය යුතු රසායනාගාර තැන්පතු		1,096,000	989,000
ආපසු ගෙවිය යුතු වෙනත් තැන්පතු		71,800	85,610
		6,596,605	**4,785,083**
		47,089,019	**36,339,580**

ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී විසින් සකස්කොට සහතික කරන ලදී. : ……………………

පාලක මණ්ඩලය සඳහා සහ වෙනුවෙන්

…………………………

අධ්‍යක්ෂ

ජෛව රසායන, අණුක ජෛවවේද හා ජෛව තාක්ෂණ ආයතනය

කොළඹ විශ්වවිද්‍යාලය

2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂයේ

ආදායම් හා වියදම් ගිණුම

(සංඛ්‍යා ආසන්නතම රුපියලට ගලපා ඇත.)

		2011	2010
		රු.	රු.
ආදායම			
පුනරාවර්තන වියදම් සඳහා රජයේ ප්‍රදානය		34,010,806	25,150,000
ප්‍රාග්ධන වත්කම් පුනරුත්ථාපනය සඳහා රජයේ ප්‍රදානය		1,577,500	1,050,000
ප්‍රදානය කරන ලද වත්කම් ක්‍රමක්ෂය කිරීම		3,066,896	10,358,589
පර්යේෂණ ප්‍රදානයන්	සටහන - 11	207,625	5,841,715
ඉපැයූ ආදායම	සටහන - 12	3,719,667	3,007,295
පොලී ආදායම		687,851	917,291
වෙනත් ආදායම්	සටහන - 13	240,955	425,830
		43,511,299	**46,750,720**
අඩුකළා : වියදම්			
පුද්ගල පඩිනඩි	සටහන - 14	13,436,767	10,992,460
ගමන් වියදම්		312,132	1,264,956
සැපයුම්	සටහන - 15	7,581,235	10,317,486
නඩත්තු වියදම්	සටහන - 16	5,698,930	4,412,672
ගිවිසුම්ගත සේවා	සටහන - 17	10,942,747	9,957,444
වෙනත් පුනරාවර්තන වියදම්	සටහන - 18	1,327,426	954,432
ආයතන සංවර්ධන අරමුදල	සටහන - 19	419,115	698,433
ක්ෂය වීම්		3,335,609	10,521,609
		43,053,960	**49,119,492**
වියදමට වැඩි ආදායම් අතිරික්තය		**457,339**	**(2,368,772)**

ආදායම් හා වියදම් විසර්ජන ගිණුම

ආදායම් හා වියදම් ගිණුමෙන් ඉ.ගෙ. ශේෂය	457,339	-2,368,772
ආදායම් හා වියදම් ගිණුමේ ඉ.ගෙ. ශේෂය	11,991,357	14,358,964
කලින් වර්ෂය සම්බන්ධයෙන් ගැලපීම්	620,236	1,165
ශේෂ පත්‍රයට ඉ/ගෙ ශේෂය	**13,068,932**	**11,991,357**

ජෛව රසායන, අණුක ජෛවවේද හා ජෛව තාක්ෂණ ආයතනය

කොළඹ විශ්වවිද්‍යාලය

2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය

	රු.	රු.
වර්ෂයේ අතිරික්තය	**457,339**	-
එකතුකළා: අරමුදල් සංචලනය නොමැති අයිතම සඳහා ගැලපීම		
පාරිතෝෂිත සඳහා ප්‍රතිපාදන	1,401,575	
ආයෝජනයෙන් පොලිය	(687,851)	
ක්ෂයවීම	268,713	
පූර්ව වර්ෂ ගැලපීම්	620,236	
කාරක ප්‍රාග්ධන වෙනස්කම්වලට පෙර මෙහෙයුම් අතිරික්තය	2,060,013	
ලැබිය යුතු ප්‍රමාණයන්හි අඩුවීම	2,229,716	
ගෙවිය යුතු ප්‍රමාණයන්හි වැඩිවීම	409,947	
මෙහෙයුම් කටයුතු වලින් ශුද්ධ මුදල් ප්‍රවාහය		**4,699,676**
ආයෝජන ක්‍රියාකාරීත්වයන්ගෙන් මුදල් ප්‍රවාහයන්		
ස්ථාවර වත්කම් අත්කර ගැනීම	(7,750,965)	
ආයෝජනවල අඩුවීම	2,638,150	
ආයෝජනවලින් පොලිය	687,851	
		(4,424,964)
මූල්‍ය ක්‍රියාකාරීත්වයන්ගෙන් මුදල් ප්‍රවාහයන්		
ප්‍රාග්ධන වියදම් සඳහා රජයේ ප්‍රදානය	8,640,000	
සීමාකරන ලද අරමුදල්	1,988,634	
		10,628,634
		10,903,346
සමරූපී මුදල්වල ශුද්ධ වැඩිවීම		
කාලසීමාව ආරම්භයේදී මුදල් හා සමරූපී මුදල්		7,769,792
කාලසීමාව අවසානයේදී මුදල් හා සමරූපී මුදල්		**18,673,138**

ජෛවරසායන, අණුක ජෛව වේද හා ජෛවතාක්ෂණ ආයතනය,
කොළඹ විශ්වවිද්‍යාලය

මූල්‍ය ප්‍රකාශ පිළිබඳ සටහන්

1. ප්‍රමුඛ ගිණුම් ප්‍රතිපත්ති

1.1 වාර්තා කරන ආයතනය

2003 අප්‍රේල් 23 වැනි දින ගැසට් පත්‍රයේ පළ කරන ලද අංක 1285/25 දරන ආඥාපනත යටතේ ජෛව රසායන, අණුක ජෛව වේද හා ජෛව තාක්ෂණ ආයතනය (IBMBB) සංස්ථාගත කරනු ලැබ ඇත. එහි ප්‍රධාන පරිපාලනය සිදු වනුයේ කොළඹ 03, කුමාරතුංග මුනිදාස මාවතේ අංක 90 දරන ස්ථානයෙහිය. 2011.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා IBMBB මූල්‍ය ප්‍රකාශය සකස් කරනු ලැබ ඇත.

1.2 සකස් කිරීමේ පදනම

මූල්‍ය ප්‍රකාශන සකස් කරනු ලැබ ඇත්තේ වත්කම් අත්පත් කරගත්, බැරකම් සිදු වූ සහ අරමුදල් ලබාගත් දිනවලට පැවැති අගයන් අනුව හුවමාරු කිරීම් වාර්තා කිරීම සිදු වන අයුරින්, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් හඳුන්වා දෙනු ලැබ ඇති පොදුවේ පිළිගැනෙන ගිණුම් මූලධර්මවලට හා ගිණුම් ප්‍රමිතීන්ට අනුකූලව ගිණුම් තැබීමේ ඓතිහාසික පිරිවැය පදනම මත ය.

කාර්ය බද්ධ සහ ඉදිරිපත් කිරීමේ ව්‍යවහාර මුදල වන ශ්‍රී ලංකාවේ රුපියල්වලින් මූල්‍ය ප්‍රකාශ සකස් කරනු ලැබේ. අදාළ වර්ෂයේ ඉදිරිපත් කිරීම හා සැසඳීම පිණිස, කලින් වර්ෂයට අදාළ සංඛ්‍යා සහ යෙදුම් අවශ්‍ය අවස්ථාවලදී නැවත ප්‍රකාශ කරනු ලැබේ.

1.3 විදේශ ව්‍යවහාර මුදල් පරිවර්තනය කිරීම

විදේශ ව්‍යවහාර මුදල් ගනුදෙනු සියල්ල ගිණුම්ගත කර ඇත්තේ ගනුදෙනු සිදු වූ අවස්ථාවේදී පැවැති විනිමය අනුපාත අනුව ය. එවැනි ගනුදෙනු පියවීමෙන් සහ විදේශ ව්‍යවහාර මුදල්වලින් මූලික වශයෙන් සිදු වන මූල්‍ය වත්කම්වලින් හා බැරකම්වලින් ඇති වන ලාභ හා පාඩු ආදායම් ප්‍රකාශනයේදී පිළිගනු ලැබ ඇත. විදේශ ව්‍යවහාර මුදල්වලින් මූලික වශයෙන් සිදු වන මූල්‍ය වත්කම් හා බැරකම්, ශේෂ පත්‍ර දිනට පවත්නා විනිමය අනුපාත අනුව පරිවර්තනය කරනු ලැබේ.

1.4 වත්කම් සහ ඒවා තක්සේරු කිරීමේ පදනම්

1.4.1 දේපළ, යන්ත්‍රාගාර සහ උපකරණ

දේපළ, යන්ත්‍රාගාර සහ උපකරණ වාර්තා කරනු ලබන්නේ ඒවායේ කවර හෝ ආනුෂංගික වියදම් ද සමඟ මිලදී ගැනීමේ පිරිවැයට ය. වත්කම් ප්‍රකාශ කරනු ලබන්නේ සමුච්චිත ක්ෂය වීම අඩු කොට පිරිවැයට ය. ප්‍රදානයන් වශයෙන් ලැබුණු වත්කම් ඒවායේ සාධාරණ වටිනාකමට අගය කරනු ලැබ ඇත.

1.4.2 ක්ෂය වීම

වත්කමක පවත්වාගෙන යෑමේ ප්‍රමාණය එයින් ලබාගත හැකි ප්‍රමාණයට වහා ම ලියා අඩු කරනු ලබන අතර එවැනි අඩු කිරීමක් වියදමක් වශයෙන් වහා ම ගණන් ගනු ලැබේ.

1.4.3 ක්‍රමක්ෂය කිරීම.

ආදායම් ප්‍රකාශයේදී ක්ෂයවීම පිළිගනු ලබන්නේ වත්කම්වල ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් කාල සීමාව තුළ සෘජු රේඛීය පදනමක් මතය.

1.4.4 බැහැර කිරීමේදී ලාභය හෝ පාඩුව

බැහැර කිරීමේදී ලාභ සහ පාඩු නිගමනය කරනු ලබන්නේ ලැබෙන ප්‍රමාණය පවත්වාගෙන යෑමේ ප්‍රමාණය සමඟ සැසඳීමෙනි. ඒවා ආදායම් ප්‍රකාශනයේ ඇතුළත් වේ.

1.4.5 පසුව ඇතිවන පිරිවැය

පසුව ඇතිවන පිරිවැය වත්කමේ පවත්වාගෙන යෑමේ ප්‍රමාණයට ඇතුළත් කරනු ලැබේ. නැතහොත්, අයිතමවල අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලැබීමට හැකියාවක් ඇත්නම් සහ අයිතමවල පිරිවැය විශ්වසනීය ලෙස මැනිය හැකිනම් පමණක්, සුදුසු පරිදි වෙන ම වත්කමක් වශයෙන් ඇතුළත් කරනු ලැබේ. අනෙකුත් සියලු ම අලුත්වැඩියාවන් හා නඩත්තු කිරීම්, ඒවා සිදු වන මූල්‍ය කාලසීමාව තුළ ආදායම් ප්‍රකාශනයෙන් අඩු කරනු ලැබේ.

1.4.6 ක්ෂය වීම

මිලදී ගත් දිනයන් දන්නා වත්කම්වල ක්ෂය වීම දක්වනු ලබන්නේ සම්පූර්ණ කරන ලද මාස ගණනකට හෝ මිලදී ගත් දිනයේ සිට එවැනි වත්කම් භාවිත කරනු ලැබූ මාස ගණනට සමානුපාතිකවය. මිලදී ගත් නියම දිනය නොදන්නා වත්කම් සම්බන්ධයෙන් ක්ෂයවීම ගණන් ගනු ලබන්නේ ඒවා මිලදී ගත් සම්පූර්ණ වර්ෂයටය. වත්කම්වල ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් ආයු කාලයේදී වත්කම්වල මාස

ගණනට සමානුපාතිකව විකිණීමේ / බැහැර කිරීමේ වර්ෂය තුළ ක්ෂයවීම සඳහා ප්‍රතිපාදන සලසනු ලැබේ.

පහත දැක්වෙන පරිදි සියලු ම දේපළවල සහ උපකරණවල ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් ආයු කාලයන් තුළ පිරිවැය කපා හැරීම සඳහා ක්ෂයවීම පහත දැක්වෙන ප්‍රමාණවලින් ආදායම් ප්‍රකාශයෙන් අඩු කරනු ලැබේ :

ක්ෂය කිරීමේ අනුපාත

වැද්දුම් සහ සවිකිරීම්	වර්ෂයකට 10%
කාර්යාල භාණ්ඩ හා උපකරණ	වර්ෂයකට 10%
පරිගණක	වර්ෂයකට 20%
රසායනාගාර සහ ඉගැන්වීමේ උපකරණ	වර්ෂයකට 20%
රසායනාගාර මෙවලම්	වර්ෂයකට 20%
පුස්තකාල පොත් සහ වාරසඟරා	වර්ෂයකට 20%

1.5 ආදායම් හා වියදම්

1.5.1. රජයේ ප්‍රදානය

වර්ෂය සඳහා ලැබුණු සමස්ත ප්‍රාග්ධන ප්‍රදානය රු. මි.10.217 ක් විය. වර්ෂයේ මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා භාවිත කරන ලද ප්‍රදානයන් රු.මි. 4.31 ක් වූ අතර එය ආදායමක් වශයෙන් ආදායම් ප්‍රකාශයේ පිළිගෙන ඇත.

1.5.2 ආදායම් පිළිගැනුම

(අ) රජයේ ප්‍රදානයන් (පුනරාවර්තන)

රජයේ පුනරාවර්තන ප්‍රදානයන් පිළිගනු ලබන්නේ ඒවා ලැබෙන කාල සීමාව තුළය.

(ආ) රජයේ ප්‍රදානයන් (ප්‍රාග්ධන)

දේපළ හා උපකරණ මිල දී ගැනීමට අදාල ප්‍රදානයන් විලම්බිත ආදායම වශයෙන් ජංගම නොවන බැරකම්වලට ඇතුළත් වන අතර අදාළ වත්කම්වල අපේක්ෂිත ආයු කාලය තුළ ඍජු රේඛීය පදනමකින් ආදායම් ප්‍රකාශයට ඇතුළත් කරනු ලැබේ.

(ඇ) **ශිෂ්‍ය ලියාපදිංචිය**

ශිෂ්‍ය ලියාපදිංචි ගාස්තු ආදායමක් වශයෙන් පිළිගනු ලබන්නේ ගාස්තු ලැබීමෙන් පසුව පමණි.

(ඇ) **පාඨමාලා ගාස්තු**

පාඨමාලා ගාස්තු ගණන් ගනු ලබන්නේ ඒවා පැවැත්වෙන කාලසීමාව තුළය. විවිධ මූල්‍ය කාලසීමාවන්ට වෙන් කිරීම සඳහා ප්‍රමාණවත් තොරතුරු නැති අවස්ථාවලදී මුදල් පදනමක් මත ආදායම් වශයෙන් ගාස්තු ගණන් ගනු ලැබේ.

(ඉ) **ආයෝජන ආදායම**

ආයෝජනවලින් ලත් පොලී ආදායම උපචිත පදනමක් මත ගණන් ගනු ලැබේ.

1.6 ලැබිය යුතු මුදල්

ලැබිය යුතු මුදල් ප්‍රකාශ කරනු ලබන්නේ ඒවායින් ලබා ගැනීමට ඇස්තමේන්තු කර ඇති ප්‍රමාණයන්ට ය.

1.7 මුදල් හා මුදල්වල සාම්‍යයන්

මුදල් හා මුදල් වල සාම්‍යයන් සමන්විත වන්නේ මුදල් හා බැංකු ශේෂ සහ කෙටි කාලීන ආයෝජන යන ඒවායිනි.

1.8 ජංගම වත්කම්

ශේෂ පත්‍රයේ වර්ගීකරණය කර ඇති ජංගම වත්කම් වන්නේ ශේෂ පත්‍ර දිනයෙන් පසු එක් වසරක් තුළ දී අයකර ගනු ලබන ඒවාය.

1.9 ජංගම බැරකම්

ශේෂ පත්‍රයේ ජංගම බැරකම් වශයෙන් වර්ගීකරණය කර ඇති බැරකම් වන්නේ ශේෂ පත්‍ර දිනයෙන් පසු එක් වසරක් තුළදී ආපසු ගෙවිය යුතු බැරකම්ය. දන්නා සියලු බැරකම් අවසන් ප්‍රකාශ සකස් කිරීමේදී ගණන් ගනු ලැබ ඇත.

1.10 මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

මුදල් ප්‍රවාහ ප්‍රකාශන සකස් කරනු ලැබ ඇත්තේ මුදල් ප්‍රවාහ ප්‍රකාශ පරමාර්ථය සඳහා "වක්‍ර ක්‍රමය" භාවිත කරමිනි. මුදල් හා මුදල් සාම්‍යයන් සමන්විත වන්නේ මුදල් හා බැංකු ශේෂ හා කෙටි කාලීන තැන්පතු යනාදියෙනි.

1.11 සේවක ප්‍රතිලාභ

(අ) නිර්වචනය කරන ලද ප්‍රතිලාභ සැලසුම්

1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීමේ පනත යටතේ අදාළ අනුපාතයන්ට විශ්‍රාම පාරිතෝෂික ගෙවීම සඳහා ගිණුම්වල ප්‍රතිපාදන සලසනු ලැබේ. පනත යටතේ පාරිතෝෂික ගෙවීම් සඳහා සුදුසුකම් ලැබීම පිණිස සේවකයන් අවම වශයෙන් අවුරුදු පහක අඛණ්ඩ සේවා කාලයක් සම්පූර්ණ කළ යුතු වුව ද, සියලු ම සේවකයන් අඩු වශයෙන් අවුරුදු පහක් සේවයේ යෙදී සිටීමට අදහස් කරන්නේය යන උපකල්පනය මත සේවා නියුක්තිය ආරම්භයේදී ම ප්‍රතිපාදන සලසනු ලැබේ.

(ආ) නිර්වචනය කරන ලද දායකත්ව සැලසුම් - විශ්වවිද්‍යාල අර්ථ සාධක අරමුදල සහ සේවක භාරකර අරමුදල

සේවකයෝ විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලේ සහ සේවක භාර අරමුදලේ සාමාජිකයෝ වෙති. නිර්වචනය කරන ලද දායක සැලසුම්, විශ්වවිද්‍යාල අර්ථ සාධක අරමුදල සහ සේවක භාරකාර අරමුදල යන අරමුදල්වලට කරනු ලබන දායකවීම්, සිදු කරන ලද වියදමක් වශයෙන් ආදායම් ප්‍රකාශනයේ ගණන් ගනු ලැබේ.

ජෛව රසායන, අණුක ජෛව වේද හා ජෛවතාක්ෂණ ආයතනය

විගණන කමිටුවේ වාර්ෂික වාර්තාව - 2011

2011 දී විශේෂ රැස්වීම් 1 ක් සහ තවත් රැස්වීම් 4 ක් විගණන කමිටුව විසින් පවත්වන ලදී. නිර්ණේය විෂයයන් (Terms of Reference) PED/31 අනුව විය.

1. එක් වර්ෂයකට වඩා කල් ගත වන ස්වයං මූල්‍ය සම්පාදන පාඨමාලා IBMBB ආයතනයේ ක්‍රියාත්මක වේ. ඒ නිසා විශේෂයෙන් ම පර්යේෂණ ව්‍යාපෘති කාර්යයන් සඳහා මූල්‍ය සම්පාදනය පිණිස අරමුදල් පවත්වාගෙන යා යුතුව තිබේ. මුදල් ආයෝජනය කිරීම සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලබාගත යුතුව තිබුණත් අවාසනාවකට මෙන් ආයෝජන සිදු කරන ලද්දේ භාණ්ඩාගාරයෙන් පිළිතුරක් ලැබීමට කලිනි. ඒ පිළිතුර තවමත් ලැබී නැත.
2. සේවක සංඛ්‍යාවේ දැඩි ඌනතාවක් පවතින නිසා ආයතනික සැලැස්මේ සමහර අයිතමයන් ක්‍රියාත්මක කළ නොහැකි විය.
3. වටිනා කාලය වැයවන පහත දැක්වෙන දුෂ්කරතා කළමනාකාරීත්වය විසින් පෙන්වා දෙනු ලැබ තිබේ:

   (i) වහල ආවරණය අලුත්වැඩියා කිරීම වැනි ගැටලු:

   (ii) පරිසර දූෂණය සහ අමතර මූල්‍ය බරක් ඇති කරමින් ආපනශාලාවේ අප ජලය IBMBB පරිශ්‍රයට ගලා යෑම.

එහි අවසන් ප්‍රතිඵලය වී ඇත්තේ කාර්ය මණ්ඩලයේ සිටින එක ම මහාචාර්යවරයා වන අධ්‍යක්ෂවරයාට තිබෙන වඩා වැදගත් ශාස්ත්‍රීය හා පරිපාලන කටයුතුවලින් බැහැරව වෙනත් කාර්යයන් කෙරෙහි ඔහුගේ අවධානය යොමු කරන්නට සිදු වීමය. එය ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරවරයාට ද අමතර බරක් වී තිබේ. ඉහළ රාජකාරි වගකීම් පැවරී ඇති ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී තනතුර ද ඊට පිටිවහලක් නොවීය.

ඒ සියල්ලේ ම සත්‍ය තත්ත්වය වන්නේ ඉතා ඉහළ මට්ටමක යටිතල ව්‍යුහයන්ගෙන් IBMBB ආයතනය සමන්විත වුව ද, ශ්‍රී ලංකාව සමඟ ඇති ද්විපාර්ශවික ගිවිසුම අවසන් වීම නිසා ස්විඩන අරමුදල් නොලැබීමත්, දැඩි ලෙස අප්‍රමාණවත් සේවක සංඛ්‍යාව සහ විශේෂයෙන් ම උපකරණ යාවත්කාල කිරීම සඳහා භාණ්ඩාගාර අරමුදල් ප්‍රමාණවත් නොවීමත් නිසා, උපරිම ධාරිතාව කරා ළඟා වීමට ආයතනයට බාධක එල්ල වීමය.

සේවක සංඛ්‍යා වෙන් කිරීමේදී දුර්මතය ඇති වී තිබෙන්නේ ප්‍රධාන වශයෙන් ම උපාධි අපේක්ෂක පාඨමාලා පවත්වාගෙන යන විශ්ව විද්‍යාලවල මෙන් සේවක සංඛ්‍යා ගණනය කිරීමේ හේතුවෙනි. IBMBB යනු පශ්චාත් උපාධි ආයතනයක් වන අතර MPhil සහ PhD උපාධි සම්බන්ධයෙන් මෙන් MSc මට්ටමේදී පවා ව්‍යාපෘති අධීක්ෂණය කිරීම 1:1 ගුරු ශිෂ්‍ය අනුපාතය අනුව සිදු වේ. ඒ නිසා, සම්මත විශ්ව විද්‍යාල සඳහා සේවක සංඛ්‍යා ගණනය කිරීමේ ක්‍රමය මෙහිදී යොදා ගත නොහැකිය.

IBMBB ආරම්භයේදී ම ඉල්ලනු ලැබූ සේවක සංඛ්‍යාව සපයන ලද්දේ නම් IBMBB හි පිරිවැටුම මෙන් ම මූල්‍ය තත්ත්වය ද මීට වඩා සැලකිය යුතු තරමින් යහපත් වන්නට ඉඩ තිබුණි.

අර්ථ සාධක අරමුදල් සඳහා අධ්‍යයන දීමනාව සැලකිල්ලට ගැනීමේ කරුණ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නිරාකරණය කරන ලද නමුත් සේවකයින්ට භාෂා ප්‍රවීණතා දීමනා ගෙවීමේ ගැටලුව තවමත් නොවිසඳී පවතී.

කොළඹ විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර විගණන වාර්තාව විසින් මතු කරන ලද පරිදි, වාර්ෂික වාර්තාව ඉදිරිපත් කිරීමේ ප්‍රමාදය සම්බන්ධයෙන් කමිටුවේ නිරීක්ෂණය වූයේ ආයතනයේ පාලනයෙන් බාහිර හේතු ඊට බලපා ඇති බවය. විගණනය නොකරන ලද වාර්ෂික වාර්තා කෙටුම්පතක් නියමිත කාලයට පෙර ඉදිරිපත් කළ යුතු යැයි කමිටුව යෝජනා කළේය.

කේ.ඊ.ඩබ්ලිව්. ජයසිරි
සහකාර අභ්‍යන්තර විගණක
සහ මණ්ඩල ලේකම්
කොළඹ විශ්වවිද්‍යාලය/IBMBB

සේවාර්ජිත මහාචාර්ය ඊ. ආර්. ජැන්ස්
සභාපති, විගණන කමිටුව
සාමාජික / IBMBB

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / துலைவா / My No: සීඑස් සී/ඇයිබීඑම්බීබී/2011 වාර්
ඔබේ අංකය / உமது இல / No.:
දිනය / திகதி / Date: 2012 මැයි 24 දින.

අධ්‍යක්ෂ,
ජෛවරසායන, අණුක ජෛවවේද හා ජෛව තාක්ෂණ ආයතනය.

කොළඹ විශ්ව විද්‍යාලයට අනුබද්ධිත ජෛවරසායන, අණුක ජෛවවේද හා ජෛව තාක්ෂණ ආයතනයේ 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 108(2) වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව

කොළඹ විශ්ව විද්‍යාලයට අනුබද්ධිත ජෛවරසායන, අණුක ජෛවවේද හා ජෛව තාක්ෂණ ආයතනයේ 2011 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය හා එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13 (1) වගන්තිය සහ 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 18 වගන්තිය යටතේ පනවා ඇති 2003 අංක 1 දරන කොළඹ විශ්ව විද්‍යාලයට අනුබද්ධිත ජෛවරසායන, අණුක ජෛවවේද හා ජෛව තාක්ෂණ ආයතන නියමාවලියේ 17 වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 13 (7) (අ) වගන්තිය ප්‍රකාර ජෛවරසායන, අණුක ජෛවවේද හා ජෛව තාක්ෂණ ආයතනයේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

1.2 **මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය යැයි කළමනාකරණය විසින් තීරණය කරනු ලබන අභ්‍යන්තර පාලනය කළමනාකරණයේ වගකීම වේ.

අංක 306/72 පොල්දුව පාර, බත්තරමුල්ල , ශ්‍රී ලංකාව
இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை இலங்கை
No.306/72, Polduwa Road, Battaramulla , Sri Lanka

දුරකථනය / தொலைபேசி / Telephone: 2887220
ෆැක්ස් අංකය / பக்ஸ் இல / Fax No.: 2887221
ඉලෙක්ට්‍රොනික් තැපැල් / ஈ- மெயில் / E-mail: oaggov@sltnet.lk

1.3 විගණනකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාරධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශ ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරුකිරීමද ඇතුළත විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරුකිරීම්වලදී, අවස්ථාවොචිතව උචිත විගණන පරිපාටි සැලසුම්කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය නිර්ණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාර බලතල පැවරේ.

මාගේ තත්වාගණනය කළ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.4 තත්වාගනණය කළ විගණන මතය සදහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්වාගණනය කරනු ලැබේ.

2. මූල්‍ය ප්‍රකාශන

2.1 මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර 2011 දෙසැම්බර් 31 දිනට ජෛවරසායන, අණුක ජෛවවිද්‍යා හා ජෛවතාක්ෂණ ආයතනයේ මූල්‍ය තත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා එහි මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

2.2.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ කොළඹ විශ්ව විද්‍යාලයට අනුබද්ධිත ජෛවරසායන, අණුක ජෛවවේද හා ජෛවතාක්ෂණ ආයතනයේ මූල්‍ය ප්‍රකාශන 2012 පෙබරවාරි 22 දින විගණනයට ඉදිරිපත් කර තිබුණි. ගිණුම් විගණනය කිරීමෙන් පසුව 2012 මාර්තු 30 දින කෙටුම්පත් වාර්තාව නිකුත් කරන ලදී. කෙටුම්පත් වාර්තාවේ රු. 456,967ක ගිණුම්කරණ අඩුපාඩු පෙන්වා දුන් අතර රු.337,380 ක් වූ ගිණුම්කරණ අඩුපාඩු නිවැරදිකර සංශෝධිත මූල්‍ය ප්‍රකාශන 2012 අප්‍රේල් 20 දින ඉදිරිපත් කරන ලදී. තෝරාගන්නා ලද නියැදියෙන් බාහිරව තවදුරටත් මෙවැනි අඩුපාඩු තිබීම විගණනයේදී බැහැර කළ නොහැක.

2.2.2 නොසැසඳු පාලන ගිණුම්

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමග ඉදිරිපත් කළ ස්ථාවර වත්කම් උපලේඛනයේ හා ස්ථාවර වත්කම් ලේඛනය අතර පහත සඳහන් වෙනස්කම් නිරීක්ෂණය විය.

	ස්ථාවර වත්කම් උපලේඛනය	ස්ථාවර වත්කම් ලේඛනය	වෙනස
	රු.	රු.	රු.
Refrigeration Bath	895,767	904,953	9,186
Control Head	13,061	169,042	155,981
Biospec Nano	1,530,738	1,512,894	17,844
Microplate Reader	3,232,877	3,494,606	261,729
			444,740

2.2.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

ශ්‍රී ලංකාණ්ඩුවේ මුදල් රෙගුලාසි 1646 ප්‍රකාර දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ අදාළ මාසයට පසු වලට එළඹෙන මාසයේ 15 වන දිනට පෙර විගණනයට ඉදිරිපත් කළයුතු වුවත් මාස 01 සිට මාස 10 ක ප්‍රමාදයකින් ඉදිරිපත් කර තිබුණු අතර, ඉදිරිපත් කරන ලද ධාවන සටහන්වල මයිලෝමීටරය පිළිබඳ සටහන්, ධාවනය කරන ලද දුර පිළිබඳ විස්තර හා ඉන්ධන දැමීම් පිළිබඳ සටහන් නොකිරීම් සහ වාහනය පාවිච්චි කළ නිලධාරියා විසින් ඒ බව තහවුරු කරමින් අත්සන් කර නොතිබූ අවස්ථා නිරීක්ෂණය විය.

2.2.4 ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 29/98, 29/98(i), 07/2007(i) හා 02/2009 ට පටහැනිව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද චක්‍රලේඛ ප්‍රකාරව දෙවන හා තෙවන භාෂා ප්‍රවීනතාවය වෙනුවෙන් 2011 වර්ෂයේදී රු.13,816ක් ගෙවා තිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආයතනයේ වැඩ කටයුතුවල ප්‍රතිඵලය, පුනරාවර්තන වියදම් සඳහා රජයේ ප්‍රදානය ගණන් ගැනීමට පෙර රු.35,130,967 ක ඌනතාවයක් වූ අතර, ඉකුත් වර්ෂයේ අනුරූපී ඌනතාවය රු.28,768,772 ක් විය. පුනරාවර්තන වියදම් සහ තැන්පතු වියදම් සඳහා රු.35,588,306 ක් වූ රජයේ ප්‍රදානය ගණනට ගැනීමෙන් පසු සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.457,339ක අතිරික්තයක් බවට පත්ව තිබූ අතර ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම් සඳහා රු.26,200,000 ක් වූ රජයේ ප්‍රදානය හේතුවෙන් එම වර්ෂයේ ඌනතාවය රු.2,368,772ක් දක්වා අඩු වී තිබුණි. මූල්‍ය ප්‍රතිඵලයේ මෙම වාසිදායක තත්ත්වයට සමාලෝචිත වර්ෂයේදී ලැබී තිබූ රජයේ ප්‍රදාන වැඩිවීම ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යසාධනය

ආයතනයේ දර්ශනපති හා දර්ශන විශාරද වශයෙන් පශ්චාත් උපාධි පාඨමාලා 02ක් ද, විද්‍යාපති පාඨමාලා 02ක්ද වශයෙන් පශ්චාත් උපාධි පාඨමාලා 04ක් පවත්වා තිබුණු අතර ඒ පිළිබඳ පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) පසුගිය වසර 5 තුළ නවක සිසුන් ඇතුලත් කරගැනීම පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

වර්ෂය	විද්‍යාපති (Msc)	දර්ශනපති (MPhil)/ දර්ශන විශාරද(PhD)
2007	11	1
2008	13	5
2009	12	1
2010	19	1
2011	10	-

මීට අමතරව සමාලෝචිත වර්ෂයේදී වෙනත් ආයතනවල ලියාපදිංචි වී ඇති සිසුන් 07 දෙනෙකු පර්යේෂණ කටයුතු සිදුකරනු ලැබේ.

(ආ) සමාලෝචිත වර්ෂය තුල විද්‍යාපති උපාධිය සඳහා ශිෂ්‍යයන් 10 දෙනෙක් ලියාපදිංචි වී තිබූ අතර, දර්ශනපති / දර්ශන විශාරද උපාධි සඳහා එක් ශිෂ්‍යයෙකු හෝ ඇතුලත් වී නොතිබුණි. වර්ෂය තුළ පශ්චාත් උපාධි ලබා පිටව ගිය සංඛ්‍යාව 09 කි.

(ඇ) 2011 වර්ෂය තුල නවක සිසුන් 10 දෙනෙක් ද, 2010 වසරේ විද්‍යාපති (Msc) උපාධිය සඳහා 19 දෙනෙකුද, දර්ශනපති (MPhil)/ දර්ශන විශාරද(PhD) උපාධිය සඳහා 11 දෙනෙක් සහ අමතර සිසුන් 04 දෙනෙකුද, පශු සිසුන් 07 ක්ද වශයෙන් ආයතනයේ සිටි සම්පූර්ණ සිසුන් සංඛ්‍යාව 51ක් විය. එනෙත් රු.116,864,648 ක් වටිනා වර්ග අඩි 27000 ක සිව්මහල් ගොඩනැගිල්ලක ආයතනය පවත්වාගෙන යන අතර සමාලෝචිත වර්ෂය තුල රු.42,909,707 ක පුනරාවර්තන වියදමක් සහ රු.7,750,965ක ප්‍රාග්ධන වියදමක් දරා තිබුණද ආයතනය සඳහා වෙන් කර ඇති සම්පත් සහ දරන ලද වියදම සලකා බැලීමේදී සම්පත් උණ උපයෝජනයක් පැවතුණි.

4.2 ගබඩා පාලනය

රසායනික ද්‍රව්‍ය ඉන්වෙන්ට්‍රි පොතේ අයිතම 329 කින් අයිතම 24ක නියැදියක් සහ එන්සයිම (Enzymes) ඉන්වෙන්ට්‍රි පොතේ අයිතම 63 කින් අයිතම 18ක නියැදියක් පරීක්ෂාකරන ලද අතර එහිදී පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) රසායන ද්‍රව්‍ය ඉන්වෙන්ට්‍රිවල රු.572,119 ක් වටිනා අයිතම් 15ක අචල (Non Moving) තොගයක් හා එන්සයිම ඉන්වෙන්ට්‍රිවල රු.944,431ක් වටිනා අයිතම් 18ක අචල Non Moving) තොගයක් නිරීක්ෂණය විය.

(ආ) රසායන ද්‍රව්‍ය ඉන්වෙන්ට්‍රිවල රු.465,985ක් වටිනා අයිතම් 10 ක සෙමින් චලනය වන (Slow Moving) තොගයක් නිරීක්ෂණය විය.

4.3 අරමුදල් ඌන උපයෝජනය

ආයතනයේ බැංකු ජංගම ගිණුමේ රු.12,085,507 ක බැංකු ශේෂයක් වර්ෂ අවසානයේ නිරීක්ෂණය වූ අතර සමාලෝචිත වර්ෂය තුළ අවම මාසික ශේෂය රු.3,287,888 ක් වූ බැවින් එම අතිරික්ත මුදල් කෙටි කාලීනව ආයෝජනය කර ආදායම් උපයාගැනීමට අවධානය යොමුකර නොතිබුණි.

5. පද්ධති හා පාලන

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන දුර්වලතාවයන් වරින්වර ආයතනයේ අධ්‍යක්ෂවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කළයුතු වේ.

(අ) අත්තිකාරම්

(ආ) ගිණුම්කරණය

(ඇ) ඉන්වෙන්ට්‍රි භාණ්ඩ

එච්. ඒ. එස්. සමරවීර
විගණකාධිපති

2012.08.21

එච්.ඒ.එස්.සමරවීර මයා.
විගණකාධිපති,
විගණකාධිපති දෙපාර්තමේන්තුව,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.

මහත්මයාණෙනි,

<u>කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධිත ජෛව රසායන, අණුක ජෛවවේද හා ජෛව තාක්ෂණ ආයතනයේ 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 108(2) වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 13(7) (ඒ) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව</u>

ඉහත වාර්තාව ආයතනයේ විගණන කමිටුව විසින් සලකා බලන ලද අතර ඒ සඳහා යෝජිත පිළිතුරු පහත දැක්වේ.

2. මූල්‍ය ප්‍රකාශන

මතය

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

2.2.1 මූල්‍ය ප්‍රකාශණ ඉදිරිපත් කිරීම

පෙන්වාදෙන ලද ගිණුම්කරණ අඩුපාඩු නිවැරදි කරගැනීමට පියවර ගන්නා ලදී.

2.2.2 නොසැසඳූ පාලන ගිණුම්

ස්ථාවර වත්කම් ලේඛන වල වෙනස්කම් අදාල ගිණුම්කරණ ප්‍රමිතිය අනුව නිවැරදි කිරීමට පියවර ගන්නා ලදී.

2.2.3 නීති, රීති, රෙගුලාසි හා කළමණාකරණ තීරණවලට අනුකූල නොවීම.

දෛනික ධාවන සටහන් සහ මාසික සාරාංශ නිවැරදිව නියමිත දිනට ඉදිරිපත් කරනු ලැබීමට කටයුතු කර ඇත.

2.2.4.ප්‍රමාණවත් අධිකාරි බලයකින් තහවරු නොවූ ගනුදෙනු

දෙවන හා තෙවන භාෂා ප්‍රවීනත්වය වෙනුවෙන් අදාල ගෙවීම සිදු කරන ලද්දේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් නිකුත් කල චක්‍රලේඛන වලට අනුවය.මෙම ගෙවීම රජයේ නීතිරීති වලට පටහැනි බවට චක්‍රලේඛයක් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් මෙතෙක් අප වෙත ලැබී නැත.

3. මූල්‍ය සමාලෝචනය

3.1 මූල්‍ය ප්‍රතිඵල

එකඟ වේ.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යසාධනය

(අ) සටහන් කර ගතිමි.

(ආ) දර්ශනපති/ දර්ශන විශාරද උපාධි සඳහා ශිෂ්‍යයන් ඇතුලත් කර ගැනීම සිදු කල හැක්කේ ඒ සඳහා අධ්‍යයන කාර්ය මණ්ඩලය මගින් පර්යේෂණ ප්‍රතිපාදන ලබා ගත් විට පමණි. අධ්‍යයන කාර්‍ය මණ්ඩලය සීමිත බැවින් ලබා ගත හැකි Research Grants ප්‍රමාණය සීමිත වේ. HETC ව්‍යාපෘතියට ප්‍රතිපාදන සඳහා ඉල්ලුම් කලද එම ඉල්ලුම් පත්‍රය සාර්ථක නොවිය. ජාතික පර්යේෂණ සභාවෙන් ලබා ගත් ප්‍රතිපාදන අනුව 2012 වර්ෂයේ නවක සිසුන් 4 දෙනෙකු පමණ බඳවා ගැනීමට නියමිතය.

(ඇ) මෙය කිසිසේත්ම සම්පත් ඌණ උපයෝජනයක් ලෙස හඳුන්වා නොදීම සඳහා හේතු කිහිපයක් ඇත.

1) වර්ග අඩි 27000ක් යනුවෙන් වාර්ෂික වාර්තාවල මුල සිටම හඳුන්වා ඇති නමුත් සත්‍ය වශයෙන්ම භාවිතා කල හැකි පර්යේෂණ සහ දේශන වලට වර්ග අඩි ප්‍රමාණය ඊට වඩා බෙහෙවින් අඩුය. තවද යම් යම් සංවේදී උපකරණ සහ විද්‍යාගාර සඳහා වෙන් වෙන් වශයෙන් අවකාශය වෙන් කල යුතු වන්නේ එම පර්යේෂණ නියමාකාරයෙන් සිදු කිරීමටය. මේ ගැන ලිඛිතව පැහැදිලි කිරීම ඉතා අසීරු බව දන්වමි.

2) උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ HETC ව්‍යාපෘතිය මගින් ආචාර්ය උපාධියක් සඳහා අවම ලෙස රු. මිලියන **3**ක් අවශ්‍ය බව නිගමනය කර ඇත. ජාතික පර්යේෂණ සභාව විසින් අප

ආයතනයේ හැදෑරෙන විෂය ක්ෂෙත්‍රවල ආචාර්ය උපාධියක් සඳහා අවම වශයෙන් රු. මිලියන 5ක් අවශ්‍ය බව නිගමනය කර ඇත. මේ අගයන් වලට එම උපාධි හදාරන ආයතන වල ගොඩනැගිලි වල වටිනාකම. සේවක වැටුප්, විදුලිය, ජලය, දුරකතන හා අන්තර්ජාල ආදි බිල්, ආයතනයේ ඇති උපකරණ වල අගයන් ආදිය ඇතුලත් නොවේ. තිබෙන මානව සහ භෞතික සම්පත් වලට අමතරව එම මුදල ලබා දීමෙන් ආචාර්ය උපාධියකට අවශ්‍ය හැදෑරීම් කර ගත හැකි බවයි ඉන් සඳහන් වන්නේ. එමෙන්ම විදේශයකදී මෙම උපාධි හැදෑරීමට නම් විද්‍යාපති උපාධියක් සඳහා එක් ශිෂ්‍යයකු ඒ ඒ රට අනුව tuition fees සඳහා පමණක් මිලියන 2ක් සහ 5ක් අතර වියදමක් දැරිය යුතු අතර ආචාර්ය උපාධිය සඳහා මිලියන15 සිට30 ක පමණ වියදමක් දැරිය යුතුය. මෑතකදී ඕස්ට්‍රේලියාවේ විශ්ව විද්‍යාලයක් අප සිසුන් ශිෂ්‍යත්ව මත එම විශ්ව විද්‍යාලයේ ආචාර්ය උපාධි සඳහා බඳවා ගැනීමට අවබෝධතා ගිවිසුමක් අත්සන් කිරීමට සාකච්ඡා කල අවස්ථාවේ ඔවුන් අප ආයතනය විසින් හෝ තෝරාගත් ශිෂ්‍යයා විසින් මිලියන 3ක මුදලක් දැරිය යුතු බව අපට දන්වන ලදී. එක් ශිෂ්‍යත්වයක් සඳහා ඔවුන් මිලියන 30ක පමණ ආයෝජනයක් කරන බවද ප්‍රකාශ කෙරිණ. මේ අනුව විද්‍යාපති උපාධියකට මිලියන 02ක් සහ දර්ශනපති සහ ආචාර්ය උපාධි වලට මිලියන 10 ක් සහ 15 ක් ලෙස ගණනය කළද මෙරටදී අන්තර් ජාතික මට්ටමේ උපාධි බිහි කිරීමෙන් මෙම ආයතනය විසින් මේ වන විට මිලියන 214ක විදේශ විනිමය ප්‍රමාණයක් ඉතිරි කිරීමට සමත් වී ඇත.
(ඇමුණුම 1)

3) මෙම ආයතනයට අදාල විෂය ක්ෂෙත්‍රවල පර්යේෂණ සඳහා විශේෂිත විද්‍යාගාර පවත්වා ගැනීම අත්‍යවශ්‍ය වේ. නැතහොත් සාර්ථක ප්‍රතිඵල ලබා ගත නොහැකිය. එමෙන්ම අවශ්‍ය උපකරණ සහ රසායනික ද්‍රව්‍ය මිල අධික ඒවා වේ. ඒවා බොහෝ විට විදේශයෙන් ආනයනය කිරීමට සිදුවේ.

4) ශිෂ්‍යයින් සංඛ්‍යාව මීට වඩා වැඩි කිරීමට අමතර අධ්‍යයන කාර්ය මණ්ඩලය අවශ්‍ය වේ. ඒ මෙම උපාධි පාඨමාලා වල ඇති පර්යේෂණ හේතුවෙනි. මේ ගැන විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසමෙන් නොයෙක් වර ඉල්ලීම් කෙරුණද ඒ සඳහා තවම සුදුසු ප්‍රතිචාරයක් ලැබී නැත. මෙම ආයතනය සැලැස්මේදී තිබූ දැක්මට අනුව පර්යේෂණ මෙහෙයවීම සහ අධීක්ෂණයට මහාචාර්ය වරුන් 4 දෙනෙකු සහ පශ්චාත් ආචාර්ය උපාධි පර්යේෂකයන් 12 දෙනෙකුද දර්ශනපති/ආචාර්ය උපාධි අපේක්ෂකයින් 20 දෙනෙකුද අවශ්‍ය බව නිගමනය කෙරිණ. නමුත් විද්‍යාපති උපාධි පාඨමාලා සහ විශ්ව විද්‍යාල පද්ධතියේ ලබා දෙන තනතුරු සැලකිල්ලට ගනිමින් මහාචාර්ය පදවි 3ක් සහ ජ්‍යෙෂ්ඨකථිකාචාර්ය පදවි 7ක් ආයතනය ස්ථාපිත කරන අවස්ථාවේදී ඉල්ලා සිටින ලදී. නමුත් මෙයින් ලබා දෙන ලද්දේ එක් මහාචාර්ය පදවියක් සහ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය පදවි 3 ක් පමණි. ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරුන් තිදෙනාගෙන් එක් අයකුට කලමණාකාර මණ්ඩලයේ දැඩි අකමැත්තෙන් වසර 3 ක් පඩි රහිත නිවාඩු දීමට සිදුවීම(විදේශ සේවයේ නියුතු ස්වාමි පුරුෂයා සමග විදේශ ගතවීමටත්) නිසා එම අල්ප අධ්‍යයන කාර්ය මණ්ඩලය තව දුරටත් සීමා සහිත විය. මේ තරමටවත් ප්‍රතිඵල ලබා ගත හැකි වූයේ තම විශ්‍රාම යාමෙන් පසුව වුවද නිර්මාතෘ අධ්‍යක්ෂක වරයාගෙන් පාඨමාලා වලට සහ පර්යේෂණ වලට ලැබුණ සහයෝගය සහ කලමණාකාර මණ්ඩල සාමාජිකාවක් වන විශ්‍රාමලත් මහාචාර්ය අයිරා තාබෘ මහත්මියගෙන්ද. මුල් වසර කිහිපය තුල විශ්‍රාමලත් මහාචාර්ය E.R.ජැන්ස් මහතාගෙන්ද ලැබුණ සහයෝගයෙනි. එමෙන්ම මෙම ආයතනයේ සිටින අධ්‍යයන කාර්ය මණ්ඩලයේ ප්‍රමාණය සහ ආයතනයෙන් සමත් වී ඇති පශ්චාත් උපාධිධාරීන් සංඛ්‍යාවත් නිකුත් කර ඇති අන්තර් ජාතික සහ ජාතික පර්යේෂණ ලිපි, අන්තර් ජාතිකව හා ජාතික මට්ටමේ ඉදිරිපත් කර ඇති පර්යේෂණ ලබා ඇති ජාතික සහ අන්තර් ජාතික සම්මාන/ ඇගයීම්, ආදිය ඒක පුද්ගල අනුපාතයකට සලකන්නේ නම් සමස්ථ විශ්ව විද්‍යාල පද්ධතියේම වැඩිම අගයක් ලබා ගනු නොඅනුමානය.

5) මෙම ආයතනයේ සිසුන් 80% ක් පමණ තම පාඨමාලා සාර්ථකව සම්පූර්ණ කිරීමේ ප්‍රවණතාවයක් ඇත. විද්‍යාපති පාඨමාලා කාලය වසර 1 1/2 කි. මෙම ආයතනයේ ආචාර්ය උපාධි හදාරන සිසුන් නිරතුරුවම අන්තර් ජාතික ඇගයීම් වලට ලක්වී ඇත.

6) මෙම ආයතනය ජාතික වැදගත් කමක් ඇති පර්යේෂණ වල යෙදෙන බවද සඳහන් කළ යුතුය. උදාහරණයක් ලෙස ලංකාවේ පියයුරු පිළිකා සම්බන්දව ප්‍රථම ආචාර්ය උපාධිය මෙම ආයතනයෙන් බිහි කෙරුණ අතර දෙවන ආචාර්ය උපාධිය සම්පූර්ණ කෙරෙමින් පවතී. මෙම පර්යේෂණ මගින් සොයා ගත් සාධක පදනම් කර ගෙන දැන් එම ජාන පර්යේෂණ රෝගීන්ට සේවාවක් ලෙස ලබා දීමට සැලසුම් කර ඇත. මෙවැනි නොයෙකුත් ඉතා වැදගත් සහ වෛද්‍ය සහ කෘෂිකාර්මික ක්ෂෙත්‍ර වල දියුණුවට බලපාන පර්යේෂණ මෙම ආයතනය විසින් සිදු කර ඇත. කෙරෙමින් පවතී.

7) ආධුනික කථිකාචාර්යවරු කිහිප දෙනෙකුටම මෙම ආයතනයේ ආචාර්ය සහ දර්ශනපති උපාධි ලබා ගැනීමට හැකි වී තිබේ. ඔවුන් දැන් යාපනය, නැගෙනහිර, කැළණිය ආදී විශ්ව විද්‍යාල වල සේවය කරති. තව එවැනිම කිහිප දෙනෙක් දැනට පුහුණුව ලබති.

8) ඒ අනුව අන්තර් ජාතික මට්ටමේ උපාධි පාඨමාලා පවත්වමින් විදේශ විනිමය ඉතිරි කර දීමට මෙම ආයතනයට හැකි වී ඇත.

4.2 ගබඩා පාලනය

(අ. ආ)

ප්‍රායෝගික පන්ති සහ පර්යේෂණ සඳහා අවශ්‍ය රසායනික ද්‍රව්‍ය ගෙන්වීමේදී එම ද්‍රව්‍ය ලබා ගැනීමට මිඩංගු වන කාලය (ඍජුවම ආනයන කිරීමට හෝ ශ්‍රී ලංකාවේ සැපයුම්කරුවකු සිටින්නේ නම් ඔවුන්ගෙන් ලබා ගත හැකි කාලය) , එම ද්‍රව්‍ය ගෙන්වීමේදී වියදම් වන ප්‍රවාහන ගාස්තු,පසුගිය වර්ෂ වල භාවිතය සහ ඉදිරියේදී ඇතිවන අවශ්‍යතා යන කරුණුද සැලකිල්ලට ගෙන මෙම ද්‍රව්‍ය ලබා ගත යුතුය. ප්‍රවාහනයේදී අධි ශීතකරණ පහසුකම් සැපයීම, රජයේ ආයතන වලින් (import Control) අවශ්‍ය අනුමැතිය ආදියද සැලකිල්ලට ගත යුතුය. තවද ප්‍රායෝගික පන්ති සහ පර්යේෂණ වලට මෙම ද්‍රව්‍ය අවශ්‍ය වූ විට සති, මාස ගණනක් බලා සිටීමට සිදු වුවහොත් පාඨමාලාවල කාලය දිගු කිරීමටත් සිදු වෙනු ඇත. එමෙන්ම අවශ්‍ය රසායනික ද්‍රව්‍ය නිෂ්පාදනය කරන මාත්‍ර වලින් ලබා ගත යුතුය.

එම නිසා අචල සහ සෙමෙන් චලනය වන අයිතමයන් විගණන නිලධාරින් හඳුනා ගත්තත් මේ සියල්ලම ආයතනයේ ප්‍රායෝගික පන්ති සහ පර්යේෂණ සඳහා අවශ්‍ය ද්‍රව්‍ය වේ. මෙයින් බොහොමයක්ම පර්යේෂණ ප්‍රදාන වලින් ලබා ගත් ද්‍රව්‍ය වේ. අචල සහ සෙමෙන් චලනය වන ද්‍රව්‍ය ලෙස හඳුනාගත් ද්‍රව්‍ය ක්ෂණිකව විනාශ වන ද්‍රව්‍ය නොවන අතර කෙරෙමින් පවතින පර්යේෂණ සඳහා යථා කාලයේ අවශ්‍ය වේ.

එක පර්යේෂණයක් සඳහා enzyme ඉතා කුඩා ප්‍රමාණයක් (units) අවශ්‍ය වුවද සපයන්නන්ගේ පවතින ඒකක ප්‍රමාණය (pack size) අනුව මිලදී ගත යුතුයි.

උදා : පර්යේෂණයට units **5**ක් අවශ්‍ය වුවත් සපයන්නන් ළඟ තිබෙන්නේ units 1000 ක් නම් අප එය මිලට ගත යුතුයි.

එම නිසා ඉන්වෙන්ට්‍රියේ සමහර enzyme ඉතා සුළු මයික්‍රො ලීටර් (μl) ප්‍රමාණයක් භාවිතා කර ඇති අවස්ථා වලදී එම අයිතමය stock එකෙහි පවතින එන්සයිමයක් ලෙස දක්වා ඇත. එය ඊ ළඟ පර්යේෂණය කරන සිසුන්ගේ භාවිතයට තබා ඇත.

4.3 අරමුදල් ඌන උපයෝජනය.

මෙම අතිරික්ත මුදල් අදාල අනුමැතිය සහිතව කෙටිකාලීනව ආයෝජනය කර ආදායම් උපයාගැනීම සඳහා ඉදිරියේදී පියවර ගනු ලැබේ.

5. පද්ධති හා පාලන

අධ්‍යක්ෂ වෙත යොමු කරන ලද අඩුපාඩු සම්බන්ධව අවධානය යොමු කර නිවැරදි කිරීමට සටහන් කර ගතිමි.

මහාචාර්ය කමනි එච්. තෙන්නකෝන්
අධ්‍යක්ෂ

පිටපත් : ලේකම්, මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය
ලේකම්, උසස් අධ්‍යාපන අමාත්‍යාංශය
සභාපති , විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
උපකුලපති, කොළඹ විශ්වවිද්‍යාලය
එස්. පද්මිණී මිය, විගණන අධිකාරී, රජයේ විගණන අංශය,
කොළඹ විශ්වවිද්‍යාලය

(ඇමුණුම 1)

Table: Number of students graduating from IBMBB with internationally comparable MSc, Mphil, PhD degree and the approximate amount of foreign exchange saved.

Degree	No of students completing studies		Approximate amount of foreign exchange saved	
	by 31.12.2011	by 31.03.2012	by 31.12.2011	by 31.03.2012
MSc	40	57	80 to 200 million rupees	114 to 285 million rupees
MPhil	04	04	60 to 120 million rupees	60 to 120 million rupees
PhD	04	04	40 to 80 million rupees	40 to 80 million rupees
Total	48	65	**180 to 400 million rupees**	**214 to 485 million rupees**

අසාර්ථකවීම් සහ සාධාරණීකරණයන්

2007-2011 ආයතනික සැලැස්ම ප්‍රකාරව කාර්යයන් ක්‍රියාත්මක කිරීමේදී මූලික බාධකයන් වූයේ මානව සම්පත් හා මූල්‍ය සම්පත් ය. IBMBB විසින් පවත්වනු ලබන පූර්ණ කාලීන විද්‍යාපති (MSc) පාඨමාලාවල එක් අධ්‍යයන වාරයක් තුළ පූර්ණ කාලීන පර්යේෂණ සංරචකයක් ඇතුළත් වන අතර ඒ සඳහා 1:1 අනුපාතයට සිසුන් අධීක්ෂණය කිරීම අවශ්‍ය වේ. දර්ශනපති (MPhil) සහ ආචාර්ය උපාධි (PhD) පාඨමාලා පූර්ණ කාලීන පර්යේෂණ මත පදනම් වේ. IBMBB හි පුහුණු වැඩසටහන් මගින් දේශීය විශ්වවිද්‍යාලවලට, පර්යේෂණ ආයතනවලට සහ පෞද්ගලික අංශයට මානව සම්පත් සපයා තිබේ. අවාසනාවකට මෙන්, ප්‍රමාණවත් අධ්‍යයන කාර්ය මණ්ඩලයක් නොමැති වීම නිසා තම උසස් තත්ත්වයේ මානව සම්පත් පුහුණු වැඩසටහන් ව්‍යාප්ත කිරීම IBMBB ආයතනයට දුෂ්කර වී තිබේ. එහි අධ්‍යයන කාර්ය මණ්ඩලයේ සිටින්නේ 4 දෙනෙකු පමණක් වන අතර (එක් මහාචාර්යවරයකු සහ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරුන් තිදෙනකු), දැනට ක්‍රියාත්මක වන වැඩසටහන් මේ දක්වා පවත්වාගෙන ගොස් ඇත්තේ ආරම්භක අධ්‍යක්ෂවරයාගේ (සේවාර්ජිත මහාචාර්ය ධුරයක් උසුලන) සහ අනෙකුත් විශ්‍රාමික ජ්‍යෙෂ්ඨ විද්‍යාර්ථීන්ගේ සැලකිය යුතු දායකත්වය නිසාය.

ඉගැන්වීම් සහ පර්යේෂණ වැඩ සටහන් අඛණ්ඩව පවත්වාගෙන යෑම සහ ව්‍යාප්ත වීම සඳහා අතිරේක අධ්‍යයන කාර්ය මණ්ඩල, පශ්චාත් ආචාර්ය උපාධි විද්‍යාර්ථීන් සහ විද්‍යාත්මක සහකාරවරුන් අවශ්‍යය. පළමු උපලේඛනගත ප්‍රයත්නයේදී ම දළ වශයෙන් සිසුන්ගෙන් 80% ක් IBMBB හි විද්‍යාපති වැඩසටහන්වලින් දළ වශයෙන් 80% ක් සම්පූර්ණ කර තිබීමත්, IBMBB, PhD සිසුන් කිහිප දෙනෙකු ම අන්තර්ජාතික සම්මාන දිනා තිබීමත් සලකන විට ප්‍රමාණවත් සේවක සංඛ්‍යා සැපයීම මගින් IBMBB ආයතනයට උපකාර කිරීම යනු පශ්චාත් උපාධි පුහුණුව සහ ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල පද්ධතියේ ජාත්‍යන්තර ස්ථාවරය වැඩි දියුණු කිරීමේ ඉතාමත් පිරිවැය සාඵල්‍ය ක්‍රමයක් වනු ඇත.

ජාත්‍යන්තර ප්‍රමිතීන් පවත්වාගෙන යෑම

පර්යේෂණ ප්‍රතිඵල ජාත්‍යන්තර සම්මන්ත්‍රණවලදී ඉදිරිපත් කිරීම.

ජාත්‍යන්තර වශයෙන් සම සමාලෝචනය කරන ලද සඟරා පළකිරීම් SCI සූචිගත ප්‍රකාශන සැලකිල්ලට ගැනීම සඳහා කාර්ය සාධනය පාදක කරගත් තක්සේරුව.

තරගකාරී ජාත්‍යන්තර පර්යේෂණ ප්‍රදානයන් ලබා ගැනීම.

වර්තමාන තාක්ෂණයන් සම්බන්ධ අවබෝධය යාවත්කාල කර ගැනීම සඳහා පීඨ සහ අධ්‍යයන සහායක කාර්ය මණ්ඩලයට කෙටි කාලීන විදේශ පුහුණුව ලබා දීම.

ජාත්‍යන්තර සහයෝගිතාවන්.

පාලනය

සාමූහික සමාජ වගකීම - උදා. අලුතින් ස්ථාපනය කරන ලද විශ්වවිද්‍යාල සඳහා මානව සම්පත් පුහුණුව.

2012 කාර්ය සැලැස්ම

ඉගැන්වීම

පීඨයේ විස්තීර්ණ සම්පත් සංචිතයක් ස්ථාපනය කිරීම සහ නඩත්තු කිරීම.

නූතන ඉගැන්වීම් / ඉගෙනුම් ක්‍රම ශක්තිමත් කිරීම.

ජෛව තොරතුරුවේදය පිළිබඳ විද්‍යාපති (MSc) වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

දැනට තිබෙන විද්‍යාපති වැඩසටහන් ශක්තිමත් කිරීම.

ඉල්ලන ලද අරමුදල් ලබා ගැනීමේ හැකියාවට යටත්ව, ඉංග්‍රීසි භාෂාව, විද්‍යාත්මක ලේඛනය, සන්නිවේදන සහ තොරතුරු තාක්ෂණය පිළිබඳව සිසුන්ගේ නිපුණතා වැඩි දියුණු කිරීම.

පර්යේෂණ

ජීව වෛද්‍ය විද්‍යාවන්හි ජෙනෝමවේදය, ප්‍රෝටියෝමවේදය (උදා. පිළිකා, ප්‍රජනනය හා සංවර්ධනය, පරපෝෂිත සහ රෝගකාරක පරපෝෂිත ජෛවවේදය, මානව හඳුනා ගැනීම ආදිය), ශාක අණුක ජෛවවේදය (උදා. සහල්, තේ, රබර්, පිළිකා මර්දන, ප්‍රතිප්‍රදාහ, මැලේරියා මර්දන) පදනම් කරගත් පර්යේෂණ වැඩ සටහන් මගින් නව දැනුම උත්පාදනය කිරීම.

දැනට තිබෙන දර්ශනපති (MPhil)/ දර්ශනසූරි (PhD) ව්‍යාපෘති දිගට ම පවත්වාගෙන යෑම/ ශක්තිමත් කිරීම සහ ව්‍යාප්ත කිරීම. අවශ්‍ය අරමුදල් ලබා ගැනීමට යටත්ව අලුතින් (MPhil/PhD) පාඨමාලා ආරම්භ කිරීම.

තිබෙන රසායනාගාර උපකරණ නඩත්තු කිරීම සහ යාවත්කාල කිරීම.

ක්ෂේත්‍රයේ වර්ධනයන්ට අනුකූල වන පරිදි නව රසායනාගාර උපකරණ ලබා ගැනීම.

රසායනාගාර වැඩවලට අවශ්‍ය පරිදි, දූහුවිල්ලෙන් තොර, උෂ්ණත්වය පාලනය වූ යෝග්‍ය පරිසරයක් පවත්වාගෙන යෑම.

ගොඩනැගිලි පුනරුත්ථාපනය.

පර්යේෂණ ආයතන, රෝහල් සහ විද්වත් පාර්ශව සමඟ සහයෝගීතාව ශක්තිමත් කිරීම.

සේවය

පිළිකා සහ අනෙකුත් රෝග සඳහා මෙන් ම වැවිලි අංශය සඳහා ද DNA රෝග විනිශ්චය සේවා ස්ථාපනය කිරීම.

වැඩමුළු සහ සහතික පත්‍ර පාඨමාලා මගින් අණුක ජීවන විද්‍යා සහ ජෛව තාක්ෂණවේදය භාවිතය පිළිබඳව වෘත්තීයවේදීන් සහ තාක්ෂණ විශේෂඥයින් පුහුණු කිරීම.

ශ්‍රී ලංකාවේ උසස් අධ්‍යාපන ආයතනවලට ප්‍රවේශය ලබා දෙන ජෛවවේද දර්පණ දත්ත සමුදායන් පවත්වාගෙන යෑම.

විද්‍යාත්මක සැසි, ආරාධිත දේශන ආදිය මගින් දැනුම ව්‍යාප්ත කිරීම.

<u>වාර්ෂික වාර්තාව සහ ගිණුම් පිළිබඳ සාරාංශය - 2011</u>

1. සම්පත් සහ ශිෂ්‍යයින් පිළිබඳ තොරතුරු

පීඨය	පාඨමාලාව	මුළු ශිෂ්‍ය සංඛ්‍යාව	මුළු අධ්‍යයන කාර්ය මණ්ඩලය	මුළු අනධ්‍යයන කාර්ය මණ්ඩලය
	අණුක ජීවන විද්‍යා පිළිබඳ MSc	22	3	17*
	සෛල සහ අණුක ප්‍රතිශක්තවේදය පිළිබඳ MSc	11		
	දර්ශනපති (MPhil)	08		
	ආචාර්ය (PhD)	10		
එකතුව		51	3	**17**

* <u>අධ්‍යයන උපකාරක කාර්ය මණ්ඩලය -</u> 02 ඇතුළත් ය.

01 - සහකාර ජාල කළමනාකරු

01 - විද්‍යාත්මක සහකාර

2. දේශීය ශිෂ්‍යයින් පිළිබඳ තොරතුරු : උපාධි අපේක්ෂක ශිෂ්‍ය සංඛ්‍යාව

පීඨය	පාඨමාලාව	මාධ්‍යය	2010 බඳවා ගැනීම්	1 වසරේ සිසුන්	2 වසරේ සිසුන්	උපාධි ලැබූ සංඛ්‍යාව
එකතුව						

3. විදේශ ශිෂ්‍යයින් පිළිබඳ තොරතුරු : දැනට කිසිවකුත් නැත.

පීඨය	පාඨමාලාව	මාධ්‍යය	2010 බඳවා ගැනීම්	1 වසරේ සිසුන්	2 වසරේ සිසුන්	2 වසරේ සිසුන්	2 වසරේ සිසුන්	උපාධි ලැබූ සංඛ්‍යාව
එකතුව								

4. අධ්‍යයන කාර්ය මණ්ඩලය පිළිබඳ තොරතුරු

පීඨය	විෂයය	මාධ්‍යය	ජ්‍යෙෂ්ඨ මහාචාර්ය	මහාචාර්ය	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය	කථිකාචාර්ය	සහකාර කථිකාචාර්ය	උපදේශකවරු
	අණුක ජීවන විද්‍යා	ඉංග්‍රීසි		1				
	ප්‍රතිශක්තවේදය	ඉංග්‍රීසි			1			
	අණුක තාක්ෂණවේද	ඉංග්‍රීසි			1			
එකතුව				**1**	2			

5. අනධ්‍යයන කාර්ය මණ්ඩලය පිළිබඳ තොරතුරු

පීඨය/ශාඛාව	ඉතාම ජ්‍යෙෂ්ඨ	ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩලය	කණිෂ්ඨ කාර්ය මණ්ඩලය	සුළු සේවකයින්
IBMBB	1- ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී 1- ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී	1- කාර්ය මණ්ඩල කාර්මික ශිල්පි	1- කාර්මික නිලධාරී II ශ්‍රේණිය 1-අභ්‍යාසලාභී කාර්මික නිලධාරී	2- රසායනාගාර සහකාර
			4- පරිගණක යෙදවුම් සහකාර	1-කම්කරු
			1- පොත් තබන්නා	

			1-පුස්තකාල සහකාර	
			1-දුරකථන ක්‍රියාකරු සහ පිළිගැනීමේ නිලධාරී	
එකතුව	**2**	**1**	**9**	**3**

6. පර්යේෂණ, නව හඳුන්වාදීම් සහ ප්‍රකාශන පිළිබඳ තොරතුරු :

විෂයය	ප්‍රකාශයට පත් කරන ලද	වාණිජකරණය වූ	ඉදිරිපත් කරන ලද
අ. පර්යේෂණ සංඛ්‍යාව			07
ආ. නව හඳුන්වා දීමේ සංඛ්‍යාව			
ඇ. සඟරා සංඛ්‍යාව			
ඈ. පොත් සංඛ්‍යාව			
ඉ. ලිපි සංඛ්‍යාව *	09		
ඊ. වෙනත් (පර්යේෂණ, සන්නිවේදනය)			32
එකතුව	**09**		**39**

* සඟරා ලිපි

7. වැඩසසටහන්, සම්මන්ත්‍රණ සහ වැඩමුළු පිළිබඳ තොරතුරු

විෂයය	සහභාගිත්වය	සම්පූර්ණ කළ	ඉදිරිපත් කිරීම්
අ. පශ්වාත් උපාධි පාඨමාලා සංඛ්‍යාව	MSc – 22 MPhil - } 18 PhD - }	MSc - 8 MPhil – 1 PhD 2	9
ආ. පශ්වාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලා සංඛ්‍යාව			

ඇ. උපාධි පාඨමාලා සංඛ්‍යාව			
ඈ. ඩිප්ලෝමා පාඨමාලා සංඛ්‍යාව			
ඉ. සහතික පත්‍ර පාඨමාලා සංඛ්‍යාව	සිසුන් 10	සිසුන් 10	10
ඊ. වෙනත් (ජෛව තොරතුරුවේදය පිළිබඳ වැඩමුළුව) ආරාධිත දේශකයින්			
එකතුව			

8. ලැබුණු සම්මාන පිළිබඳ තොරතුරු :

විෂයය	සම්මාන සංඛ්‍යාව	විද්වත් සංඛ්‍යාව	සිසුන් සංඛ්‍යාව
අ. දේශීය සම්මාන			
ආ. ජාතික සම්මාන			
ඇ. ජාත්‍යන්තර සම්මාන			2
ඈ. වෙනත්			
එකතුව			

9. ආරම්භ කරන ලද නව පාඨමාලා පිළිබඳ තොරතුරු - 2011 ලියාපදිංචිය

පීඨය	පාඨමාලාව	මාධ්‍යය	සහතික	ඩිප්ලෝමා	පශ්චාත් උපාධි ඩිප්ලෝමා	විද්‍යාපති	දර්ශනපති MPhil	ආචාර්ය PhD
IBMBB		ඉංග්‍රීසි	01			19	1	2
එකතුව			**01**			**19**	**1**	**2**

10. පුනරාවර්තන වියදම් පිළිබඳ විස්තර :

	විෂයය	2010 රු.	2011 රු.
අ.	පුද්ගල පඩිනඩි	10,992,460	13,406,041
ආ.	ගමන්	1,264,956	312,132
ඇ.	සැපයුම්	10,317,486	7,587,294
ඈ.	නඩත්තු	4,412,672	5,698,930
ඉ.	ගිවිසුම්ගත සේවා	9,957,444	10,823,160
ඊ.	වෙනත් (ක්ෂය වීම ඇතුළුව)	12,174,474	5,082,150
		49,119,491	42,909,707

11. ප්‍රාග්ධන වියදම් පිළිබඳ විස්තර :

	විෂයය	2010 රු.	2011 රු.
අ.	ගෘහභාණ්ඩ හා කාර්යාලයීය උපකරණ සපයා ගැනීම්	693,004	813,428
ආ.	උපකරණ සපයා ගැනීම් (පරිගණක සහ රසායනාගාර උපකරණ)	3,191,159	6,642,965
ඇ.	ගොඩනැගිලි හා ඉදිකිරීම් අත්කර ගැනීම	-	-
ඈ.	වෙනත් (පුස්තකාල පොත්)	269,316	294,571
	එකතුව	**4,153,479**	**7,750,965**

12. ව්‍යාපෘති පිළිබඳ විස්තර (දේශීය/විදේශ ආධාර ලද)

නම හා විස්තර	ණය / ප්‍රදානය	අරමුදල් සැපයූ ආයතනය #	TCE රු.	RFA රු.	DF රු.
එකතුව					

(ශ්‍රීලංකා රජය/ආ.සං.බැං./අන්තර්ජාතික සංවර්ධන ආධාර/ලෝක බැංකුව/...)

13.ව්‍යාපෘති පිළිබඳ විස්තර (දේශීය/විදේශ අරමුදල් ලද)

නම	TCE රු.	2010 වියදම රු.	2011 වියදම රු.	2011.12.31 දිනට සමුච්චිත වියදම	භෞතික ප්‍රගතියේ %
SAREC ප්‍රදානය		7,061,446	339,177	7,400,623	2011 සැලසුම් කර සම්පූර්ණ කළ වැඩ
NSF ප්‍රදානය		486,300	262,269	748,569	
එකතුව		7,547,746	601,446	8,149,192	

14. මූල්‍ය ප්‍රගතිය පිළිබඳ විස්තර (වියදම) :

	විෂයය	2011 ප්‍රතිපාදන	2011 වියදම රු.	ඉතිරි කිරීම් / අතිරික්තය රු.
අ.	පුනරාවර්තන ව්‍යාපෘති හැර	34,010,806	* 37,261,848	-3,251,042
ආ.	ප්‍රාග්ධන ව්‍යාපෘති හැර	** 10,217,003	4,579,404	5,637,595
ඇ.	ව්‍යාපෘතිය - දේශීය අරමුදල් සහිත NSF ප්‍රදානය	262,269	262,269	-
ඈ.	ව්‍යාපෘතිය - විදේශ අරමුදල් සහිත SAREC (පර්යේෂණ ප්‍රදානය)	339,177	339,177	-
එකතුව		36,674,353	44,829,252	42,442,696

* ක්ෂයවීම සහිතව

** DNA අනුක්‍රමණය මිල දී ගැනීම සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසමේ මිලියන 5 ක විශේෂ ප්‍රතිපාදනය ඇතුළුව (ඇණවුම නිකුත් කරනු ලැබ ඇත.)

15. මූල්‍ය ප්‍රගතිය පිළිබඳ විස්තර (උත්පාදිත අදයම :

	ආදායම් ප්‍රභවය	2011 ප්‍රතිපාදනය රු.	2011 එකතුවීම්	හිඟ / අතිරික්ත රු.
අ.	උපාධි අපේක්ෂක අධ්‍යයනයන්	අදාළ නොවේ	අදාළනොවේ	-
ආ.	පශ්චාත් උපාධි අධ්‍යයනයන්	3,900,000	3,283,500	(616,500)
ඇ.	උපදේශනය	-		
ඈ.	වෙනත්	45,000	436,167	391,167
එකතුව		2,165,000	3,945,000	3,719,667

16. මූල්‍ය කාර්ය සාධන විශ්ලේෂණය -2011:

	විෂයය	සූත්‍රය	එක් ශිෂ්‍යයෙකුට වියදම රු.
අ.	එක් ශිෂ්‍යයෙකුට පුනරාවර්තන වියදම (RE)	RE/ ශිෂ්‍ය සංඛ්‍යා ශක්තිය	<u>පාඨමාලාව</u> දර්ශනපති සහ ආචාර්ය Mphil & PhD 7,672,335/11** 697,485 විද්‍යාපති MSc 8,756,000/33 265,333
ආ.	එක් ශිෂ්‍යයෙකුට ප්‍රාග්ධන වියදම (CE)	CE/ ශිෂ්‍ය සංඛ්‍යා ශක්තිය	
එකතුව			

** IBMBB විසින් ක්‍රියාත්මක නොවන NRC ප්‍රදානවල අරමුදල් ඇතුළත්ය.

17. 2011 දී ලැබුණු යටිතල ව්‍යුහ පහසුකම් පිළිබඳ විස්තර :

යටිතල ව්‍යුහ විස්තර	වියදම රු.	භෞතික ප්‍රගතිය

18. මේ වාර්තාවට අදාළ වෙනත් විස්තර / කාර්ය සාධනය :